# දෙවියන්වහන්සේගේ ක්‍රියාකිරීම තේරුම්ගැනීම



# රූත්ගේ කථාව - 01

## රූත් 1:1

**හැඳින්වීම :-**

අද දවසේ අප පරණ ගිවිසුමේ සඳහන් වන්නාවූ ඉතා රසවත්, අර්ථවත්, හැඟීම්බර පොතක් අධ්‍යයනය කිරීම අරඹන්නෙමු. මෙම පොත මෝවබ් දේශයේ උපත ලැබූ රූත් නමැති තරුණියකගේ නම දරන අතර, ඉශ්‍රායෙල් ජාතිකයෙකුට විවාහවූ මේ අන්‍යජාතික තරුණියගේ නම අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පෙලපතේ ද සඳහන් වේ **(මතෙව් 1:1,5).**

රූත්ගේ කථා පුවත අධ්‍යයනය කිරීම තුළින් අප සැම, ඉශ්‍රායෙල් ජාතියට දෙවියන්වහන්සේ ලබා දුන්නාවූ නීති සහ චාරිත්‍ර, උන්වහන්සේගේ අසීමිත අප්‍රමාණ ප්‍රේමය, සැපයීම සහ සැනසීම වැනි දේ ගැන බොහෝ කරුණු ඉගෙන ගැනීමට යන අතර, එමගින් ඔබ සැම උන්වහන්සේට වඩා ළංවේය යන්න අපගේ පැතුමයි, විශ්වාසයයි, බලාපොරොත්තුවයි.

**අධ්‍යයනය :-**

1. **රූත්ගේ කථාවේ පසුබිම**

(a) **මෙය සිදුවූයේ ඉශ්‍රායෙල්වරුන්ගේ විනිශ්චයකාරයන්ගේ කාලයේදීය**

**රූත් 1:1a :- " තවද විනිශ්චයකාරයන් විනිශ්චය කරන දවස්වලදී දේශයෙහි සාගතයක් විය ......"**

**රූත් 1:1** හි සඳහන් වන ආකාරයට රූත්ගේ කථාව විනිශ්චයකාරයන්ගේ කාලය තුළ සිදුවූවකි. එනම් ක්‍රි. පූ. 1375 සහ ක්‍රි. පූ. 1050 පමණ දක්වා කාලය තුළ සිදුවූවකි.

එබැවින් **'විනිශ්චයකාරයන්ගේ කාලය'** ඉශ්‍රායෙල් ඉතිහාසයේ කෙබඳු ආකාර කාලයක්ද කියා වටහාගැනීම වැදගත්වේ.

" **විනිශ්චයකාරයන්ගේ පොත** " කියවන අපට පෙනීයන්නේ මෙම කාලය ඉශ්‍රායෙල් ජාතියේ පහත සඳහන් ලක්ෂණ හතර පෙන්නුම් කළාවූ කාලයක් වූ බවයි.

- ආගමික පරිහානිය
- සදාචාරාත්මක පිරිහීම
- ජාතිය තුළ අසමගිය
- විදේශ රාජ්‍යයන්ගෙන් පීඩා ඇතිවීම

**ඇත්ත වශයෙන්ම මෙම කාල වකවානුව ඉශ්‍රායෙල් ඉතිහාසයේ ඉතා කණගාටු සහිත කාලයක් සේ හැඳින්වීම නිවැරදි වේ.**

දෙවියන්වහන්සේ විසින් තෝරාගනු ලැබුවාවූ සෙනඟ මෙවැනි ඉරණමකට මුහුණ දුන්නේ මන්ද කියා තේරුම් ගැනීම උදෙසා, ඉශ්‍රායෙල් ජාතියේ ආරම්භයද, දෙවියන්වහන්සේ ඔවුන්ට දුන්නාවූ පොරොන්දු සහ උපදෙස් දෙසද බැලීම උචිත වේ.

- දෙවියන්වහන්සේ මෙසොපොතේමියෙහි විසූවාවූ ආබ්‍රම් (ආබ්‍රහම්) නමැති මනුෂ්‍යයෙකුට ප්‍රකාශ වී, උන්වහන්සේ ඔහුට පෙන්වන්නාවූ දේශයට යෑමට කීසේක.

**ක්‍රියා 7 : 2 ,3 :-**
**" [2] .....අපගේ පියවූ ආබ්‍රහම් හාරන්හි විසීමට පළමුවෙන් මෙසොපොතාමියෙහි සිටි කාලයෙහි මහිමාන්විත දෙවියන්වහන්සේ ඔහුට පෙනී : [3] නුඹේ දේශයෙන්ද නෑයන් කෙරෙන්ද තුරන්ව, මා නුඹට පෙන්වන දේශයට එවයි කීසේක."**

දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට කථාකොට, ඔහුට දුන්නාවූ පොරොන්දු **උත්පත්ති 12:1-3** හි සඳහන් වන අතර, එම අවස්ථාවේදී දෙවියන්වහන්සේ ඔහුට ප්‍රකාශ කළ වචන වලින් කොටසක් වන්නාවූ, " **මා විසින් නුඹට පෙන්වන දේශයට පලයන්න, මම නුඹ මහත් ජාතියක් කරන්නෙමි.**" යන පොරොන්දුව ඔබ අසා ඇතැයි සිතමි.

දෙවියන්වහන්සේ මෙලෙස ආබ්‍රහම්ට දුන් පොරොන්දු, ආබ්‍රහම්ගේ පුත්‍ර වූ ඊසාක්ට ද, ඊසාක්ගේ පුත්‍ර වූ යාකොබ්ටද **(ඉශ්‍රායෙල්ටද)** දුන් අතර අපගේ දෙවියන්වහන්සේ එම පොරොන්දු **'<u>ඉශ්‍රායෙල්ට සදාකාල ගිවිසුමක්ද කොට ස්ථිර කරමින්</u>'**, **(ගීතාවලිය 105:10)** ඒවා ඉටු කරන්නාවූ දෙවියන්වහන්සේ වනසේක.

(කරුණාකර **ගීතාවලිය 105 : 8-10** කියවන්න)

දෙවියන්වහන්සේ යාකොබ්ගෙන් **(ඉශ්‍රායෙල්ගෙන්)** බිහිවුණාවූ ඉශ්‍රායෙල් ජාතිය මහත් ජාතියක් බවට පත්කරමින්, මෝසෙස් මගින් ඔවුන්ට ව්‍යවස්ථාව ලබාදෙමින්, යෝෂුවාගේ නායකත්වය යටතේ ඔවුන්ට පොරොන්දු දේශය අත්පත්කර දුන්සේක.

ඉශ්‍රායෙල් ජාතියේ ආරම්භයේ ඔවුන්ට රජකෙනෙක් නොසිටි-යේය. ඔවුන්ගේ රජතුමා **(ස්වාමීන්වහන්සේ)** වූයේ දෙවියන්වහන්සේ වූ අතර, එකල **ඉශ්‍රායෙල් ජාතිය තුළ පැවතුනේ 'දේවතන්ත්‍රය'** බව ප්‍රකාශ කිරීම නිවැරදි වේ. 'සීනයිහිදී' දෙවියන්වහන්සේ සහ ඉශ්‍රායෙල් ජාතිය අතර ඇතිවුණාවූ ගිවිසුම තුළින් මෙම අද්විතීය (UNIQUE) පාලන ක්‍රමය ක්‍රියාත්මක විය.

(කරුණාකර **නික්මයාම 19-24** කියවන්න)

පසුව මෝවබ් දේශයෙහිදී මෙම ගිවිසුම දෙවියන්වහන්සේගේ අණ පරිදි මෝසෙස් විසින් ස්ථිර කරන ලදී.

**ද්විතීය 29 : 1 :-**

**"ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල් පුත්‍රයන් සමග හොරේබ්හිදී** (සීනයිහිදී) **කළ ගිවිසුම හැර උන්වහන්සේ මෝවබ් දේශයෙහිදී ඔවුන් සමග කරනලෙස මෝසෙස්ට අණකළ ගිවිසුමේ වචන මේය."**

(කරුණාකර **ද්විතීය කථාව 21** කියවන්න)

පොරොන්දු දේශය අත්පත්කර ගැනීමෙන් පසු, මෙම ගිවිසුම නැවත වරක් යෝෂුවා විසින් ශෙකෙම්හිදී ස්ථිර කරන ලදී.

(කරුණාකර **යෝෂුවා 4** කියවන්න)

**'විනිශ්චයකාරයන්ගේ කාලය'** ලෙස කිතුනු සභාව විසින් හඳුන්වනු ලබන්නේ, යෝෂුවාගේ ඇවෑමේ පටන් ඉශ්‍රායෙල් දේශයේ රජතුමා ලෙස සාවුල් පත්කරනු ලබන තෙක් තිබුණු කාලයටයි.

- **<u>විනිශ්චයකාරයන්ගේ කාලය</u>**

විනිශ්චයකාරයන්ගේ කාලය ඉශ්‍රායෙල් ජාතියේ ඉතිහාසයේ ඉතා කණගාටු සහිත කාලයක් ලෙස විස්තර කිරීම නිවැරදි වේ. එසේ සිදුවීමට ප්‍රධානතම හේතුව වූයේ, **ඉශ්‍රායෙල් ජාතිය දෙවියන්වහන්සේගේ ස්වාමීත්වය නැවත නැවතත් ප්‍රතික්ෂේප කිරීමයි.** යෝෂුවාගේ පරම්පරාවෙන් පසු පරම්පරාව, දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියා නොදන සිටි අතර, ඔවුන් ඉක්මනින්ම පෙළඹුනේ අන් දෙවිවරුන් නමස්කාර කිරීමටයි.

**විනිශ්ච 2 : 10,11 :- " [10]..... ඔවුන්ට පසුව ස්වාමීන් - වහන්සේවත් ඉශ්‍රායෙල් උදෙසා උන්වහන්සේ කළ ක්‍රියාවල්වත් නොදන්නාවූ වෙන පරම්පරාවක් නැගුටුණේය. [11] <u>ඉශ්‍රායෙල් පුත්‍රයෝ</u> ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි නපුරුව තිබෙන දේ කොට <u>බාල් දේවතාවුන්ට සේවයකළෝය</u>."**

මෙහි ප්‍රතිඵලය වූයේ ස්වාමීන්වහන්සේගේ උදහස තම සෙනඟට විරුද්ධව ඇවිලී, ඉශ්‍රායෙල්වරුන්ව ඔවුන්ගේ සතුරන් විසින් පරාජය කරනු ලැබීමට උන්වහන්සේ විසින් ඉඩ හරිනු ලැබීමයි.

**විනිශ්ච 2:14 :- "ස්වාමීන්වහන්සේගේ උදහසද ඉශ්‍රායෙල්ට විරුද්ධව ඇවිළ උන්වහන්සේ ඔවුන් කොල්ලකාරයන් අතට පාවාදුන්සේක ...... ඔවුන් වටකර සිටිය සතුරන්ගේ අතට ඔවුන් පාවාදුන්සේක."**

සතුරන්ගේ පීඩා හේතුකොටගෙන මහත් අසීරුතාවයට පත්වූ ඉශ්‍රායෙල් ජාතිය, ඔවුන්ගේ අකීකරුකම් ගැන පසුතැවිලිවී, දෙවියන්වහන්සේ වෙත හැරී, උන්වහන් - සේගේ පිහිට පතා උන්වහන්සේට මොරගැසීම විනිශ්චයකාරයන්ගේ පොතේ නැවත නැවතත් අපට දකින්ට ලැබේ.

මේ අයුරින් ඉශ්‍රායෙල් ජාතිය දෙවියන්වහන්සේට මොරගැසූ කළ, ප්‍රේමයේ දෙවියන්වහන්සේ ඔවුන්ට අනුකම්පාකොට, ඔවුන්ව මුදවාගැනීම පිණිස ගැළවුම්කාරයෙක් **(විනිශ්චයකාරයෙක්)** නැගිටවූ සේක.

**විනිශ්ච 3:9:- "ඉශ්‍රායෙල් පුත්‍රයන් ස්වාමීන්වහන්සේට මොරගැසූකල ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල් පුත්‍රයන්ට ගැළවුම්කාරයෙකු නැගුටුවා දී ඔවුන් ගැළවූසේක ....."**

දෙවියන්වහන්සේ මේ අයුරින් විනිශ්චයකාරයෙක් නැගිටුවා, ඉශ්‍රායෙල් ජාතිය ඔවුන්ගේ සතුරන්ගෙන් මුදවා ඔවුන්ට ආශිර්වාද කළ අතර, වැඩි කලක් යෑමට ප්‍රථමයෙන් ඔව්හු නැවතත් දෙවියන්වහන්සේට අකීකරුවූහ. දෙවියන්වහන්සේ නැගිටෙවූ එක ශ්‍රේෂ්ඨ විනිශ්චය - කාරයෙක්වූ ගිඩියොන්ගේ කතා පුවත බොහෝ කිතුනුවන් අසා ඇත.


මිදියන්වරුද අමෙලෙක්වරුද පූර්ව දිශාවේ වැසියන්ගෙන්ද සමන්විතවූ **(විනි. 6:33)** භටයන් 135,000 ක හමුදාවක් **(විනි. 8:10)** පරාජය කර දැමීමට දෙවියන්වහන්සේ ගිඩියොන් සමග සිටි මිනිසුන් 300 දෙනාට හැකියාව දුන්සේක. එනමුත් ඉශ්‍රායෙල් ජාතිය ඉතා කෙටි කාලයකින් දෙවියන්වහන්සේට අකීකරුවූ බව අප දකිමු.

**විනිශ්ච 8:33 :- "තවද ගිඩියොන් මැරුණු වහාම ඉශ්‍රායෙල් පුත්‍රයෝ නැවතත් බාල් දේවතාවන් අනුව අනාචාරයෙන් හැසිරෙමින් බාල්-බෙරිත් තමුන්ට දෙවිකොට තබාගත් - තෝය."**

ඉහත සඳහන් කරුණු අනුව, අප දකින්නේ විනිශ්චය-කාරයන්ගේ කාලයේ, පහත සඳහන් පියවර හතර අනුව, ඉශ්‍රායෙල් ජාතිය නැවත නැවතත් ක්‍රියා කළ බවයි.

(i) **දෙවියන්වහන්සේට අකීකරු වී, අන් දෙවිවරුන් පසුපස යෑම.**
(ii) **දෙවියන්වහන්සේගේ උදහස ඇවිළී, ඔවුන්ගේ සතුරන් අතට ඔවුන් පාවා දෙනු ලැබීම.**
(iii) **ඉශ්‍රායෙල් ජාතිය පසුතැවිලි වී, දෙවියන්වහන්සේට මොර ගැසීම.**
(iv) **දෙවියන්වහන්සේ ඔවුන් මුදවා, ඔවුන්ට ආශිර්වාද කිරීම.**

මෙය වඩා පැහැදිලිව ඔබ දකින පිණිස, මෙම කාලය චක්‍රයක් ලෙස ඔබ ඉදිරියේ තබමි.




මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, ඉහත සඳහන් චක්‍රයේ නැවත නැවතත් ඉශ්‍රායෙල් ජාතිය ගමන් කිරීම අප දකින අතර, **අපගේ ජීවිතද අපම විමසා ගනිමු.**

- දේව ආශිර්වාද ඔබ ලබන අතර, ඔබ **උඩඟුකමට** ඔබගේ සිතේ මුල් ඇදගන්ට ඉඩ හැර, ඔබගේ **ප්‍රථම ප්‍රේමය (කීකරුකම)** අඩුවෙමින් තිබෙනවාද ?
- ඔබගේ කීකරුකම අඩුවීම හේතුකොටගෙන, සතුරාට ඔබගේ **ආශිර්වාද සොරා ගනිමින්** ඔබට පීඩා කිරීමට ඇති අවස්ථා වැඩිවෙමින් පවතිනවාද ?
- ඔබගේ සැබෑ තත්ත්වය පිළිගැනීමට ඔබ අකමැතිව ඔබට අවශ්‍ය **සැබෑ පසුතැවිල්ල** ඔබ ප්‍රතික්ෂේප කරනවාද?
- ඔබගේ ජීවිතය දෙවියන්වහන්සේගේ ආශිර්වාද වලින් පිරී ඉතිරී, ඔබ දිනපතා ඒවා ගැන ස්තුති ප්‍රශංසා දෙවි සමිඳුන්ට පුදනවාද ?

## (b) මෝවබ් දේශය සහ ඉශ්‍රායෙල් දේශය අතර සම්බන්ධකම

මෝවබ් වනාහි තමාගේ වැඩිමහල් දියණිය මඟින් ලොත් ලැබුවාවූ මුණුබුරායි **(උත්පත්ති 19:30-38).** මොවබ්ගෙන් ඇතිවුණු එනම් මෝවබ්වරුන්ගේ දේශය පිහිටා තිබුණේ යොර්දාන් ගඟෙන් නැගෙනහිර දිශාවෙහියි. ඉශ්‍රායෙල් ජාතිය කානාන් දේශය කරා ගිය ගමනේදී, මෝවබ් ජාතිය විසින් ඔවුන්ගේ දේශය හරහා ගමන් කිරීමටද ඉශ්‍රායෙල්වරුන්ට අවසර නොදෙන ලදී **(විනිශ්ච 11:17,18).**

අප සැම හොඳට අසා ඇති බාලාක් සහ බාලාම්ගේ කථාවේ, ඉශ්‍රායෙල්වරුන්ට සාපකිරීමට බාලාම්ට කොන්ත්‍රාත්තුව දුන්නාවූ බාලාක් වනාහි එවකට මෝවබ් දේශයේ රජතුමායි **(ගණන් කථාව 22-24).**

**විනිශ්චයකාරයන්ගේ පොතෙහි** අප දකින්නේ, මෝවබ් දේශය සහ ඉශ්‍රායෙල් දේශය අතර සාමාන්‍යයෙන් පැවතුනේ යුද්ධකාමී තත්ත්වයක් මිස මිත්‍රශීලී තත්ත්වයක් නොවන බවයි **(විනිශ්ච 3:12-30).**

මෙනමුත් රූත්ගේ කථාව සිදුවුන කාලය, **මෝවබ් දේශය සහ ඉශ්‍රායෙල් දේශය අතර පැවතුනේ තාවකාලික සාමකාමී කාලයක් බව** අපට නිගමනය කළ හැකිවේ.

## 2. <u>**කථාවට අදාල වන්නාවූ දේව නීති/නියෝග, ගෝයෙල්** (හෙබ්‍රෙව් බසින්) **යන යහපත් නීතිය**</u>

අපගේ දෙවියන්වහන්සේ ප්‍රේමයෙන් සහ දයාවෙන් පිරුනාවූ, අප සැමදෙනා පිළිබඳව ඉතා සාධාරණව ක්‍රියාකරන්නාවූ අති යහපත් ධර්මිෂ්ඨ දෙවිකෙනෙක් වනසේක. එබැවින් උන්වහන්සේ මෝසෙස් තුළින් මනුෂ්‍යයාට ලබා දුන්නාවූ ව්‍යවස්ථාවේ අප නිතර දකින්නේ නැතිබැරි නොහොත් අගහිඟකම් ඇති අය කෙරෙහි උන්වහන්සේ දක්වන්නාවූ ඉමහත් දයානුකම්පාව සහ සාධාරණත්වයයි.

ඉශ්‍රායෙල් ජාතියට අයිතිවූ ඕනෑම පවුලකට ඔවුන්ට හිමි ඉඩම විකිණීමට සිදුවුවහොත්, පවුලේ යම් කෙනෙක් වහලෙක් ලෙස විකිණීමට සිදුවුවහොත්, පවුලේ පිරිමියෙක් දරුවන් නොමැතිව මරණයට පත්වුවහොත්, එම තත්ත්වයෙන් එම පවුල මුදවාගැනීම උදෙසා දෙවියන්වහන්සේ මෝසෙස්ට දුන් ව්‍යවස්ථාවේ ඉඩ සලසා ඇති සේක. හෙබ්‍රෙව් බසින් **'ගෝයෙල් '** ලෙස හැඳින්වෙන මෙම නීතිය දෙවියන්වහන්සේ විසින් ස්ථාපනය කරන ලද අතර, **'ගෝයෙල් '** ලෙස **' මිදීම සිදුකරන ළඟම නෑයාව '** (KINSMAN REDEEMER) හඳුන්වනු ලැබේ.

මේ පිළිබඳව දේව නීති දෙස දෑන් බලමු.

(a) පවුලෙන් පිට විකුණන ලද ඉඩමක් මුදවා ගැනීම

**ලෙවී කථාව 25:23-25 :-**

**[23] දේශය හැමදාටම විකුණනු නොලැබිය යුතුය ......[24] නුඹලාට උරුමවෙන මුළු දේශයෙහි බිම් මුදාගන්ට නුඹලා ඉඩඇරිය යුතුය. [25] නුඹේ සහෝදරයෙක් දුප්පත්ව තමාගේ උරුමයෙන් කොටසක් විකුණන්නේනම් ඔහුගේ කිට්ටු නෑයා ඇවිත් තම සහෝදරයා විසින් විකුණනලද ඉඩම මුදාගත යුතුය."**

(කරුණාකර **ලෙවී 25:23-28** කියවා බලන්න)

(b) (වහල්කමට) විකුණන ලද කෙනෙක් මුදවා ගැනීම

**ලෙවී කථාව 25:47,48 :-**

**" [47]නුඹ වෙත සිටින විදේශීවූ ආගන්තුකවූ කෙනෙක් පොහොසත්වෙන්ටත්, ඔහු වෙත සිටින නුඹේ සහෝදරයෙක් දිළිඳුව, නුඹ වෙත සිටින විදේශීවූ ආගන්තුකවූ අයට හෝ විදේශියාගේ පවුලේ කෙනෙකුට හෝ විකුණනු ලබන්ටත් යෙදුණොත්, [48] ඔහු විකුණූ පසු නැවත මුදනු ලැබිය හැකිය ; ඔහුගේ සහෝදරයන්ගෙන් එක් කෙනෙකුට ඔහු මුදාගත හැකිය."**

(කරුණාකර **ලෙවී 25:47-50** කියවා බලන්න)

(c) දරුවන් නොමැතිව මළාවූ සහෝදරයාගේ නාමය මැකෙන්ට නොදීම

**ද්විතීය 25 : 5,6 :-**

**" [5] සහෝදරයන් එකට වාසයකරන අතර ඔවුන්ගෙන් එක්කෙනෙක් පුත්‍රයෙකු නැතුව මළොත්, මළ අයගේ භාර්යාව අන්‍යවූ පිට කෙනෙකුට සරණ නොවිය යුතුය. ඈගේ පුරුෂයාගේ සහෝදරයා ඈ වෙතට පැමිණ ඈ තමාට භාර්යාව කොට පාවාගෙන පුරුෂයාගේ සහෝදරයෙකුගේ යුතුකම ඈට කෙරේවා. [6] තවද මළාවූ සහෝදරයාගේ නාමය ඉශ්‍රායෙල් කෙරෙන් නොමැකෙන පිණිස ඈ වදන කුලුඳුලා මළ සහෝදරයාගේ නාමය දරන්නේය."**

(කරුණාකර **ද්විතීය 25:5-10** කියවා බලන්න)

❖ **දෙවියන්වහන්සේ, ඉශ්‍රායෙල් ජාතියේද, යේසුස්වහන්සේ සෑම සැබෑ ඇදහිලිවන්තයකුගේද ' මිදීම සිදුකරන ළඟම නෑයා ' ලෙස තේරුම් ගැනීම**

(i) **<u>ඉශ්‍රායෙල් සෙනඟගේ 'ළඟ නෑයා' වන යෙහෝවා නම් දෙවියන්වහන්සේ</u>**

පියවූ දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ව වහල්කමින් මුදවා ගත්තාවූ මිදුම්කාරයාණන්වහන්සේ වන සේක.

**නික්මයාම 20 : 2 :- " මම වනාහි වහල්කමේ ගෙයින් එනම් මිසර දේශයෙන් තා පිටතට ගෙනාවාවූ තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේය...."**

උන්වහන්සේ දුප්පතාද දිළින්දාද නිදහස්කරන්නාවූ දෙවියන්වහන්සේ වන සේක.

**ගීතාවලිය 82 : 4 :- " දුප්පතා හා දිළිඳා මුදාහරිව්. දුෂ්ටයාගේ අතින් ඔවුන් නිදහස්කරව්."**

**යෙරමියා 20 : 13 :- ".....ස්වාමීන්වහන්සේට ප්‍රශංසා-කරපල්ලා. මක්නිසාද උන්වහන්සේ දිළින්දාගේ ප්‍රාණය නපුරකරන්නන්ගේ අතින් නිදහස් කළසේක."**

**දානියෙල් 6 : 27 :- "උන්වහන්සේ ගළවා නිදහස්කරන-සේක ..... උන්වහන්සේ සිංහයන්ගේ බලයෙන් දානියෙල් ගැළවූසේකැයි ලියා යැවීය."**

උන්වහන්සේ ඉශ්‍රායෙල් නමැති උන්වහන්සේගේ බැටළුවන් ගළවාගන්නාසේක.

**එසකියෙල් 34 : 22 :- "මාගේ බැටළුවන් තවත් ගොදුරු නොවන ලෙස මම උන් ගළවා, ......"**

(කරුණාකර එසකියෙල් **34:10-12** කියවා බලන්න)

(ii) **<u>සැබෑ ඇදහිලිවන්තයින්ගේ 'ළඟ නෑයා' වන යේසුස්වහන්සේ</u>**

යේසුස්වහන්සේ අපගේ 'සහෝදරයෙක් ' ලෙස දේව වචනය හඳුන්වා දෙයි.

**හෙබ්‍රෙව් 2:11 : ''.... ඒ කාරණය නිසා උන්වහන්සේ ඔවුන්ට සහෝදරයෝයයි කියන්ට ලජ්ජානොවී : ''**

කිසිම බලාපොරොත්තුවක් නොමැතිව අසරණව අප සිටි අතර, උන්වහන්සේ අප මුදවාගත්සේක. උන්වහන්සේ තමන් වහන්සේගේ ලේ නමැති අධික මිල ගෙවා අපව ශාපයෙන් මුදවා, උන්වහන්සේගේ මනාලිය ලෙස අප පිළිගත්සේක.

එබැවින් ඇදහිල්ලෙන් උන්වහන්සේ වෙත පැමිණෙන්නාවූ සියළුම දෙනාගේම **'මිදීම සිදුකරන ළඟම නෑයා'** උන්වහන්සේ වන සේක.

අප අද අධ්‍යයනය කිරීම අරඹන්නාවූ **'රූත්ගේ කථාවට'** ඉහත සඳහන් ගෝයෙල් යන යහපත් නීතිය අතිශයින් අදාල වන නිසා, **රූත් 2:19,20** ඔබ ඉදිරියේ තබන්ට කැමැත්තෙමි.

**රූත් 2 : 19,20 :- ''..... මා අද වැඩකළේ බෝවස් නම්වූ මනුෂ්‍යයෙකු වෙතයයි** (රූත්) **කීවාය. [20]..... තවද නායොමි : <u>ඒ මනුෂ්‍යයා අපට ළඟ නෑයෙක්ය, අපේ ළඟම නෑයෙක්යයි ඈට කීවාය</u>.''**

3. <u>රූත්ගේ කථාව තුළින් ප්‍රකාශවන්නාවූ දේව ගුණාංග</u>

(i) **දේව පුත්‍රයා වන යේසුස්වහන්සේ අපගේ මිදුම්කරුවාණන් වහන්සේ** (Redeemer) **වන අතර උන්වහන්සේ අපගේ ජීවිත නැවත ගොඩනගන්නාවූ** (Restorer) **තැනන්වහන්සේ වනසේක**

**රූත් 1:1** හි අප දකින්නේ, බලාපොරොත්තු කැඩී බිඳී ගිය පවුලකි. තමන් උපත ලැබූ දේශයේ සාගතයක් ඇතිවීම හේතුකොටගෙන, සහනය සොයා විදේශීය රටක් කරා ගමන් ගන්නා පවුලකි.

එම පවුල විදේශගතව සිටි කාලයේ 'ඔවුන්ට හිමි සියල්ල' නැති වී අන්ත අසරණ තත්ත්වයට පැමිණි මේ පවුල **ගළවා ගැනීමට සහ නැවත ගොඩනැගීමට** දෙවියන්වහන්සේ මහත් පුදුම අන්දමින් ක්‍රියාකිරීම මෙමකථාව තුළින් අප දකිමු.

ප්‍රේමණීය දේව දරුවෙනි, මෙය තේරුම්ගන්න. අපගේ දෙවි පියාණන්වහන්සේ, අප කෙතරම් පහත් තත්ත්වයකට වැටී සිටියත්, එම තත්ත්වයෙන් අපව මුදවා, අපගේ ජීවිතවලට **නැවතත් බලාපොරොත්තුවක්** දෙන්නාවූ ස්වාමීන්වහන්සේ වනසේක.

වඩා පැහැදිලිව මෙය ඔබට තේරුම්ගැනීමට උපකාර කිරීම උදෙසා, ඉංග්‍රීසි බසින් Re යන අකුරු දෙකෙන් ආරම්භවන වචන වලින් බොහෝ වචන වලට එම අකුරු දෙකෙන් ගෙන දෙන්නේ **'නැවත'** යන අර්ථය බව ඔබට පෙන්නුම් කිරීමට කැමැත්තෙමි.

එනම් Re = Again **(නැවත)**

**<u>නිදසුන් වශයෙන්</u>**

| | | |
|---|---|---|
| REDEEM | = | නිදහස් කිරීම **(නැවත නිදහස ලබාදීම)** |
| RESTORE | = | **නැවත පිහිටීම (නැවත ගොඩනැගීම)** |
| REPAIR | = | අලුත් වැඩියා කිරීම **(නැවත පෙර තත්ත්වයට ගෙන ඒම)** |
| REVIVE | = | ප්‍රාණවත් කිරීම **(නැවත පණ ගැන්වීම)** |

දේව දරුව, ඔබ අද ඉන්නාවූ තත්ත්වය නිසා බිය නොවන්න, නොකැළඹෙන්න. ඔබගේ මිදුම්කරුවූ යේසුස්වහන්සේ **ඔබට නව ජීවනය දෙන්නාවූ, ඔබට නැතිවූ දේ නැවත ලබාදෙන්නාවූ, ඔබගේ ජීවිතය ගොඩනගන්නාවූ ස්වාමීන්වහන්සේ බව අදහමින්,** ඔබගේ සියළුම ප්‍රශ්න උන්වහන්සේට භාර දෙන්න.

### (ii) උන්වහන්සේ අපගේ මැවුම්කරුද මිදුම්කරුද වනසේක

දේව වචනයේ ප්‍රකාශවන්නේ, අපගේ දෙවියන්වහන්සේ අපගේ මැවුම්කාරයාණන්වහන්සේ සේම අපගේ මිදුම්කරුවාණන්වහන්සේද වන බවයි.

උන්වහන්සේගේ මෙම ක්‍රියාවන් දෙක දෙස බලන අතර අපට පෙනීයන්නේ මනුෂ්‍යයන් හැටියට අපට කිසිම දෙයක් මවන්ට නොහැකි නමුත්, අප සැමදෙනාටම තවත් කෙනෙකුව බොහෝ දේවලින් මුදවා ගැනීමට හැකි බවයි.

එබැවින් මනුෂ්‍යවූ අපට මෙම ක්‍රියා දෙකෙන් වඩා දුෂ්කර ක්‍රියාව වන්නේ මුදවාගැනීම නොව මැවීමයි. ප්‍රේමණීය දේව දරුව, මෙය තේරුම් ගන්න. සර්වබලධාරී දෙවියන් - වහන්සේට, **මැවීම ඉතා පහසු දෙයක් වනසේක.** මෙම ලොව මැවීම උදෙසා **උන්වහන්සේට කිරීමට තිබුණේ වචනය ප්‍රකාශ කිරීමට නොහොත් කීමට පමණි.**

**උත්පත්ති 1:3 :- "දෙවියන්වහන්සේ : එළිය වේවයි කීසේක ; එවිට එළිය විය."**

මෙනමුත් ඔබව මුදවාගැනීම උන්වහන්සේට එතරම් පහසු නොවීය. **එය උදෙසා උන්වහන්සේට උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාගේ ලේ වැගිරීමට සිදුවිය.**

**<u>දේව දරුව, ඔබ උදෙසා උන්වහන්සේ ගෙවූ මිලයේ අධිකකම වටහාගෙන, උන්වහන්සේට ඔබගේ ජීවිතය අදම භාරදෙන්න</u>.**

(iii) **උන්වහන්සේට ප්‍රේමකරන්නන්ගේ ජීවිතවල සියලූ දෙයම යහපත උදෙසා ක්‍රියාකිරීමට සලස්වන්නාවූ දෙවියන්වහන්සේ වන සේක**

**රෝම 8:28 :- "තවද දෙවියන්වහන්සේට ප්‍රේමකරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට, සියලු දේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අප දනිමුව."**

**රෝම 8:28** හි සඳහන් දේව පොරොන්දුව සෑම කිතුනුවෙක්ම පාහේ දන්නා අතර, රූත්ගේ කථාවේ අප දකින්නේ, මෙම පොරොන්දුවේ සත්‍යතාවයයි. දෙවියන්වහන්සේට බොහෝසේ ප්‍රේමකළාවූ නායොමිගේ සහ රූත්ගේ ජීවිතවල ' **සියලු දෙයම** ' ඔවුන් දෙදෙනාගේම ජීවිතවල යහපත උදෙසා දෙවියන්වහන්සේ ක්‍රියා කිරීමයි.

දේව දරුවෙනි, අප සැමද දෙවියන්වහන්සේට ප්‍රේමකරමින්, **(එනම් උන්වහන්සේගේ ආඥා රක්ෂාකරමින් - යොහන් 14:15)** උන්වහන්සේ වෙත තව තවත් ලංවෙමු. එවිට බොරු නොකියන්නාවූ දෙවියන්වහන්සේ **රෝම 8:28** හි සඳහන් පොරොන්දු ඔබගේ ජීවිත අත්දැකීම කරනසේක.

## 4. රූත්ගේ කථාව අධ්‍යයනය කිරීමට අදාල වෙනත් කරුණු

### (a) යුදෙව් නම් වල වැදගත්කම තේරුම් ගැනීම

පරණ ගිවිසුම ලියන ලද්දේ මූලික වශයෙන්ම හෙබ්‍රෙව් භාෂාවෙන් වන අතර, **එස්රා 4:8 - 6:18, 7:12 - 26, දානියෙල් 2:4 - 7:28** සහ **යෙරමියා 10:11** පමණක් ඇරමික් භාෂාවෙන් ලියැවී තිබේ. මෙලෙස **'රූත්ගේ කථාව'** සම්පූර්ණයෙන් හෙබ්‍රෙව් බසින් ලියැවුනු අතර, එම භාෂාවේ සඳහන් සෑම නමක්ම ඉතා අර්ථවත් වේ. ඒ අතරම දේව වචනය අධ්‍යයනය කරන අප දකින්නේ, නොයෙක් අවස්ථාවලදී දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම තුළ දෙමව්පියන් තම දරුවන්ට නම් තැබූ බවත්, එබැවින් එවැනි නම් අතිශයින් අර්ථවත් වන බවත්ය. (නිදසුනක් වශයෙන් **සාමුවෙල්** යන නමේ එක අර්ථයක් වන්නේ, **දෙවියන්වහන්සේ ඇසූසේක** යන්නයි)

**රූත් 1:1,2** හි සඳහන් වැදගත් නම් හතර දෙස අපි මොහොතකට බලමු.

| **නම** | **අරුත** |
|---|---|
| - යුදය | ප්‍රශංසාවේ දේශය |
| - බෙත්ලෙහෙම | ආහාර නිවස (House of Bread) |
| - එලිමෙලෙක් | මාගේ දෙවියන්වහන්සේ මාගේ රජතුමාය |
| - නයෝමි | මිහිරි තැනැත්තී |

ඉහත සඳහන් නම්වල අරුත සහිතව අප දැන් **රූත් 1:1** දෙස නැවත බලමු.

**රූත් 1:1 :- "…..දේශයේ**(බෙත්ලෙහෙම ඇතුලුව) **සාගතයක් විය ….."**

හෙබ්‍රෙව් නම්වල අරුත, මෙම වගන්තියට ඇතුලත් කොට, එය නැවත ලිව්වහොත්, අප ඉදිරියේ තිබෙන වගන්තිය වන්නේ, **'ආහාර නිවසේ, ආහාර හිඟයක් විය'** යන්නයි. මෙය මහ පුදුමයකි. විය නොහැකි දෙයකි. එබැවින් එසේ සිදුවීමට පැහැදිලි හේතුවක් තිබිය යුතුම වේ. දේව වචනය අනුව, නිසැකවම එය ඉශ්‍රායෙල් ජාතියේ අකීකරුකම වෙන්ට ඇත. (කරුණාකර **2 ලේකම් 7:13,14** කියවා බලන්න)

(b) **මෙහි සඳහන් පරම්පරා විස්තර, පෙර ඇඟවීම් (TYPOLOGY) සහ දේව ධර්මය නිසි ලෙස හඳුනාගැනීම**

(i) **පරම්පරා විස්තර**

**රූත් 4:13 :- "මෙසේ බෝවස් රූත් පාවාගත්තේය, ඈ ඔහුගේ භාර්යාව වූවාය. ඔහු ඈ වෙතට පැමිණි කල ස්වාමීන්වහන්සේ ඈට ගර්භෝත්පත්තිය දුන්සේක, ඈ පුත්‍රයෙකු වැදුවාය."**

**රූත් 4:17 :- ".... ඔබෙද් යන නම ඔහුට තැබුවෝය. ඔහු දාවිත්ගේ පියවූ යෙස්සේගේ පියාය."**

මෙම පරම්පරා විස්තරය තුළින් අප දකින්නේ **අන්‍යජාතිකයෙක්වූ රූත්,** දාවිත්ගේද, යේසුස් - වහන්සේගේද පරම්පරා ලැයිස්තුවට දෙවියන් - වහන්සේ විසින් ඇතුල් කරනු ලැබීමයි.

(ii) **පෙර ඇඟවීම**

**බෝවස් -** මෙසියස්වහන්සේගේ(යේසුස්වහන්සේගේ) පෙර ඇඟවීමක්

**රූත් -** ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය වන සභාවේ පෙර ඇඟවීමක්

(iii) **දේව ධර්මය**

මෙම පොතෙහි දෙවියන්වහන්සේ කෙබඳු කෙනෙක්ද යන්න නැවත නැවතත් පෙන්වා දෙනු ලබන අතර, එහි අප වැඩිදුරටත් දකින්නේ, ඕනෑම මනුෂ්‍යයෙකුට ගැළවීමට ඇතුල්වීමට උන්වහන්සේ දෙන්නාවූ අවස්ථාව සහ ආරාධනාවයි.

රූත්ගේ කථාව අධ්‍යයනය කිරීම අද අරඹන්නාවූ ඔබ සැම එමගින් සැබවින්ම උන්වහන්සේගේ කීකරු දරුවන් බවට පත්වී, උන්වහන්සේගේ රාජ්‍යයේ වර්ධනය උදෙසා සේවයෙහි නිරතවීම අපගේ යාච්ඤාවයි.

**එසේ උන්වහන්සේට විශ්වාසවන්තව සේවය කිරීමට**

**දෙවි පියාණන්වහන්සේ ඔබට පිහිටවන සේක්වා !!!**

# සටහන්

# සටහන්

# නිවැරදි තීරණ ගැනීම



## රුත්ගේ කථාව - 02

# නිවැරදි තීරණ ගැනීම

## රූත් 1:1-22

<u>**හැඳින්වීම**</u> **:-**

මනුෂ්‍ය වූ අප සැමට අපගේ ජීවිතවල සැමදාම තීරණ ගැනීමට සිදුවේ. මෙම තීරණවලින් අති බහුතරයක් අපගේ එදිනෙදා ජීවිතයට අදාල වන්නාවූ ඉතා සරල වූ තීරණ වන අතර, අප ගන්නාවූ සමහර තීරණ අපගේ, අපගේ පවුලේ සහ අපගේ අනාගතය කෙරෙහි අධිකලෙස බලපාන්නාවූ, තීරණ විය හැකිවේ. එබැවින් අද දවසේ අප ඉදිරියේ තිබෙන්නාවූ මාතෘකාව, එනම් **' නිවැරදි තීරණ ගැනීම '** යන මාතෘකාව අප සැමට අතිශයින් වැදගත් වේ.

කිතුනු අප ගන්නාවූ තීරණ අතරින්, **ඉතාමත්ම වැදගත්** තීරණ තුනක් වෙත, ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. එම තීරණ නම්,

- දෙවියන්වහන්සේ/ යේසුස්වහන්සේ කෙරෙහි සම්පූර්ණ ඇදහිල්ල තබමින්, ත්‍රී එක දෙවියන්වහන්සේට මාගේ ජීවිතය මම භාර කරනවාද ?
- මා තෝරාගන්නාවූ වෘත්තිය නොහොත් රැකියාව කුමක්ද ?
- මම විවාහ වන්නේ කාටද ?

යන ප්‍රශ්න තුනට අප දෙන්නාවූ පිළිතුරු නොහොත් ඒවා ගැන අප ගන්නාවූ තීරණයි.

මාගේ ප්‍රේමණීය සහෝදර සහෝදරියෙනි, දරු දූරියනි, මෙම ප්‍රශ්න තුනෙන් ප්‍රථම ප්‍රශ්නය පිළිබඳව මා තිර තීරණයක් ගත්තේ විසිදෙහැවිරිදි තරුණයෙක් ලෙසයි. මා ගත්තාවූ තීරණය වූයේ, දෙවි සමිඳුන්ට මාගේ ජීවිතය කැපකර උන්වහන්සේට කීකරුව ජීවත්වීමටයි. මාගේ ජීවිතය බාරගත් උන්වහන්සේ, එදා පටන් මාගේ ජීවිතයේ සෑම තීරණයකදීම මා සමඟ සිටිසේක. මා කළ සෑම රැකියාවකදී ද මගේ විවාහය තුළ ද උන්වහන්සේ සිටිසේක.

උන්වහන්සේ මාගේ මුලු ජීවිතයට සෑම අතින්ම ආශිර්වාදකොට, ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ අති උතුම් සේවය මට දුන්සේක. මෙම සේවයෙහි මා විශ්වාසවන්තව යෙදී සිටින අතර, ඉශ්‍රායෙල් දේශයෙහි සේවය කරමින් ' **යුදෙව්වරුන්ව ගැළවීමට ගෙන ඒමේ** ' ඉමහත් ආශිර්වාදය මාගේ ජීවිතයට එකතු කළසේක. මාගේ දරුවන්ටද දරුවන්ගේ දරුවන්ටද පුදුමාකාර අන්දමින් උන්වහන්සේ ආශිර්වාද කරමින් සිටිනසේක.

එබැවින් ඉතා ආදරයෙන්ද ඉතා යටහත්වද මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ, පමා නොවී, අදම මෙම ප්‍රශ්න තුනෙන් ප්‍රථම ප්‍රශ්නය ගැන ධනාත්මක පිළිතුරක් දෙවි සමිඳුන්ට දෙන ලෙසයි.

**<u>අධ්‍යයනය</u> :-**

**<u>තීරණ හතරක් ගත්තාවූ හතරදෙනෙක්</u>**

1. **<u>එලිමෙලෙක් ගත්තාවූ තීරණය - රූත් 1:1</u>**
එලිමෙලෙක්ගේ තීරණය වූයේ, තම පවුල සමඟ තමා උපන් රට අතහැර විදේශගත වීමටයි.

(a) එලිමෙලෙක් යන නමේ අර්ථය වන්නේ, **'මාගේ දෙවියන්වහන්සේ මාගේ රජතුමා වේ'** යන්නයි. දෙවියන්-වහන්සේ සැබවින්ම එලිමෙලෙක්ගේ **'රජතුමා'** නොහොත් **'ස්වාමීන්වහන්සේ'** ලෙස ඔහු පිළිගත්තේ නම්, එලිමෙලෙක් තම රජතුමාට/ස්වාමීන්වහන්සේට යටත්ව, කීකරුව ජීවත්වීමට බැඳී සිටිනු ඇත.

තම නමින් එලිමෙලෙක් ලොවට ප්‍රකාශ කළේ දෙවියන්-වහන්සේ ඔහුගේ ' **ස්වාමීන්වහන්සේ** ' වන බව නමුත්, ඔහු ක්‍රියා කළේ ඔහුගේ නමට ඔබින ලෙස නොවන බව ඔහු ගත්තාවූ තීරණයෙන් අපට පැහැදිලි වේ.

එලිමෙලෙක් ගත්තාවූ වැරදි තීරණය හේතුකොටගෙන ඔහුගේ පවුල මහත් දුෂ්කරතාවයට, වේදනාවට සහ අසරණ භාවයට පත්වුණි. මෙනමුත් ඔහු තම නමට ඔබින ලෙස **'දේශයේ සාගතයක්'** ඇතිවූ කාලය තුළ දෙවියන්වහන්සේ වෙතට ලංවූයේ නම්, නොඅනුමානව මෙම ඉරණම ඔහුගේ පවුලට අත්නොවන බව සහතිකවේ.

❖ දේව දරුවන් වන්නාවූ ඔබගෙන් බොහෝ දෙනෙක් **ගීතාවලිය 23** කටපාඩමින් දන්නා බව මාගේ විශ්වාසයයි. එබැවින් මෙම ගීතිකාව ඇසුරින්, ඔබගෙන් ප්‍රශ්නයක් ඇසීමට කැමැත්තෙමි. එම ප්‍රශ්නය නම්,

**"ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය ; මට හිඟයක් නොවන්නේය." (ගීතා 23:1)** යන සත්‍යය ඔබ අත්දකිනවාද ? යන ප්‍රශ්නයයි. ඔබ මෙම සත්‍යය අත්දකින්නේ නැති නම්, මා ඔබගෙන් තවත් ප්‍රශ්නයක් අසන්ට කැමැත්තෙමි. එම ප්‍රශ්නය නම්,

**' ඔබ දෙවියන්වහන්සේව ඔබගේ ස්වාමීන්වහන්සේ ලෙස භාරගනිමින්, උන්වහන්සේට කීකරුව ජීවත්වනවාද ? '**

යන ප්‍රශ්නයයි.

ප්‍රේමණීය දේව දරුවෙනි, **'ස්වාමිනි, ස්වාමිනි'** කියා යාච්ඤාවෙන් දෙවියන්වහන්සේ අමතන ඔබ සැම, උන්වහන්සේට ඔබගේ ජීවිතයේ ස්වාමීත්වය (රජකම) භාරදෙමින්, **ගීතාවලිය 23** හි ඇති සියලුම දේව පොරොන්දු/ආශිර්වාද වලට නොපමාව ඇතුල්වන්න. එලිමෙලෙක් තම නමින් ප්‍රකාශ කල දෙයට ප්‍රතිවිරුද්ධව ක්‍රියා කළාක් මෙන් ක්‍රියා නොකරන්න. ඔබගේ මුවින් ඔබ දෙවියන්වහන්සේට **'ස්වාමිනි'** කියා ගායනා/යාච්ඤා කරමින් ඒ අනුව ක්‍රියාකරන්න.

**මතෙව් 7:21 :-**

**"ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන්නා මිස මට : ස්වාමිනි, ස්වාමිනියි කියන සියල්ලෝම ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නෝය."**

(b) **රූත් 1:1** හි **' බෙත්ලෙහෙමේ සාගතයක් '** ඇතිවූ බව අපට පෙන්නුම් කරන අතර, පසුගිය අධ්‍යයනයෙහි සඳහන් කරනු ලැබූ ආකාරයට **2 ලේකම් 7:13,14** අපට පෙන්නුම් කරන්නේ මෙවැනි සාගතයක් ඉශ්‍රායෙල් දේශයේ ඇතිවීමට හේතුව වූයේ, ඉශ්‍රායෙල්වරුන් දෙවියන්වහන්සේට අකීකරුවීම බවයි.

පසුගිය අධ්‍යයනයෙහිදී අපි වැඩි දුරටත් ඉගෙන ගත්තේ **'විනිශ්චයකාරයන් විනිශ්චය කරන දවස්වලදී'** බොහෝ අවස්ථාවලදී ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේට අකීකරුවීම හේතුකොටගෙන ඔවුන්ට බොහෝ අභියෝගවලට මුහුණ දීමට සිදුවූ බවත්, ඔවුන් පසුතැවිලි වූ විට දෙවියන්වහන්සේ ඔවුන්ව මුදවා ගත් බවත්ය.

එබැවින් **' එලිමෙලෙක් '** යන ඉතා අර්ථවත්වූ නමක් තිබුනාවූ මෙම පවුල් ප්‍රධානියා විසින් ගත යුතුව තිබුණාවූ තීරණය වූයේ, තම පවුල තම සෙනඟගේ පසුතැවිල්ලට එකතුකර ගැනීමයි. නමුත් ඔහු ගත්තාවූ තීරණය වූයේ, තම පවුල සමඟ විදේශගත වීමටයි !!

**<u>කෙටි සටහනක්</u> :**

**රූත් 1:1** හි සඳහන් වන්නේ එලිමෙලෙක් තම පවුල සමඟ මෝවබ් දේශයෙහි එහි **'වසන පිණිස'** ගිය බව නමුත් බයිබලයේ ඉංග්‍රීසි පරිවර්තනය මීට වඩා වෙනස් අරුතක් සඳහන් කරයි.

' Went to sojourn ' (KJV)
' Went to live for a while ' (NIV)

ඉංග්‍රීසි බයිබලයේ සඳහන් ආකාරයට **රූත් 1:1** ප්‍රකාශ කරන්නේ එලිමෙලෙක් මෝවබ් දේශයට ගියේ **'ටික කලකට'** බවයි.

මෙනමුත් **රූත් 1:2** හි සඳහන් වන්නේ මෙම පවුල **'එහි සිටියෝය'** යන වචනයි ; continued there (KJV) ; lived there (NIV).

මේ අතර **රූත් 1:4** හි සඳහන් වන්නේ, ඔවුන් දස අවුරුද්දක් පමණ මෝවබ් දේශයේ විසූ බවයි.

ඉහත සඳහන් සෑම දෙයක්ම අපට පෙන්වාදෙන්නේ, එලිමෙලෙක් ගත්තාවූ තීරණය නිවැරදි තීරණයක් නොවන බවයි.

## <u>එම තීරණය වැරදිවීමට හේතු</u>

(i) මෝවබ්වරු රූප වදින්නන් වූ අතර, ඔවුන් සමඟ විවාහවීම දෙවියන්වහන්සේ විසින් තහනම්කර තිබුනි. (මෝවබ්වරු නමස්කාර කළේ කෙමොෂ් යන දේවතාවටයි - **1 රාජා 11:33**). එබැවින් තරුණ පුත්‍රයන් දෙදෙනෙක් සමඟ එහි යෑම ප්‍රඥාවන්ත තීරණයක් නොවීය.

(ii) එලිමෙලෙක් ගත්තාවූ තීරණය ආත්මාර්ථකාමී තීරණයක් විය. තම දේශය තුළ ඇතිවී තිබුණාවූ සාගතය හේතුකොටගෙන, එහි විසූ සැමදෙනා අපහසුතාවයට පත්වී තිබුණි. එබැවින් ඔහු තීරණයකට එළඹිය යුතුව තිබුනේ, තමාගේ පවුල ගැන පමණක් සිතා නොවේ. මුලු ජාතිය ගැන සිතා බලා, ඔහු තීරණයකට එලඹීම ඔහු විසින් කළ යුතුව තිබුනි.

(iii) ඔහු විසින් ගනු ලැබුවාවූ තීරණය, දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව ගත්තාවූ තීරණයක් නොවීය.

(iv) දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට මෝවබ්වරුන් සමඟ සම්බන්ධකම් පිළිබඳව ඉතා පැහැදිලි ආඥා දී තිබුණු අතර, එලිමෙලෙක් මේවා සැලකුවේ නොමැත.

**ද්විතීය 23:6 :- "නුඹේ සියලු දවස්වල සදාකාලයටම ඔවුන්ගේ සමාදානයවත් ඔවුන්ගේ ශුභ සිද්ධියවත් නොසොයන්න."**

(කරුණාකර **ද්විතීය 23:3-6** කියවන්න)

## <u>වැරදි තීරණයේ ප්‍රතිඵල</u>

(i) ඔහු මෝවබ් දේශය වෙත තම පවුල සමඟ ගියේ, '**ටික කලකට**' පසු බෙත්ලෙහෙම වෙත හැරී ඒමේ අදහසින් වූ නමුත්, **(රූත් 1:1)** ඔහුට සිදුවූයේ මෝවබ් දේශයේ දිගු කලක් (ඔහුගේ දේශයෙන්ද, ජාතියෙන්ද, දේව නමස්කාරයෙන්ද ඈත්වී) රූප වඳින්නාවූ සෙනඟක් සමඟ ජීවත්වීමටයි.

(ii) වැඩි කලක් යෑමට ප්‍රථමයෙන්, ඔහුද ඔහුගේ තරුණ පුත්‍රයන් දෙදෙනාද එහිදී මිය යෑම.

(iii) ඔහුගේ බිරිඳ, විදේශ රටක අති අසරණ තත්ත්වයට පත්වීම.

(iv) ඉශ්‍රායෙල් දේශයේ, දෙවියන්වහන්සේ ඔහුට ලබා දුන්නාවූ උරුමය තම පවුලෙන් නැතිවීමේ තත්ත්වයක් උදාවීම.

<u>**කෙටි සටහනක්**</u>

දෙවියන්වහන්සේගේ වචනයේ අප දකින්නාවූ වැදගත් දෙයක් වන්නේ, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟගේ උරුමයට දෙන්නාවූ ඉතා වැදගත් ස්ථානයයි . (**'ගෝයෙල්'** නීතිය තුළද උන්වහන්සේ මෙය පෙන්වා දෙනසේක)

එබැවින් යම්කිසි මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේ තමාට ලබාදුන්නාවූ 'උරුමය' නොසලකන්නේ නම්, ඔහුට එම උරුමය සහ එමගින් හිමි ආශිර්වාද ගිලිහී යා හැකි බව දේව වචනයේ අපි දකිමු.

**උත්පත්ති 25:34 :- "එවිට යාකොබ් රොටිද කොල්ලු ව්‍යංජනද ඒසව්ට දුන්නේය ; ඔහු කා බී නැගිට ගියේය. <u>මෙසේ ඒසව් තමාගේ කුලුඳුල්කම සුළු කළේය</u>."**

අප කවුරුත් දේව වචනය මගින් හොඳින් දන්නාවූ ආකාරයට, වැඩිමහල් සහෝදරයා ලෙස තම පියාගේ උරුමය හිමිව තිබුනාවූ ඒසව් එය ඉතා සුළුකොට සලකමින් එය අහිමි කරගත්තේය.

එම උරුමය ලබාගැනීමට ' **මහත් පිපාසයක්** ' දක්වූවාවූ යාකොබ් නමැති බාල සොහොයුරාට දෙවියන්වහන්සේ ' **ඉශ්‍රායෙල්** ' යන නම ලබාදී, ඔහුගේ නම දරන්නාවූ ජාතිය තුළින් යේසුස්වහන්සේ ලොවට බිහිකර, මුලු ලොවම ආශිර්වාද කළ සේක.

## කිතුනු අප තීරණ ගත යුතු අන්දම

එලිමෙලෙක් ගත්තාවූ වැරදි තීරණය හේතුකොටගෙන ඔහුගේ මුළු පවුල අන්ත අසරණ තත්ත්වයකට කඩා වැටීම ගැන ඉගෙන ගත්තාවූ අප, අපගේ තීරණ ගැනීමේදී මහත් වගකීමෙන් ක්‍රියා කළ යුතු බව ඔබ කවුරුත් පිළිගන්නවා යයි සිතමි.

එනමුත් අප නිවැරදි තීරණ ගැනීමේ ඇති වැදගත්කම නිසාම එලිමෙලෙක්ගේ ක්‍රියා කිරීම ඇසුරින්, මෙම යෝජනාව ඔබ ඉදිරියේ තබමි. ඔබගේ ජීවිතයේ වැදගත් තීරණ ගැනීමට ප්‍රථමයෙන්, පහත සඳහන් ප්‍රශ්න තුනට අවංකව පිළිතුරු දී, මහත් කන්නලව්වෙන් දෙවියන් - වහන්සේගේ මඟපෙන්වීම සොයන්න.

(i) මාගේ ප්‍රශ්නය පිළිබඳව දේව වචනයේ සඳහන් වන්නේ කුමක්ද ? නොහොත් මාගේ තීරණය දේව වචනයට අනුකූලද ?

(ii) දේව දරුවෙක් ලෙස, දෙවියන්වහන්සේ මාව කැඳවා ඇත්තේ කුමක් උදෙසාද ? ඒ අනුව මාගේ වගකීම/ සේවය කුමක්ද ? කොතැනකද ?

(iii) මෙම ප්‍රශ්නය තුළින් දෙවියන්වහන්සේ මට ඉගැන්වීමට තැත් කරන්නේ කුමක්ද ? මා ගන්නාවූ මෙම තීරණය සාධාරණද ?

## කෙටි සටහනක්

සෑම දේව දරුවෙක් පිළිබඳවම දේව වචනය ප්‍රකාශ කරන්නේ ඔවුන් යේසුස්වහන්සේ මෙන් වීමට දෙවියන්වහන්සේ පූර්වයෙන් නියම කළ බවයි. එබැවින් දේව දරුවන් වන්නාවූ අප, උපත ලැබූ රට, පවුල යනාදිය තීරණය කළේ අප නොව දෙවියන්වහන්සේය.

එමනිසා **ප්‍රශ්න ඇතිවූ විට අප එලිමෙලෙක් මෙන් ක්‍රියා නොකරමු. දෙවියන්වහන්සේ අපට විශේෂ මඟපෙන්වීමක් දුන්නොත් මිස, උන්වහන්සේ අපව තැබූ රටේ, සභාවේ උන්වහන්සේට විශ්වාසවන්තව සේවයේ යෙදී සිටිමු.**

## 2. නායොමි ගත්තාවූ තීරණය - රූත් 1:6

නායොමි ගත්තාවූ තීරණය වූයේ, නැවත දෙවියන්වහන්සේ ඇයව තැබූ ස්ථානය වන බෙත්ලෙහෙම වෙත හැරීයාමයි.

**රූත් 1:6 :- "එවිට මෝවබ් රටින් හැරීඑන පිණිස ඈ තමාගේ යෙහෙළියන් සමග නැගුටුණාය. මක්නිසාද ස්වාමීන්වහන්සේ තමන් සෙනඟට භෝජනය දීමෙන් ඔවුන්ට කරුණාව පෙන්වූ බව මෝවබ් රටේදී ඈට සැලවිය."**

### (a) ඇයගේ තීරණය දුෂ්කර තීරණයක් විය

පවුලක් යන්න දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ලබා දුන්නාවූ ඉමහත් ආශිර්වාදයක් වන අතර, එහි නිර්මාණ කතුවරයා වන්නේ මනුෂ්‍යයා නොවේ, දෙවියන්වහන්සේයි. උන්වහන්සේ නිර්මාණය කලාවූ ' පවුලේ ' ප්‍රධානියා වූයේ පුරුෂයායි. එබැවින් මෙම පවුලේ ප්‍රධානියා වූයේ එලිමෙලෙක් වූ අතර, මෝවබ් දේශය වෙත යෑමේ වැරදි තීරණය ගනු ලැබුවේ එලිමෙලෙක් විසින් බව අප දන්නෙමු.

එලිමෙලෙක් ගත්තාවූ වැරදි තීරණය නිසා අන්ත අසරණ භාවයට පත්ව සිටියාවූ නායොමි ඉදිරියේ තිබුණාවූ තීරණය කිසිසේත් පහසු තීරණයක් නොවීය. එය දුෂ්කර වීමට හේතු සමහරක් පහත සඳහන් වේ.

(i) එදා යුදෙව් සමාජයේ වැන්දඹුවකට තිබුණේ ඉතා පහත් තැනකි. තම පුරුෂයා සහ පුතුන් දෙදෙනා සමඟ 'නම්බුකාර' පවුලක් ලෙස තම රටෙන් පිටත් වූ නායොමිට දැන් නැවත පැමිණෙන්ට තිබුණේ, තම පුතුන් දෙදෙනා අහිමිවුනාවූ අසරණ වැන්දඹුවක් ලෙසයි.

එබැවින් ඇයගේ නැවත පැමිණීම ඇයව මහත් ලැජ්ජාවට පත්කරන්නාවූ කරුණක් විය. එය ඇයව බොහෝ දෙනාගේ සිනහවට ලක්වෙන්නාවූ, නින්දා අපහාස ලබන්නාවූ, විවේචනයට මුහුන දීමට සිදුවෙන්නාවූ තීරණයක් වන බව නයෝමි දැන සිටියාය.

(ii) නැවත පැමිණීමට නම්, තම පවුල රටින් බැහැරවීමට ගත්තාවූ තීරණය වැරදි තීරණයක් බව ඇය පිළිගෙන, එය ගැන පසුතැවිලිවීමද අනිවාර්‍යය විය.

මෙනමුත් අප කවුරුත් දන්නා ආකාරයට බොහෝ මනුෂ්‍යයෝ තමා කළාවූ දෙය/ක්‍රියා කළාවූ අන්දම/ගත්තාවූ තීරණය වැරදි බව පිළිගැනීමට ඉතා අකමැතිවෙති. තමාගේ වරද නොපිළිගන්නා අතර කිසිවෙකුට පසුතැවිලි වීමට නොහැකි වේ.

**එබැවින් නැවත පැමිණීම උදෙසා නායොමිට යටහත්කම පැළඳගැනීමට තිබුණි.**

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, තම පවුලේ වරද පිළිගෙන, එම වරද නිවැරදිකිරීම උදෙසා, **<u>යටහත්කම පැළඳගනිමින්, තම වරද පිළිගනිමින්, දෙවියන්වහන්සේට යටත්වෙමින් පසුතැවිල්ලෙන් නායොමි ක්‍රියා කළාය</u>.**

කිතුනුවන් වන්නාවූ අප සැමද, ආත්මිකව වර්ධනයවීමට නම්, **අනිවාර්‍යයයෙන්ම නායොමිගේ ආදර්ශය (තීරණය) අනුගමනය කළ යුතුයි.**

මා එසේ ප්‍රකාශ කරන්නේ, බොහෝ කිතුනුවන් **(සමහරවිට ඔවුන් තුළ ඇත්තාවූ උඩඟුකම නිසා)** තම වරද පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම සිදුවීම මා නිතර අත්දැක ඇති බැවිනි. ඒ අතරම උඩඟුකම සහ යටහත්කම දෙවියන්වහන්සේ සලකන අන්දම දේව වචනයේ මෙසේ සඳහන් වේ.

**යාකොබ් 4:6 :-"…..දෙවියන්වහන්සේ උඩඟුවූවන්ට විරුද්ධව සිට, යටහතුන්ට කරුණාව දෙනසේකැයි ලියවිල්ල කියන්නේය."**

කිතුනු ජීවිතයේ, <u>පසුතැවිල්ල</u> ගන්නාවූ ස්ථානය, ඔබට වඩා හොඳින් වටහාගැනීමට උපකාර කිරීම උදෙසා, **'අකීකරු පුත්‍රයාගේ උපමාව'** වෙත ඔබගේ අවධානය මොහොතකට ලක්කිරීමට කැමැත්තෙමි. නායොමිටත් වඩා පහත් තත්ත්වයකට වැටුණාවූ අකීකරු පුත්‍රයා, තම පියාගෙන් ලැබුවාවූ ආශිර්වාද අප දන්නෙමු. ඔහු පසුතැවිලි නොවුනේ නම්, ඔහු යනු ඇත්තේ විනාශයටයි. මේ අතර පසුතැවිල්ලට පැමිණි ඔහු ලැබුවේ තම පියාගේ ආශිර්වාදයයි.

**අප සැමද අකීකරු පුත්‍රයා/නායොමි මෙන් අපගේ වැරදි තීරණ ගැන පසුතැවිලි වී, දෙවියන්වහන්සේට ලංවෙමු.**

❖ නායොමි නිවැරදි තීරණයක් ගත්තා පමණක් නොව, එම තීරණය ක්‍රියාවට නංවන අතරද, ඈ මහත් ඇදහිල්ලෙන්ද දේව භය ඇතිවද, අවංකවද ක්‍රියා කළාය.

❖ **ඈ ක්‍රියා කළ අන්දම දෙස බලමු**

(i) මෝවබ් දේශය වෙත යෑමේ තීරණය ගනු ලැබුවේ එලිමෙලෙක් විසින් වූ නමුත්, ඈ එම තීරණයේ වරද එලිමෙලෙක් වෙත පැවරුවේ නැත. මෝවබ් දේශය වෙත යෑම ගැන, ඈ නිදහසට කරුණු ඉදිරිපත් කළේ නැත. ඈ ඇයගේ පාපය සඟවන්ට උත්සාහ කළේ නැත. **එසේ ඇයගේ හදවතේ ඇතිව තිබුණාවූ <u>පසුතැවිල්ල, ඇය ක්‍රියා කළ අන්දමින් ඈ ප්‍රකාශ කළාය</u>.**

(ii) ඇයගේ පවුල සම්බන්ධයෙන් දෙවියන්වහන්සේ ක්‍රියාකිරීම ඈ යටහත්ව භාරගෙන, උන්වහන්සේට යටත්විය. ඈ කිසිසේත් දෙවියන්වහන්සේට දොස් පවරන්නේ නැතිව උන්වහන්සේගේ විනිශ්චය නිවැරදි බව පිළිගත්තාය.

**රූත් 1:13 :- "…. ස්වාමීන්වහන්සේගේ අත මට විරුද්ධව තිබෙන නිසා නුඹලාගේ දුකට වඩා මාගේ දුක මහත්ව තිබේයයි කීවාය."**

**රූත් 1:20, 21 :- "[20] ඈද : මට නායොමියයි නොකියා මාරායයි කියාපල්ලා. මක්නිසාද සර්වපරාක්‍රමයාණන්වහන්සේ මා අති තික්තකමට පැමිණෙවුසේක.[21] මම සම්පූර්ණව පිටත්ව ගියෙමි, ස්වාමීන්වහන්සේ මා සිස්කොට නැවත ගෙනාසේක …"**

## 3. <u>ඕර්පා ගත්තාවූ තීරණය - රූත් 1:14</u>

**රූත් 1:14 :- " ඔව්හු ශබ්දනගා නැවත ඇඬුවෝය. ඕර්පා ඇගේ නැන්දා සිඹ යන්ට ගියාය …."**

නායොමිගේ එක ලේලියක් වූ ඕර්පා, නායොමි සමඟ බෙත්ලෙහෙමට හැරී ඒමේ තීරණයට ඉතා ලංව සිටියාය. **රූත් 1** හි සඳහන් වන්නේ ඕර්පා නායොමිගෙන් වෙන්වීමට අකමැතිව දෙවතාවක්ම ශබ්දනඟා හැඬූ බවයි.
(කරුණාකර **රූත් 1:9,10,14** කියවා බලන්න)

ඕර්පා ගත්තාවූ තීරණය වූයේ, ඇයගේ දේශයේ එනම් මොවබ් දේශයේ රැඳී සිටින්ටයි.

**ඕර්පා නායොමි සමඟ ඉශ්‍රායෙල් දේශයට යෑමට කැමැත්තක් දැක්වූ නමුත්, එසේ කිරීමට තීරණය කිරීමට ඇයට ආත්ම ශක්තිය නොතිබුණේය.** එබැවින් ඈ හඬා, වැලපී හැරී යන්ට ගියාය. ඇයගේ තීරණයේ ප්‍රතිඵලයක් වන්නේ, ඇයගේ නම **රූත් 1** න් පසු, දේව වචනයෙන් අතුරුදහන් වීමයි.

**දෙවියන්වහන්සේගේ ආශිර්වාදවලට ඇතුල්වීමට ඈ අපොහොසත්වීමයි.**

ඇයගේ ක්‍රියාකිරීමේ බොහෝ හොඳ අප දකින අතර, එක අඩුවක්, එක වරදක් තිබුණි.

දේව කැඳවීමට, දේව ආශිර්වාදවලට ඇතුල්වීම උදෙසා ඇයට සමහර කැපවීම් කිරීමට තිබුණි. ඇයගේ රටෙන්, නෑදෑයන්ගෙන් ඇය නමස්කාර කළ අන් දෙවිවරුන්ගෙන් ඈත්වීමට ඇයට සිදුවුණි.

**මේ කැපවීම් කිරීමට ඕර්පා සූදානම්ව නොසිටියාය.**

❖ **මතෙව් 19:16-22** හි සඳහන් වන්නාවූ **'පොහොසත් යෞවනයා'** සහ යේසුස්වහන්සේ අතර ඇතිවූ සාකච්ඡාව දෙස මොහොතකට බලමු. අප මෙහි දකින්නේ, සදාකාල ජීවනය ලබන්ට ආශා කළාවූ, බාල වයසේ පටන්ම දේව ආඥා පැවැත්වූවාවූ, හොඳ ජීවිතයක් ගතකළාවූ තරුණයෙකි.

මෙනමුත් ඔහුගේ ජීවිතයේ එක අඩුකමක් තිබුණි. එනම් තමා සතු වස්තු කෙරෙහි ඔහු තුළ තිබුනාවූ ආශාවයි. **එම වස්තු කැප කිරීමට ඔහු සූදානම්ව සිටියේ නැත.**

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, **දෙවියන්වහන්සේගේ මුලු කැමැත්තට ඇතුල්වන්ට ඔබ කැමතිද ? එසේ කිරීම උදෙසා ඔබගේ කැමැත්ත උන්වහන්සේගේ කැමැත්තට යටත්කිරීම අනිවාර්‍යය වේ.**

දෙවියන්වහන්සේගේ ආශිර්වාද ලැබීමට, උන්වහන්සේගේ නාමයෙන් බලවත් දේ කිරීමට බොහෝ කිතුනුවෝ ආශාකරන අතර, එය උදෙසා, නොයෙක් දේ උන්වහන්සේට කැප කිරීමට සිදුවන අවස්ථා ඇතිවේ. මෙවැනි අවස්ථාවලදී, ඔර්පා මෙන් හෝ 'පොහොසත් යෞවනයා' මෙන් ක්‍රියා නොකිරීමට අප තීරණය කරමු. අපි දෙවියන්වහන්සේට සියල්ල යටත් කරමු.

උන්වහන්සේගේ කැඳවීමට කීකරුවෙමින්, උන්වහන්සේගේ කැමැත්ත අනුව උන්වහන්සේට සේවය කරමින්, උන්වහන්සේගේ ආශිර්වාදවලට ඇතුල්වෙමු.

## 4. රූත් ගත්තාවූ තීරණය - රූත් 1:16,17

රූත් ගත්තාවූ තීරණය වූයේ, නායොමිවත්, ඇයගේ සෙනඟවත් ඇයගේ දෙවියන්වහන්සේවත් කොන්දේසි විරහිතව වැළඳ ගැනීමටයි.

**රූත් 1:16,17 :- " [16].....මක්නිසාද නුඹ යන තැනට මමත් යමි; නුඹ නවතින තැන මමත් නවතිමි. නුඹේ සෙනඟ මාගේ සෙනඟ වන්නේය, නුඹේ දෙවියන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේ වනසේක. [17].....මරණය මිස වෙන කිසිවක් නුඹත් මාත් වෙන්කළොත්, ස්වාමීන්වහන්සේ එසේද ඊට වැඩියෙන්ද මට කරනසේක්වයි කීවාය."**

ඔර්පා මෝවබ් දේශයේ නතරවීමට තීරණය කිරීම හේතුකොටගෙන නායොමිගේ අනිත් ලේලිය වූ රූත් ඉදිරියේ තිබුණේ, නායොමි ඉදිරියේ තිබුනාවූ තීරණය මෙන්ම (නැතහොත් ඊටත් වඩා) දුෂ්කර තීරණයකි.

එම අවස්ථාවේදී රූත් විසින් නායොමිට පවසන ලද ඉහත සඳහන් වචන බොහෝ කිතුනුවෝ දනිති. මාගේ සෙනෙහෙවන්ත සහෝදර සහෝදරියනි, කිතුනු නම දරන බොහෝ දෙනා, තමා අයිති සභාවේ නමස්කාරයට සහභාගී වන නුමුත්, රූත් කළා මෙන් **දෙවියන්වහන්සේ කෙරෙහි මුලු විශ්වාසය තබමින්, තමාගේ අනාගතය උන්වහන්සේගේ හස්තයට භාරදීමට** මැලි වන බව නොරහසකි. කරුණාකර එම තත්ත්වයට නොවැටීමට අධිෂ්ඨාන කරගන්න. උන්වහන්සේට ඔබගේ ජීවිතයද, අනාගතයද භාරදෙන්න.

රුත් තුළ දෙවියන්වහන්සේට කීකරුවීමට සහ ලංවීමට දැඩි අධිෂ්ඨානයක්/කැපවීමක් තිබුණු අතර, ඒ ආකාරයෙන් ක්‍රියා කළාවූ චරිත තුනක් වෙත ඔබගේ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි.

(i) <u>**දානියෙල් අනාගතවක්තෘ**</u>

**දානියෙල් 1:8 :- " එහෙත් දානියෙල් රජුගේ භෝජනයෙන්වත් ඔහු බොන මුද්‍රිකපානයෙන්වත් අපවිත්‍ර නොවී සිටීමට තමාගේ සිතින් නියමකරගෙන, එසේ අපවිත්‍ර නොවී සිටින්ට නපුංසකයන්ගේ අධිපතියාගෙන් අවසර ඉල්ලුවේය."**

අප මෙහි දකින්නේ දානියෙල් දෙවියන්වහන්සේ කෙරෙහි තැබුවාවූ අචල විශ්වාසය නොහොත් තිර ඇදහිල්ල සහ උන්වහන්සේ අප්‍රසන්න වූ දේ නොකර සිටීමට ඔහු තුළ තිබුණාවූ අධිෂ්ඨානයයි.

(ii) <u>**එස්රා**</u>

**එස්රා 7:10 :- " එස්රා ස්වාමීන්වහන්සේගේ ව්‍යවස්ථාව සොයන්ටත් පවත්වන්ටත් ඉශ්‍රායෙල්හි පනත්ද විනිශ්වයයන්ද උගන්වන්ටත් තමාගේ සිත යොමුකර ගත්තේය."**

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව නිසිලෙස අධ්‍යයනය කරමින් ඉගෙනගන්ටත්, පවත්වන්ටත්, උගන්වන්ටත් එස්රා තුළ තිබුණාවූ අධිෂ්ඨානය අප මෙහි දකිමු.

දේව දරුවෙනි, අප සැමද දේව වචනය අධ්‍යයනය කිරීමටත්, එයට කීකරුවීමටත්, දෙවියන්වහන්සේ අපට අවස්ථාව ලබාදුන් විට එය ඉගැන්වීමටත් අධිෂ්ඨානය කරගනිමු.

(iii) <u>**එස්තර් බිසව**</u>

**එස්තර් 4:16 :- "....මමත් මාගේ වැඩකාරියොත් එසේම නිරාහාරව ඉන්නෙමුව ; එවිට නීතියට එකඟ නැති නමුත් මම රජු ළඟට යන්නෙමි. මා නැතිවුණොත් නැතිවුණාවේ කියා කියන්ට කීවාය."**

තමාගේ ජීවිතය පරදුවට තබමින්, නීති විරෝධීලෙස රජතුමා ඉදිරියට යෑමට, එස්තර් තීරණය කරන්නේ, දෙවියන් - වහන්සේට සහ උන්වහන්සේගේ සෙනඟ කෙරෙහි ඈ තුළ තිබුණාවූ කැපවීම නිසයි.

දේව දරුව, **නිවැරදි දේ කිරීමට දැඩි අධිෂ්ඨානය, ඔබගේ ගුණාංගයක් කරගන්න. එසේ කිරීම උදෙසා අවශ්‍යවන්නාවූ සෑම කැපවීමක් කිරීමට පසුබට නොවන්න.**

**පිලිප්පි 3:13,14 :- "[13].... නුමුත් එකක් කරමි, එනම්, පස්සෙන් තිබෙන දේ මතකනැතිකොට, ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගෙන යමින්, [14] ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්-වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම පිණිස දිනුම්පළ කරා දුවමි."**

හතර දෙනෙක් ගත්තාවූ තීරණ හතරක් අධ්‍යයන කළ ඔබ, ඔබගේ ජීවිතයේ ගන්නාවූ තීරණ නායොමි සහ රූත් අනුගමනය කරමින් ගන්නාවූ ඒවා කරගැනීම, ඉතා ආදරයෙන් අප ඔබට දෙන්නාවූ උපදෙසයි.

**එසේ කිරීමට**

**දෙවියන්වහන්සේ ඔබට අවශ්‍යවන්නාවූ**

**මඟපෙන්වීම සහ ශක්තිය**

**දෙනසේක්වා !!!**

# සටහන්

# සටහන්

# යටහතුන්ට දෙවියන්වහන්සේ සපයනසේක



# රූත්ගේ කථාව - 03

# යටහතුන්ට දෙවියන්වහන්සේ සපයනසේක

## රූත් 2:1-3

**හැඳින්වීම :-**

පසුගිය අධ්‍යයනයෙහිදී, තම ජීවිත ගමන සම්පූර්ණයෙන්ම වෙනස් කළාවූ තීරණ හතරක් දෙස අප බැලුවෙමු. දේව දරුවෙනි, ඔබ ගන්නාවූ තීරණ ද ඔබගේ ජීවිතය කෙරෙහි පමණක් නොව, ඔබගේ මුලු පවුලේ, සභාවේ සහ ඔබට සමීප වෙනත් අයගේ ජීවිත කෙරෙහි දැඩි ලෙස බලපා, ඔවුන්ගේ ජීවිත සම්පූර්ණයෙන්ම වෙනස් කළ හැකි බව වටහාගන්න.

අප පසුගිය අධ්‍යයනයෙහිදී, එලිමෙලෙක්, නායොමි, ඕර්පා සහ රූත් ගත්තාවූ තීරණ හතර දෙස බැලූ අතර, ඔවුන් සැමකෙනෙක්ම ගත්තාවූ තීරණයක්ම, ඉතිරි තිදෙනාගේ ජීවිතවලට තදින් බලපෑවේය.

**නිදසුනක් වශයෙන්**

එලිමෙලෙක් ගත්තාවූ තීරණය, ප්‍රථමයෙන්ම අධික ලෙස බලපෑවේ, ඔහුගේ බිරිඳට සහ පුතුන් දෙදෙනාට වූ අතර, ඔහුගේ පවුල මෝවබ් දේශයට පැමිණීම හේතුකොටගෙන, ඕර්පාගේ සහ රූත්ගේ ජීවිතවලත් ඔවුන්ගේ පවුල්වලටත් මහත් වෙනසක් ඇතිකළ බව නිසැකවේ.

එයට අමතරව ඔහුගේ මුලු පවුල සමඟ තම රටින් පිටත්වීමට ඔහු ගත්තාවූ තීරණය, ඔහුව දැන හැඳින සිටියාවූ වෙනත් ඉශ්‍රායෙල් ජාතිකයන් තුළද, එම ආදර්ශය අනුගමනය කිරීමේ පරීක්ෂාව, සතුරා අනිවාර්‍යයයෙන්ම ගෙනෙන්නට ඇත. **දේව දරුව, ඔබ ගන්නාවූ තීරණ අන් අය කෙරෙහි බලපාන අන්දම ගැන සැලකිලිමත් වන්න.**

මෙම අධ්‍යයනයේදී, අප මූලික ලෙස ඉගැන්වීමට යන්නේ **රූත් 2:1-3** වන අතර, ඊට අමතරව **රූත් 1:16-22** දක්වා කොටසෙහි අප දකින්නාවූ, රූත්ගේ කැපවීම, නායොමිගේ පසුතැවිල්ල සහ යටහත්කම සමඟම දෙවියන්වහන්සේ ඔවුන් දෙදෙනා පිළිගත් ආකාරය දෙසද අප ඔබගේ අවධානය යොමුකරන්නෙමු.

**<u>අධ්‍යයනය</u> :-**

**1. <u>රූත්ගේ කැපවීම - රූත් 1:16,17</u>**

**රූත් 1:16,17 :-**

**" [16] <u>නුඹ අත්හැර හැරීයන ලෙස මට පෙරැත්ත නොකරන්න</u>. මක්නිසාද නුඹ යන තැනට මමත් යමි ; නුඹ නවතින තැන මමත් නවතිමි. <u>නුඹේ සෙනඟ මාගේ සෙනඟ වන්නේය, නුඹේ දෙවියන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේ වනසේක</u>.**
**[17] නුඹ නසින තැන මමත් නැසී, එතැනම තැන්පත් කරනු ලබන්නෙමි....."**

රූත් මෙහි ප්‍රකාශ කරන්නාවූ වචනවලින් අප දකින්නේ, නායොමිගෙන් සහ ඇ අදහන්නාවූ දෙවියන්වහන්සේගෙන් ඈත් නොවීමට රූත් තුළ තිබුණාවූ නොසැලෙන අධිෂ්ඨානයයි. ඇයගේ වචනවලින් අපට උගත හැකි දේ දෙස බලමු.

(i) **"නුඹ අත්හැර හැරීයන ලෙස මට පෙරැත්ත නොකරන්න."**

තමාගේ රට අතහැරදා, තමා නොදන්නාවූ රටකට, තමා නොදන්නාවූ සෙනඟක් සමඟ ජීවත්වීමට යෑමේ තීරණය පහසු තීරණයක් නොවේ.

තරුණ වයසේ වැන්දඹුවක් බවට පත්ව සිටි රූත්ට, තම රටේ තව විවාහයකට ඇතුල්වීමට හැකිව තිබුණු අතර, ඉශ්‍රායෙල් දේශයේදී ඈ සමඟ විවාහවීමට සුදුසුවූද එසේ කිරීමට කැමතිවූද කෙනෙක් සොයාගැනීම ඉතා අසීරු වූ බවද ඈ දැන සිටියාය. මෙනමුත් ඇයගේ තීරණය වූයේ නායොමි ගෙන් වෙන් නොවී සිටීමටයි.

එබැවින් නායොමි **'නුඹේ නෑනා පස්සේ හැරී පලයන්න' (රූත් 1:15**) කියා රූත්ගෙන් කරන ඉල්ලීම, තමාගේ නිවැරදි තීරණය වෙනස්කිරීම උදෙසා පැමිණි **'පරීක්ෂාවක්'** ලෙස රූත් හඳුනාගෙන, ඇය නායොමිගෙන් ඉල්ලා සිටින්නේ -

**'නුඹ අතහැර යාමට පෙරැත්ත කරමින් මා පරීක්ෂා නොකරන්න.'**

යන ඉල්ලීමයි.

මාගේ ප්‍රිය සහෝදර සහෝදරියෙනි, සමහරවිට ඔබගේම දෙමාපියන්, සහෝදර සහෝදරියන්, හිත මිතුරන් විදේශ රටක් බොහෝසේ වර්ණනා කරමින්, එහි යෑමට ඔබට පෙරැත්ත කිරීමට පුළුවන. එවැනි අවස්ථාවක් ඇතිවුවහොත් අපගේ ප්‍රතිචාරය විය යුත්තේ, **'එහි යෑමට මට පෙරැත්ත නොකරන්න, දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම නොමැතිව මම එසේ යෑමට අදහස් නොකරමි'** වැනි පිළිතුරකි.

සමහරවිට ඔබව පොළඹවනු ලබන්නේ, දේව දරුවෙක් නොයායුතු, පාප ක්‍රියාවලින් පිරුණාවූ ස්ථානයකට යෑමට වියහැක. කවුරුන් තුළින් එම පරීක්ෂාව ඔබ වෙත ආවත්, එයට අසුනොවී සිටීමට වගබලා ගන්නා ලෙස ඉතා ආදරයෙන් ඔබෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමි.

(ii) **" නුඹේ සෙනඟ මාගේ සෙනඟ වන්නේය."**

මෙම වචන තුළින් රූත් පැහැදිලිව ප්‍රකාශකරන්නේ, ඇ නායෝමි සමඟ නායොමිගේ රටට යෑම සමඟ ඇ ඉශ්‍රායෙල් ජාතිය තමාගේ ජාතිය ලෙස භාරගන්නා බවයි. එසේ කිරීම සමඟ ඇ ඉශ්‍රායෙල් ජාතිකයෙකු ලෙස ක්‍රියා කිරීමට කැපවෙන බවයි.

මාගේ ප්‍රිය සහෝදර සහෝදරියෙනි, ඔබ දෙවියන්-වහන්සේට ඔබගේ ජීවිතය කැපකළ කෙනෙක් බව මම විශ්වාස කරමි. මෙසේ දේව දරුකමට ඇතුල්වී තිබෙන ඔබ, ඒ සමඟ **'දෙවියන්වහන්සේගේ සෙනඟට එනම් දෙවියන්වහන්සේගේ පවුලට'** ඇතුල්වී තිබේ. එබැවින් අප සැම, එකම පියාණන්වහන්සේගේ දරුවෝත්, එකම පවුලේ සහෝදර සහෝදරියෝත් වන්නෙමු.

මේ අනුව 'කිතුනු සභාවට' අයිති වන්නාවූ අප සැම කෙනෙක්ම, සභාවට අයිති වෙන කෙනෙකුට වඩා 'උතුම්' යයි සිතීම වැරදි වේ.

**පිලිප්පි 2:3 :- " පක්ෂවාදිකමෙන්වත් නිෂ්ඵල පාරට්ටුකාර-කමෙන්වත් කිසි දෙයක් නොකොට, <u>එකිනෙකා තම තමාට වඩා වෙන කෙනෙක් උතුමැයි යටහත්කමින් සිතාවා</u>."**

සභාව තුළ තරාතිරම් බැලීම වැරදි වේ.

**යාකොබ් 2:9 :-"නුමුත් <u>තරාතිරම් සලකන්නෝ නම්</u>, නුඹලා වරදකාරයන් බව ව්‍යවස්ථාවෙන් ඔප්පුවෙන බැවින් <u>නුඹලා කරන්නේ පාපයය</u>."**

සභාව තුළ අන් අය අපට වඩා උතුම් ලෙස සලකමින්, සහෝදර ප්‍රේමයෙන් එකිනෙකාට බැඳී සිටීම දේව කැමැත්ත වේ.

**රෝම 12:10 :- "<u>සහෝදර ප්‍රේමයෙන් එකිනෙකාට ස්නේහවෙයල්ලා</u> ; ගෞරවයෙන් තම තමාට වඩා අනික් අය උතුම් කොට සලකාපල්ලා ;"**

දේව දරුවෙනි, දෙවියන්වහන්සේගේ පවුලට අයිති වන්නාවූ අප සැම, එම <u>පවුලට අයිතිවූවන්ට ඔබින ලෙස ක්‍රියාකරමු</u>.

(iii)**"නුඹේ දෙවියන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේ වනසේක."**

මෙම වචන වලින් රූත් ප්‍රකාශකරන්නේ, ඇයගේ ජීවිතාන්තය දක්වා, ඈ **'ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේට'** ඇයගේ ජීවිතය කැපකරන බවයි.

මාගේ ප්‍රිය සහෝදර සහෝදරියෙනි, කිතුනු නම දරන්නාවූ ඔබ සැම දෙවි සමිඳුන්ට ඔබගේ ජීවිතය දැනටමත් කැපකර ඇතැයි සිතමි. නමුත් යම්කිසි හේතුවක් නිසා ඔබ තවම එසේ කර නොමැතිනම්, මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ නොපමාව එසේ කරන ලෙසයි.

**<u>වැදගත් සටහනක්</u>**

වර්තමාන සමාජයේ අපට නිතර අසන්ට ලැබෙන දෙයක් වන්නේ, **'නැන්දම්මා සහ ලේලිලා'** අතර ඇතිවන අසමගිය සහ විවිධ ගැටළු ගැනයි.

මෙනමුත් රූත්ගේ ජීවිතයේ අප දකින්නේ, ඇයගේ නැන්දම්මා වූ නායොමි කෙරෙහි ඈ දක්වන්නාවූ අති විශාල ප්‍රේමය සහ බැඳීමයි.

මේ අන්දමින් රූත් නායොමි කෙරෙහි ඇලුම් වූයේ, ඇදී ගියේ, '**නායොමිගේ ජීවිත සාක්ෂිය**' වූ බව නිසැකවේ. සියල්ල අහිමිවූ නායොමි තුළ තිබුණාවූ, **ඇදහිල්ල, යටහත්කම, ඉවසීම, පසුතැවිල්ල** නිසැකවම රූත්ගේ හදවතට කථා කරන්ට ඇත.

ප්‍රිය සොයුර සොයුරිය, මොහොතක් මෙය ගැන සිතා බලන්න. ඔබගේ හදවතට වැඩියෙන් කථාකරන්නේ, මනුෂ්‍යයෙකු ප්‍රකාශ කරන්නාවූ වචනද, නැතහොත් ඔහුගේ ජීවිතයේ **ආදර්ශය සහ සාක්ෂියද ?**

මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියෙනි, ඔබගේ ජීවිත ආදර්ශය/සාක්ෂිය, මනුෂ්‍යයන්ව දෙවියන්වහන්සේ වෙත ඇදගන්නවාද නැතහොත් උන්වහන්සේගෙන් ඈත්කරනවාද ?

**අන් අයව දෙවියන්වහන්සේ වෙත ආකර්ශනය කරන්නාවූ ජීවිත ගතකිරීමට අප අදිටන් කරගනිමු.**

**මතෙව් 5:16 :- " එසේම <u>මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක</u>, ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා."**

## 2. <u>නායොමිගේ යටහත්කම සහ පසුතැවිල්ල - රූත් 1:20,21</u>

**රූත් 1 : 20,21 :- " [20] ඈද : මට නායොමියයි නොකියා මාරායයි කියාපල්ලා. මක්නිසාද සර්වපරාක්‍රමයාණන්-වහන්සේ මා අති තික්තකමට පැමිණෙවුසේක. [21] මම සම්පූර්ණව පිටත්ව ගියෙමි, ස්වාමීන්වහන්සේ මා සිස්කොට නැවත ගෙනාසේක......"**

නායොමි යන නමේ අර්ථය වන්නේ, ප්‍රසන්න නොහොත් මිහිරි යන්නයි.

බෙත්ලෙහෙම වෙත හැරී ආවාවූ නායොමි, එහි ස්ත්‍රීන්ට කියන්නේ, '**මට මිහිරි කියා අමතන්න එපා, මාරා (තික්ත) කියා අමතන්න**' කියායි.

මෙසේ කියන ඇ වැඩිදුරටත් ප්‍රකාශ කරන්නේ, **'සර්වපරාක්‍රමයාණන්වහන්සේ'** ඇයගේ ජීවිතය තික්තවීමට ක්‍රියාකළ බැවින්, නායොමි යන නම දරන්ට ඇ නුසුදුසු වන බවයි.

නායොමි ප්‍රකාශකරන්නාවූ දේ නිවැරදිව අවබෝධ කරගැනීම උදෙසා, **'සර්වපරාක්‍රමයාණන්වහන්සේ'** යන වචනයෙහි අර්ථය දෙස බලමු.

## 'සර්වපරාක්‍රමයාණන්වහන්සේ 'යන්නෙහි අර්ථය

මෙසේ පරිවර්තනය කර ඇති වචනය හෙබ්‍රෙව් බසින් සඳහන් වන්නේ EL SHADDAI ලෙස වන අතර, මෙය ඉංග්‍රීසි බයිබලයේ බොහෝවිට පරිවර්තනය කර ඇත්තේ ALMIGHTY (God) ලෙසයි.

පරණ ගිවිසුමේ මෙම හෙබ්‍රෙව් වචනය හතළිස් වතාවක් පමණ සඳහන් වන අතර, එය යෝබ් පොතේ තිස් වතාවකට වැඩියෙන් සඳහන් වේ.

SHADDAI යන වචනය ස්ත්‍රියකගේ පියයුරු වලට යොදන SHAD යන වචනයෙන් එන්නකි. එබැවින් එම වචනය තුළ, **පෝෂණය කිරීම, සැපයීම, ආරක්ෂා කිරීම සහ සෑහීමට පත්කිරීම** යන අරුත අන්තර්ගත වී තිබේ. මෙම වචනය EL සමඟ සම්බන්ධ කිරීමෙන්, EL SHADDAI සෑදී තිබෙන අතර, එහි අරුත **අධික ලෙස තම සෙනඟ පෝෂණය කරන්නාවූ, ඔවුන්ට සපයා ඔවුන් ආරක්ෂාකරමින් ඔවුන්ව සෑහීමට පත්කරන්නාවූ සියලු බල ඇති (දෙවියන්වහන්සේ)** ලෙස විස්තර කළ හැකි වේ.

- එබැවින් නායොමි ඉහත සඳහන් වචන වලින් බෙත්ලෙහෙමේ ස්ත්‍රීන්ට ප්‍රකාශ කරන්නේ දෙවියන්වහන්සේට විරුද්ධව චෝදනාවක් නොව, දෙවියන්වහන්සේගේ ක්‍රියාකිරීම සමඟ එකඟවීමකි. ඇයගේ පවුල සමඟ තම දේශයෙන් පිටත්ව යෑමේ වරද පිළිගැනීමකි.

ඇත්ත වශයෙන්ම එසේ යෑම ගැන නායොමි පසුතැවිලි වූයේ මෝවබ් දේශයේදී බව නිසැක වේ. ඈ එහිදී පසුතැවිලිවී දෙවියන්වහන්සේගේ සමාව අයැද, එය ලබා, තම වරද නිවැරදි කිරීම පිණිස බෙත්ලෙහෙම වෙත පැමිණියාය.

එබැවින් **රූත් 1:20,21** හි අප දකින්නේ, නායොමි තම සෙනඟ ඉදිරියේ ඇයගේ වරද පිළිගැනීමයි. මෙසේ කිරීම උදෙසා **යටහත්කම පැළඳගැනීම** අනිවාර්‍යය වේ.

මාගේ ප්‍රිය සහෝදර සහෝදරියෙනි, අප සැමගේ ජීවිතවලද, දෙවියන්වහන්සේගේ කැමැත්ත නොසොයා අප ක්‍රියාකරන අවස්ථා ඇතිවිය හැක. එවැනි අවස්ථාවන්හිදී අපට ප්‍රේමකරන්නාවූ දෙවියන්වහන්සේට අපව නිවැරදි මාර්ගය කරා ගෙන යෑම පිණිස අපගේ ජීවිතවල ක්‍රියාකළ හැක. මෙය තේරුම්ගත් විගස අප විසින් කළ යුත්තේ, අපගේ වරද පිළිගෙන, උන්වහන්සේගේ සමාව ලබා ගැනීමයි.

බොහෝ කිතුනුවන් මෙසේ කිරීමට පසුබට නොවන නමුත්, ඔවුන් තුළ ඇති පුහු ආඩම්බරකම නිසා අන් මනුෂ්‍යයන් ඉදිරියේ තම වැරදි නොපිළිගැනීමට පෙළඹෙති. මෙහි අවාසනාවන්ත ප්‍රතිඵලය වන්නේ, දෙවියන්වහන්සේට අපව නිසිලෙස පාවිච්චි කිරීමට නොහැකිවීමයි.

**අප සැම නායොමි මෙන්, යටහත්කමින් අපගේ වැරදි තීරණ, කථා සහ ක්‍රියා ගැන පසුතැවිලිවී දෙවියන්වහන්සේගේ සමාව ලබාගනිමු.**

**මනුෂ්‍යයන් ඉදිරියේද සැමවිටම යටහත්කමින් සහ අවංකකමින් ක්‍රියාකරමු.**

(කරුණාකර දාවිත් රජතුමාගේ යටහත්කම සහ පසුතැවිල්ල තේරුම්ගැනීමට **ගීතාවලිය 51:1-12, 22:6** කියවන්න)

තවද පාවුල්තුමාගේ යටහත්කම තේරුම් ගැනීම උදෙසා **1 කොරි 15:9, එපීස 3:8, 1 තිමෝති 1:15** කියවන්න.

## 3. දෙවියන්වහන්සේ නායොමිව සහ රූත්ව පිළිගත් ආකාරය - රූත් 1:19,22

(i) **රූත් 1:19 :-**

**"..... තවද ඔවුන් බෙත්ලෙහෙමට පැමුණුණු කල මුළු නුවර ඔවුන් ගැන කැලඹී ....."**

තම පුරවැසියන් සමඟ එකට සිටීම ප්‍රතික්ෂේප කරමින්, තම රට හැරදා ගොස්, වසර දහයකට පමණ පසුව ආපසු තම රටට මෝවබ් ලේලි කෙනෙක් සමඟ හැරී ආ නායොමි, නිසැකවම ආවේ චකිතයෙන් සහ ලජ්ජාවෙනි. මෙසේ පැමිණි ඈ බලාපොරොත්තුව සිටින්ට ඇත්තේ, නින්දා, අපහස, විවේචන, බැනවැදීම් වෙන්ට ඇත. කොන්කරනු ලැබීමක් නැතහොත් ප්‍රතික්ෂේප කිරීමක් ලැබේයයි ඈ සිතන්ට ඇත.

මෙනමුත් පසුතැවිලිවන්නන් ආදරයෙන් පිළිගන්නාවූ දෙවියන්වහන්සේ ඈව පිළිගැනීමට **'මුළු නුවර'** එකතු කළසේක.

**ලූක් 15:7 :-**

**"......පශ්චාත්තාපවන්නාවූ එක පව්කාරයෙකු ගැන ස්වර්ගයෙහි ප්‍රීතිය වන්නේයයි නුඹලාට කියමි."**

(ii) **රූත් 1:22 :-**

**"මෙසේ නායොමිද ..... රූත්ද හැරී ආවෝය. යව කපන කාලය පටන්ගැන්මේදී ඔව්හු බෙත්ලෙහෙමට පැමුණු - ණෝය."**

නායොමි බෙත්ලෙහෙම වෙත හැරී ආවේ, **'යව කපන කාලයට'** එහි පැමිණෙන්ට සැලසුම් කරගෙන නොවේ. මෙනමුත් **'සියල්ලන්ම පසුතැවිලිවනවාට'** ආශා කරන්නාවූ අපගේ දෙවිපියාණන්වහන්සේ, අස්වැන්න කාලයේ ඔවුන්ගේ හැරීඒම සිදුවන්ට නියමකළසේක.

උන්වහන්සේගේ කැමැත්ත අනුව, පසුතැවිල්ලෙන් පැමිණි නායොමිට, අනර්ඝ පිළිගැනීමක් ලබාදීමට, දෙවියන් - වහන්සේ **මුළු නුවරද සොබාදහමද** තුළින් ක්‍රියාකළ සේක.

මාගේ ප්‍රිය සහෝදර සහෝදරියෙනි, සමහරවිට මෙය කියවන ඔබ, යම්කිසි හේතුවක් නිසා දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් ඈත්ව ජීවත්වනවා වෙන්ට පුළුවන. ඔබ උන්වහන්සේ වෙත හැරී ඒමට ආසා කරන නමුත්, උන්වහන්සේ ඔබව පිළිගනියිද ? යන්න ගැන ඔබ තුළ සැක ඇතිකිරීමට යක්ෂයා සමත්ව සිටිනවා වෙන්ට පුළුවන.

දේව දරුව, බය නොවන්න. පසුතැවිල්ලෙන් දෙවියන් - වහන්සේ වෙත අදම හැරී එන්න. **උන්වහන්සේ ඉතා ආදරයෙන් ඔබව නිසැකවම පිළිගන්නවා ඇත.**

## 4. <u>යටහතුන්ට දෙවියන්වහන්සේ සපයන සේක - රූත් 2:1-3</u>

### (i) **ගෝයෙල්** (මිදීම සිදුකරන ළඟ නෑයාගේ) **නීතිය**

**'රූත්ගේ කථාව'** පොතේ, පළමුවෙනි අධ්‍යයනයේදී දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතියට දුන්නාවූ **'ගෝයෙල් නීතිය'** අප සඳහන් කළ බව ඔබට මතක ඇත.

මෙම නීතිය අනුව,

- පවුලකට අහිමි වූ ඉඩමක්,
- පවුලකට වහලෙක් ලෙස විකිණීමට සිදුවූ කෙනෙක්,
- උරුමක්කාරයෙක් නොමැති පවුලක්,

එම තත්ත්වයෙන් මුදවාගැනීම උදෙසා ක්‍රියාකිරීමට, එම පවුලේ **ළඟම නෑයාට** අයිතිය පවරා තිබුණි.

එබැවින් අන්ත අසරණ තත්ත්වයට වැටී වැන්දඹුවක් සේ බෙත්ලෙහෙමට නැවත පැමිණි නායෝමි සහ ඇයගේ පවුල එම තත්ත්වයෙන් මුදවාගැනීමට අයිතියක් ගෝයෙල් නීතිය හේතුකොටගෙන, එම පවුලේ ළඟම නෑයෙකුට තිබුණි. **රූත් 2:1** හි අප දකින්නේ, ධනවත් නෑයෙක් එලිමෙලෙක්ව සිටි බවයි.

**රූත් 2:1 :- "නායොමිගේ පුරුෂයා වන එලීමෙලෙක්ගේ පෙළපතට අයිතිවූ, මහත් වස්තුකාරයෙක්වූ බෝවස් නම් නෑයෙක් ඈට සිටියේය."**

එබැවින්, තමාට හිමිව තිබුණාවූ බොහෝ දේ නැතිවූ නායොමිව, එම තත්ත්වයෙන් මුදවාගැනීමට ගෝයෙල් නීතිය යටතේ බෝවස්ට අයිතියක් තිබුණි.

(ii) **අසරණ වූවන්ට සැපයීම උදෙසා දේව නීති**

දේව වචනය තුළ අප දකින්නේ, අපගේ පියවූ දෙවියන්වහන්සේ මහත් දයානුකම්පාවෙන් අසරණවූවන්ට සපයන්නාවූ සනසන්නාවූ දෙවි කෙනෙක් වන බවයි. එබැවින්, නැතිබැරි අයට, වැන්දඹුවන්ට සහ දිළිඳුන්ට සැපයීම උදෙසා, ඉතා වැදගත්වන්නාවූ නීති, උන්වහන්සේ විසින් මෝසෙස්ට දෙන ලද ව්‍යවස්ථාවේ සඳහන් වේ.

**ලෙවී කථාව 19 : 9,10 :-**

**" [9] නුඹලාගේ දේශයේ ගොයම් කපන කල නුඹේ කෙතේ මුලු තීන්දුවට කපා නොගනින්න, කපන විට වැටෙන කරල් එකතුකර නොගනින්න.**

**[10] නුඹේ මිදිවත්තේ දෙවරක් වලු කපානොගනින්න. නුඹේ මිදිවත්තේ වැටී තිබෙන ඵල එකතු නොකරන්න. දිළින්දාට විදේශියාටද ඒවා අත්ඇරපන්න. මම නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේය."**

**ද්විතීය කථාව 24 : 19 :-**

**"නුඹේ කෙතෙහි ගොයම් කපන කල්හි කෙතේ ගොයම් මිටියක් මතකනැති වුණොත් ඒක ගෙනෙන්ට ආපසු නොයන්න. නුඹේ අතේ ඇති සියලු වැඩපලවලදී නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ නුඹට ආශිර්වාදකරන පිණිස ඒක විදේශියාටද පියා නැත්තාටද වැන්දඹුවටද වන්නේය."**

ඉහත සඳහන් පද වලින් අපට පෙනී යන්නේ, සමාජයේ අසරණවූ කණ්ඩායම් හතරකට සැපයීම උදෙසා දෙවියන් - වහන්සේ මෙම නීති ස්ථාපනය කළ බවයි.

එම කණ්ඩායම් හතර නම්,

**දිළින්දන්**
**විදේශිකයන්**
**පියා නැත්තන්**
**වැන්දඹුවන්**

යන කණ්ඩායම් වන අතර **රූත් මෙම කණ්ඩායම් හතරටම අයිතිව සිටියාය.**

❖ මාගේ ප්‍රිය සහෝදර සහෝදරියනි, එදා දෙවියන් - වහන්සේගේ සෙනඟ අතර කිසි කෙනෙක්, තම අසරණකම නිසා ආහාර නොමැතිව සිටීම, දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවූ බව ව්‍යවස්ථාව තුළින් අප දකිමු. උන්වහන්සේ නොවෙනස්වන්නාවූ දෙවියන්වහන්සේ වන සේක. එබැවින් අද, දේව සභාව තුළ කිසි කෙනෙක් තමාට අවශ්‍ය ආහාර ලබා ගත නොහැකි තත්ත්වයක සිටීම (සාමාන්‍යයෙන්) දේව කැමැත්ත නොවේ. එබැවින් ඔබ සැමට මාගේ අනුශාසනාව වන්නේ,

**ඔබට ආහාර නොමැතිනම්, දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න, ඔබට ආහාර බොහෝසේ තිබේනම්, හිඟ අයට දෙන්න,** කියායි.

(iii) **යටහතුන්ට සැපයීම උදෙසා දෙවියන්වහන්සේගේ ක්‍රියාකිරීම**

අප මීට ප්‍රථමයෙන් සඳහන් කළ ආකාරයට, නායොමි සහ රූත් පෙරලා බෙත්ලෙහෙමට පැමිණියේ, **'යව කපන කාලය පටන්ගැන්මේදීය', (රූත් 1:22)** එනම් ඔවුන් බෙත්ලෙහෙමට පැමිණියේ, **'කෙතේ වැටෙන කරල් එකතුකර ගැනීමට' (ලෙවී කථාව 19:9)** වඩාත්ම සුදුසු කාලයේදීය.

දේව දරුව, මොහොතක් සිතා බලන්න. මෙසේ සිදුවූයේ ඉබේමද? නැත්නම් දෙවියන්වහන්සේගේ දයාවන්ත ක්‍රියාකිරීම අනුවද?

මා නිසැකවම ප්‍රකාශ කරන්නේ මෙසේ සිදුවූයේ, දෙවියන්වහන්සේ වඩාත්ම සුදුසු කාලයට ඔවුන් දෙදෙනා බෙත්ලෙහෙමට ගෙන ඒමට ක්‍රියා කල බවයි.

❖ මාගේ ප්‍රිය සහෝදරියනි, ඔබ දේව කැමැත්ත අනුව ඇදහිල්ලෙන් යමක් ඉල්ලන විට, එය ලැබීමට ප්‍රමාද වන්නේ නම් නොසැලෙන්න. එය ප්‍රමාදවීමට ප්‍රධානතම හේතු දෙකක් ඔබ ඉදිරියේ තබමි.

(a) එම දෙය ඔබට ලබාදීම දේව කැමැත්ත වන නමුත්, එය ලබාදීමට වඩාත්ම සුදුසු/හොඳ කාලය තවම පැමිණ නොමැත.

(b) ඔබ ඉල්ලන්නාවූ දෙයට වඩා හොඳ දෙයක්, හොඳම වෙලාවට ඔබට ලබාදීමට දෙවියන්වහන්සේ ක්‍රියා කරමින් සිටිනසේක.

**එබැවින් ප්‍රමාදය ගැන කරදර නොවන්න. දෙවියන්වහන්සේ වඩාත්ම හොඳ දේ වඩාත්ම සුදුසු කාලයට ලබාදෙන බව අදහමින් උන්වහන්සේට තුති පුදන්න.**

(iv) **දෙවියන්වහන්සේගේ සැපයීම ලැබීම උදෙසා යටහත්කම සහ විශ්වාසවන්තකම වැදගත්වේ - රූත් 2:2,7**

**රූත් 2:2 :- "මෝවබිය රූත් නායොමිට කථාකොට : මම කෙතට ගොස් මට කරුණාව පෙන්වන කෙනෙකු පස්සේ යමින් කරල් ඇහිඳගෙන එන්නෙමියි කීවාය."**

රූත් නායොමිට මෝවබ් දේශයේදී ප්‍රකාශ කළ දෙයක් වූයේ, **'නුඹේ සෙනඟ මාගේ සෙනඟ වන්නේය, නුඹේ දෙවියන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේ වනසේක' (රූත් 1:16)** යන්නයි.

දැන් බෙත්ලෙහෙමේදී, ඇයට එම වචන අනුව ක්‍රියාකරමින්, (අප ඉතා පහත්ලෙස සලකන්නාවූ) හිඟන්නියක් මෙන් තමාගේ ආහාර සපයාගැනීම උදෙසා, **වැටුනු කරල් එකතුකර ගැනීමට සිදුවුණි. ඉතා යටහත් පහත් ලෙස ක්‍රියාකිරීමට තිබුණි**. අප **රූත් 2:2** හි දකින්නේ, රූත් ඉතා යටහත්ව තමා කළ පොරොන්දුව අනුව ක්‍රියා කිරීමයි.

**රූත් 2:7 :- "...... උදය පටන් මේ වන තුරු කරල් ඇහිඳිමින් සිටින්නීයයි කීවේය."**

**රූත් 2:7** හි අප දකින්නේ, වෙහෙස නොබලා, විශ්වාසවන්තව රූත් කරල් ඇහිදීමේ කාර්‍යයේ යෙදී සිටීමයි.

❖ මාගේ ප්‍රිය සහෝදර සහෝදරියෙනි, අපගේ ජීවිතවල ප්‍රශ්න ඇතිවූ විට, අප දෙවියන්වහන්සේට ඒවා ගැන කන්නලව් කරමින්, විවිධ පොරොන්දු සහ කැපවීම් කිරීම දුලබ නොවේ. මේ අතර එම පොරොන්දු සහ කැපවීම් අනුව විශ්වාසවන්තව ක්‍රියාකිරීමට අප අපොහොසත් වන අවස්ථාද දුලබ නොවන බව, ඔබ දන්නවා ඇත.

**දේව දරුවෙනි, මෙසේ ක්‍රියාකිරීමෙන් වැලකී සිටිමු. දෙවියන්වහන්සේට අප කරන්නාවූ පොරොන්දු සැමවිටම ඉටුකරමු.**

**රූත් මෙන්, ඉතා යටහත්කමින්ද විශ්වාසවන්තවද දෙවියන්-වහන්සේට/ අන් අයට අප කරන්නාවූ පොරොන්දු ඉටුකරමු.**

දේව දරුවෙනි, අප සැම දෙවියන්වහන්සේ විසින් තෝරාගත්තාවූ කැඳවාගත්තාවූ උන්වහන්සේගේ දරුවෝ වන්නෙමු. අප සැමවිටම විශ්වාසවන්තව ක්‍රියාකරමු.

**එළිදරව් 17:14 :-**

**"....උන්වහන්සේ ස්වාමිවරුන්ගේ ස්වාමීන්වහන්සේය, රජවරුන්ගේ රජ්ජුරුවෝය ; උන්වහන්සේ සමග සිටින්නෝද කැඳවාගත් තෝරාගත් විශ්වාස තැනැත්තෝයයි කීවේය."**

(v) **දෙවියන්වහන්සේ යටහතුන් කෙරෙහි තමන්වහන්සේගේ කරුණාව සහ මඟපෙන්වීම වගුරුවන සේක**

**රූත් 2:3 :-**

**"ඈ ගොස් කෙතට පැමිණ ගොයම් කපන්නන් පස්සේ කරල් ඇහින්දාය. වාසනාවට මෙන් ඈ එලීමෙලෙක්ගේ පෙළපතට අයිති බෝවස්ගේ කෙත් කොටසට පැමින්නාය."**

නුපුරුදු රටක නොදන්නා පිරිමින් සිටි ස්ථානයක ගැවසීම අනතුරුදායක විය හැකි බව රූත් දන සිටියාය. එනමුත් තරුණ කාන්තාවක් වූ රූත් වැටුණු කරල් ඇහිදීමට ඉදිරිපත් වූයේ ඈ ගැන නොව නායොමි ගැන සිතලයි.

රූත්, නායොමි මගින් බෝවස් ගැන අසා තිබෙන්ට ඇති නමුත්, ඔහු කවුද කියාවත් ඔහුගේ කෙත පිහිටි ස්ථානයවත් ඈ දන නොසිටියාය. නමුත් අපගේ දෙවියන්වහන්සේ බෝවස්ගේ කෙත වෙත ඇයව ගෙනගිය සේක. එතැනට ඇයව ගෙනගොස් ඇයව ආරක්ෂා කරමින් ඇයට සැපයූසේක.

**උන්වහන්සේ රූත්ට මඟපෙන්වමින්, ඇයව සුරක්ෂිතව තබා ගනිමින්, ඇයට සැපයූසේක.**

❖ මාගේ ප්‍රිය සහෝදර සහෝදරියෙනි, රූත් මෙන් පරිත්‍යාගශීලීව ක්‍රියාකරමින් අප, අප ගැන නොව අන් අය ගැන සලකමින්, යටහත්වද විශ්වාසවන්තවද ක්‍රියා කරමු. එවිට අපගේ ප්‍රේමණීය දෙවිපියාණන්වහන්සේ, උන්වහන්සේගේ අධික කරුණාව අප වෙත දක්වමින් අපට මඟපෙන්වන සේක. උන්වහන්සේ අපව ආරක්ෂා කරන සේක. උන්වහන්සේ අපට සපයන සේක.

අප සැමද, **'යටහතුන්ට සපයන්නාවූ දෙවියන්වහන්සේව' නිසිලෙස හඳුනාගෙන, යටහත් කමින් යුක්තව උන්වහන්සේගේ කැමැත්ත අනුව, විශ්වාසවන්තව සේවයේ යෙදෙමු.**

**එසේ කිරීමට දෙවියන්වහන්සේ**

**ඔබට මඟපෙන්වන සේක්වා.**

**ඔබව ආරක්ෂා කරමින්,**

**ඔබට සියල්ල සපයන සේක්වා !!**

# සටහන්

# සටහන්

# යටහත්තුන්ට දෙවියන්වහන්සේ ආශිර්වාද කරනසේක



## රූත්ගේ කථාව - 04

# යටහතුන්ට දෙවියන්වහන්සේ ආශිර්වාද කරනසේක

## රූත් 2:1-23

<u>හැඳින්වීම</u> :-

පසුගිය අධ්‍යයනයන් තුන තුළින්, අප ඉගෙන ගත්තාවූ, වැදගත් සත්‍යයන් කිහිපයක් ගැන ඔබගේ මතකය අවදි කිරීමට කැමැත්තෙමි. ඒවා නම්,

(i) අපව පාපයේ දඬුවමින් මුදවාගත්තාවූ දෙවියන්වහන්සේ, අපගේ ජීවිත නැවත ගොඩනැගීමට/ප්‍රතිසංස්කරණය කිරීමට ක්‍රියා කරන්නාවූද, යක්ෂයා අපගෙන් සොරාගත්තාවූ දේ නැවත ලබාදීම උදෙසා ක්‍රියාකරන්නාවූද දෙවි කෙනෙක් වන බව.

(ii) උන්වහන්සේ අසරණවූවන් කෙරෙහි මහත් දයානු-කම්පාවෙන් බලමින්, ඔවුන්ට අවශ්‍ය දේවල් ඔවුන්ට සපයාදීම උදෙසා ක්‍රියාකරන්නාවූ දෙවි කෙනෙක් වන බව.

(iii) උන්වහන්සේගේ ආශිර්වාද භුක්ති විඳීමට/ලැබීමට බොහෝවිට,

- පසුතැවිලිවීම
- යටහත් වීම
- විශ්වාසවන්ත වීම

අත්‍යවශ්‍ය වන බව.

(iv) අප අපගේ වැරදි/දුර්වලකම්/අකීකරුකම් පිලිගෙන, සැබෑ පසුතැවිල්ලෙන් දෙවියන්වහන්සේ වෙත හැරී එන විට, උන්වහන්සේ අපව පිළිගැනීම උදෙසා **'පිළිගැනීමේ උත්සවයක්'** සූදානම් කරන බව, නොහොත් අපව ඉතා ආදරයෙන් පිළිගන්නා බව.

(v) මේ අයුරින් අප අරඹන්නාවූ අලුත් ජීවිතයේදී උන්වහන්සේ,

- **අපට මඟපෙන්වන බව,**
- **අපව ආරක්ෂා කරන බව,**
- **අප තුළින් ක්‍රියාකරන බව**

යන්නාවූ සත්‍යයන් වේ.

## <u>අධ්‍යයනය</u> :-

### 1. <u>දෙවියන්වහන්සේ ගැන රූත් 2 අපට උගන්වන්නාවූ දේ</u>

#### (a) දෙවියන්වහන්සේ අපට මඟපෙන්වනසේක - රූත් 2:3

**රූත් 2:3 :- ''..... ඈ ගොස් කෙතට පැමිණ ගොයම් කපන්නන් පස්සේ කරල් ඇහින්දාය. <u>වාසනාවට මෙන් ඈ</u> එලීමෙලෙක්ගේ පෙළපතට අයිති <u>බෝවස්ගේ කෙත් කොටසට පැමින්නාය</u>.''**

මෙම පදයේ අප දකින්නේ දෙවියන්වහන්සේගේ පුදුමාකාර මඟපෙන්වීමයි. විදේශීය කාන්තාවක් වූ රූත් බෝවස්ව දැක තිබුනේවත්, ඔහුගේ කෙත පිහිටා තිබුණේ කොතැනද කියා දැන සිටියේවත් නැත. කරල් ඇහිදීම උදෙසා කෙතට පිටත්වීමට පෙර ඈ නායොමිට ප්‍රකාශ කළේ, **'මම කෙතට ගොස් මට කරුණාව පෙන්වන කෙනෙකු පස්සේ යමින් කරල් ඇහිඳගෙන එන්නෙමි.' (රූත් 2:2)** කියායි.

මේ අතර දෙවියන්වහන්සේ වෙත තමාගේ ජීවිතය ළඟදී කැපකළ **(රූත් 1:16)** රූත් නමැති ආත්මික බිළිඳා වෙත, දෙවියන්වහන්සේගේ දයානුකම්පිත නෙත් හෙලා තිබුණු බව අප දකින්නෙමු. උන්වහන්සේගේ මහත් ප්‍රේමයෙන් උන්වහන්සේ ඇයගේ පාද හසුරුවමින් බෝවස්ගේ කෙත වෙත ඇයව ගෙනගියසේක.

❖ මාගේ ප්‍රේමවන්ත සහෝදරයා, සහෝදරිය, මෙය කියවන්නාවූ ඔබ පරිණත කිතුනුවෙක් හෝ අලුතෙන් දෙවියන්වහන්සේට ඔබගේ ජීවිතය භාර කළාවූ රූත් වැනි ආත්මික බිළිඳෙක් විය හැක. එය කෙසේ වුවත් ඔබට ප්‍රේමකරන්නාවූ ඔබගේ දෙව්පියාණන්වහන්සේ බලා සිටින්නේ, ඔබට මඟපෙන්වමින් ඔබව නිසි මඟ ගෙනයෑමටයි.

එම මාර්ගය හඳුනාගැනීම උදෙසා, දේව වචනය මගින් අපට ලබාදී ඇති පොරොන්දුවක් දෙස බලමු.

**හිතෝපදේශ 3:5,6 :- " [5] නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාස-කරපන්න. [6] නුඹේ සියලු මාර්ගවලදී උන්වහන්සේ සලකාපන්න, <u>එවිට උන්වහන්සේ නුඹේ මාවත් සමතලා-කරනවා ඇත</u>."**

දේව දරුව, **'දෙවියන්වහන්සේ ඔබගේ මාවත් සමතලා කිරීම'** උදෙසා මෙම පදවල ඇති කොන්දේසි දෙස බලමු.

(i) **'නුඹේම නුවණෙහි නොපිහිටා'**

දෙවියන්වහන්සේ අපට මෙහි කියන්නේ, අපගේ නුවණ, දැනුම, හෝ ප්‍රඥාව මතවත් (අපට උපදෙස් දෙන්නාවූ අයගේ ප්‍රඥාව මතවත්) විශ්වාසය නොතබන්න කියායි.

රූත්ගේ කථාවේ අප දකින්නේ රූත්ට ප්‍රේමකළ, දෙවියන්වහන්සේව දැන සිටියාවූ නායෝමි පවා රූත්ට දුන්නාවූ උපදෙස් එනම්, **' නුඹේ නෑනා පස්සේ හැරී පලයන්න.' (රූත් 1:15)** යන උපදෙස් රූත් පිළිනොගත්ත බවයි. එසේ ඇය පිළිනොගන්නේ ඇය දෙවියන්වහන්සේ කෙරෙහි මුළු සිතින් විශ්වාසය තබා තිබුණු නිසයි.

(ii) **'නුඹේ මුළු සිතින් ස්වාමීන්වහන්සේ විශ්වාස කරපන්න'**

කිතුනු නම දරන්නාවූ අප සැම, දෙවියන්වහන්සේ කෙරෙහි **'විශ්වාසකරන'** නමුත්, අපට ප්‍රශ්නයක් ආ විට අපගේ ඇදහිල්ල සැලෙන අවස්ථා ඇතිවන බව අප දන්නෙමු. මෙවැනි අවස්ථා වලදී යක්ෂයා බලාසිටින්නේ, අප තුළ සැක ඇතිකොට, අපගේ සිත්වල බය උපදවා, මුළු සිතින් දෙවියන්වහන්සේව විශ්වාස නොකිරීමට අපට සැලැස්වීමටයි.

**හෙබ්‍රෙව් 11:6 :- "නුමුත් ඇදහිල්ල නැතුව උන්වහන්සේව ප්‍රසන්නකරන්ට නුපුළුවන......"**

දේව දරුව, අපගේ ජීවිතවල කුමන අවස්ථාවකට මුහුණදීමට අපට සිදුවුවත්, දෙවියන්වහන්සේ කෙරෙහි සම්පූර්ණ ඇදහිල්ල ඇතිව, උන්වහන්සේ කෙරෙහි මුළු සිතින් විශ්වාස කරමින් ක්‍රියාකරමු.

(iii) **‘ නුඹේ <u>සියලු මාර්ගවලදී</u> උන්වහන්සේ සලකාපන්න ’**

මෙම කොන්දේසියේ වඩාත්ම වැදගත් වචන ලෙස මා දකින්නේ, **‘ සියලු මාර්ගවලදී ’** යන වචනයි.

දේව දරුව, බොහෝ කිතුනුවන් බොහෝ දේවලදී, දෙවියන්වහන්සේගේ කැමැත්ත සලකා බලන අතර, සමහර දේවලදී දේව වචනය ප්‍රකාශ කරන්නාවූ දේ ගැනද, දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක්ද කියා සොයා බැලීම ගැනද වැඩි උනන්දුවක් නොදක්වන්නාවූ බව අප දනිමු.

මෙනමුත් දෙවියන්වහන්සේ ඉතා පැහැදිලිව ප්‍රකාශ කරන්නේ, **‘නුඹේ සියලු මාර්ගවලදී උන්වහන්සේ සලකාපන්න ’** කියායි. එම වචන අනුව ක්‍රියාකිරීමට, අප අදිටන් කරගනිමු.

ඉහත සඳහන් කොන්දේසි ඉටුකරමින්, අප සැම **හිතෝපදේශ 3:6** හි **සඳහන් පොරොන්දුව අත්දකිමු.**

දෙවියන්වහන්සේ අපගේ ජීවිතවල ස්වාමිත්වය භාරකරමින්, **එඬේරෙකු ලෙස උන්වහන්සේ අපට ලබා දෙන්නාවූ මඟපෙන්වීම (ගීතා 23:1) අත්දකිමු.** (උන්වහන්සේ YEHOWAH - ROI අපගේ එඬේරා බව අත්දකිමු.

(b) **දෙවියන්වහන්සේ අපට සපයනසේක - රූත් 2:15, 16**

**රූත් 2:15,16 :- “ [15] …… ඈට මිටි අතරෙත් ඇහිඳින්ට ඉඩදීපල්ලා. [16] …… අහුරුවලිනුත් සමහරක් ඇද දමා ඈට ඇහිඳ ගැනීමට අත්හැරපල්ලා,”**

මෙම ආශිර්වාදයට රූත්ට ඇතුල්වීමට හැකිවූයේ, දෙවියන්වහන්සේට ඈ කළාවූ කැපවීම සහ ඇයගේ යටහත්කම මෙන්ම, උන්වහන්සේගේ මඟපෙන්වීමට ඇයගේ කීකරුකමයි.

❖ මාගේ ප්‍රේමවන්ත සහෝදරයා, සහෝදරිය, පූජා කිරීම උදෙසා, ආබ්‍රහම්ට බැටළුවෙක් සැපෙව්වාවූ දෙවියන් - වහන්සේ අපට සපයන්නාවූ (YEHOWAH - YIREH) දෙවියන්වහන්සේ වනසේක. **(උත්පත්ති 22:13,14)**

යටහත්කමින් උන්වහන්සේට කීකරුවෙමින් උන්වහන් - සේගේ සැපයීම අත්දකිමු.

**පිලිප්පි 4:19 :- "මාගේ දෙවියන්වහන්සේ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තමන්ගේ තේජස් සම්පතේ ප්‍රකාරයට නුඹලාගේ සියලු හිඟකම් සම්පූර්ණකරනසේක."**

(c) **දෙවියන්වහන්සේ අපව ආරක්ෂාකරන සේක - රූත් 2:9**

**රූත් 2:9 :- "..... නුඹට අත නොගසන ලෙස මා විසින් තරුණ පුරුෂයන්ට අණකර තිබෙනවා නොවේද ? ......"**

දෙවියන්වහන්සේ රූත්ට මඟපෙන්වමින්, ඇට සපයමින් ඇගේ ජීවිතයේ ඇතිවීමට හැකිවූ සියලු උපද්‍රව වලින් ඇයව ආරක්ෂා කළසේක.

❖ මාගේ ප්‍රේමවන්ත සහෝදරයා, සහෝදරිය, අපගේ දෙවි ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ දරුවන්ව රැකබලා ගන්නාවූ, ශක්තිමත් කරන්නාවූ, සුරක්ෂිතව තබාගන්නාවූ දෙවියන්වහන්සේ වනසේක. එබැවින් උන්වහන්සේ ඔබ කැඳවන ඕනෑම සේවයකට, ඕනෑම ස්ථානයකට යෑමට භය නොවන්න.

**2 සාමුවෙල් 22:31 :- "..... උන්වහන්සේ තමන් කෙරෙහි විශ්වාසකරන සියල්ලන්ට පලිහක් වනසේක."**

**යෙසායා 41:10 :- "භය නොවෙන්න, මක්නිසාද මම නුඹ සමග සිටිමි ; තැති නොගනින්න, මක්නිසාද මම නුඹේ දෙවියන්වහන්සේය. මම නුඹ ශක්තිමත්කොට, නුඹට උපකාර කරන්නෙමි ; එසේය, මාගේ ධර්මිෂ්ඨකම නමැති දකුණතින් නුඹ උසුලන්නෙමි."**

(කරුණාකර **ගීතාවලිය 3:3, 18:2, 30, 28:7 , 84:11** කියවා බලන්න)

(d) **දෙවියන්වහන්සේ අපට විශේෂ ආශිර්වාද ලබාදෙනසේක - රූත් 2:9**

**රූත් 2:9 :- ''....... නුඹට පිපාසාවූ කල භාජන ළඟට ගොස් තරුණයන් ඇද තිබෙන වතුරෙන් බීපන්නැයි රූත්ට කීවේය.''**

❖ මාගේ ප්‍රේමවන්ත සහෝදරයා, සහෝදරී, ඔබ දෙවියන් - වහන්සේට කීකරුව, උන්වහන්සේ කැඳෙව්වාවූ මාර්ගයේ යන විට, උන්වහන්සේ ඔබට සපයා ඔබව ආරක්ෂා කරනවා පමණක් නොව, උන්වහන්සේ විශේෂ වරප්‍රසාද සහ ආශිර්වාද ඔබට ලබාදෙනසේක.

**උත්පත්ති 39 : 4,5 :-'' [4] යෝසෙප් ඔහුගෙන් කරුණාව ලැබ ඔහුට මෙහෙකෙළේය. ඔහු තමාගේ ගෙට ඔහු ප්‍රධානියා කොට තමා සන්තක සියල්ල ඔහු අතට භාරදුන්නේය. [5] ඔහු තමාගේ ගෙට සහ තමා සන්තක සියල්ලටත් ඔහු ප්‍රධානියා කළ.....''** (කරුණාකර **හිතෝපදේශ 3:33**b, **10:22** කියවන්න)

(e) **දෙවියන්වහන්සේ සියළු දේ දන්නාසේක - රූත් 2:11**

**රූත් 2:11 :- ''...... නුඹේ පුරුෂයා නැසුණු පසු <u>නුඹේ නැන්දාට නුඹ කළ සියල්ලත්</u> නුඹේ පියා හා මවුද ජන්ම භූමියද අත්හැර මීට ප්‍රථම නුඹ නෑඳින්න සෙනඟක් වෙතට ආ බවත් මට සම්පූර්ණයෙන් දන්වා තිබේ.''**

රූත්, බෝවස් ගැන වැඩි යමක් නොදන සිටි නමුත්, ඈ විසින් නායොමි උදෙසා කළාවූ කැපකිරීම ගැන සියළු විස්තර බෝවස් දැන සිටියේය. රූත්, නායොමිට දුන්නාවූ ප්‍රේමය ගැන ඔහු දැන සිටියේය.

❖ මාගේ ප්‍රේමවන්ත සහෝදරයා, සහෝදරිය අපට සමහරවිට එය අමතක වන නමුත්, දෙවියන්වහන්සේ අප කරන්නාවූ සියළු දේ දන්නාසේක. අප ප්‍රචාර නොකර කරන්නාවූ යහපත් ක්‍රියා/කැපවීම් උන්වහන්සේ දකිමින් අපට ආශිර්වාද කරනසේක. කිසි ප්‍රචාරයක් නොකොට තමා සන්තක සියල්ල පූජාකළ වැන්දඹු ස්ත්‍රියට, යේසුස්වහන්සේ ප්‍රසිද්ධියේ ප්‍රශංසා කළසේක. (**මාර්ක් 12:10-44**)

අප හොර රහසේ කරන්නාවූ වැරදි ක්‍රියා/වංචාවන් දකින්නාවූ උන්වහන්සේ සුදුසු ආකාරයට ඒවා ගැනද ක්‍රියා කරනසේක. එබැවින්, වංචාකාර ලෙස ක්‍රියා කළාවූ අනනියස් සහ සප්පිරා පිළිබඳව යේසුස්වහන්සේ දක්වූවාවූ ප්‍රතිචාරය අමතක නොකරමු.

(f) **දෙවියන්වහන්සේ අප කෙරෙහි කරුණාව දක්වනසේක - රූත් 2:13**

**රූත් 2:13 :- "..... ඔබ මා සනසා ඔබගේ මෙහෙකාරිය සමග කරුණාවෙන් කථාකෙළෙහියයි කීවාය."**

❖ අපගේ දෙවිපියාණන්වහන්සේ, අප කෙරෙහි මහත් කරුණාවෙන් ක්‍රියාකරනසේක.

**2 ලේකම් 30:9 :- "..... මක්නිසාද නුඹලාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේ දයාවද අනුකම්පාවද ඇත්තාවූ කෙනෙක්ය, නුඹලා උන්වහන්සේ වෙතට හැරුණොත් උන්වහන්සේ ස්වකීය මුහුණ නුඹලා කෙරෙන් හරවා නොගන්නාසේකැයි කීවෝය."**

**නෙහෙමියා 9:17 :- "..... එහෙත් ඔබ කමාවෙන්නාවූ, දයාබරවූ, අනුකම්පාවෙන් පූර්ණවූ, ඉවසිලිවන්තවූ, කරුණාභරිතවූ දෙවිකෙනෙක් බැවින්, ඔබ ඔවුන් අත් නොහැරියසේක."**

(g) **දෙවියන්වහන්සේ තරාතිරම් නොබලනසේක - රූත් 2:13**

**රූත් 2:13** හි රූත් ප්‍රකාශකරන්නේ, බෝවස් තම **'මෙහෙකාරිය'** සනසා ඈ සමඟ කරුණාවෙන් කථා කළ බවයි. එනම් බෝවස් තරාතිරම් නොබලමින් ක්‍රියා කළ බවයි.

❖ දේව දරුවෙනි, අපගේ දෙවි ස්වාමීන්වහන්සේ තරාතිරම් නොබලනසේක. සමහරවිට අප නමස්කාර කරන්නාවූ සභාවේ තරාතිරම් සැලකුවත්, සර්වපරාක්‍රම දෙවියන් - වහන්සේ එසේ නොකරනසේක. උන්වහන්සේ බලන්නේ අපගේ තරාතිරම් දෙස නොව, අපගේ හදවත දෙසය. **එබැවින් අපි සැමවිටම අපගේ හදවත් පවිත්‍රව තබාගැනීම උදෙසා ක්‍රියා කරමු.**

**ක්‍රියා 10:34 :-**
**"එවිට පේත්‍රුස් තමාගේ මුඛය හැර කථාකොට : සැබවින් දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ගේ තරාතිරම් නොබලන කෙනෙක්ය."**

**රෝම 2:11:-**
**" මක්නිසාද දෙවියන්වහන්සේ තරාතිරම් නොබලනසේක."**

## 2. <u>දෙවියන්වහන්සේ ගැන අප දන්නාවූ දේ සහ අපගේ හැසිරීම</u>

කිතුනු නම දරන්නාවූ අප සැම, දෙවියන්වහන්සේ ගැන බොහෝ දේ දන්නෙමු. මෙසේ අප දන්නාවූ දේ අපගේ ජීවිතවල අනිවාර්‍යයෙන්ම වෙනසක් ඇති කළ යුතු වේ. මෙම වෙනස මනුෂ්‍යයන් **'ඉරු දින පමණක් දකින්නාවූ'** වෙනසක් නොව, අපගේ එදිනෙදා ජීවිතයේ, අප ඇසුරු කරන්නාවූ සැමදෙනා අපගේ **ආකල්ප වලින්, වචන වලින් සහ ක්‍රියාවලින්** දකින්නාවූ වෙනසක් විය යුතුවේ.

අපගේ සමාජයේ මනුෂ්‍යයන් කිතුනුවන්ව දකින්නේ, ඉරු දින හොඳට ඇඳ පැළඳගෙන දෙවියන්වහන්සේට නමස්කාර කිරීම උදෙසා රැස්වෙන්නාවූ සමූහයක් ලෙසයි. එමඟින් අප කිතුනුවන් බව අප අවට වෙසෙන සැමදෙන දැනගන්න අතර, අපගේ ජීවිතවල කිතුනු ගුණාංග ඔවුන් දකිනවාද ? යන්න අප විසින් අපගෙන්ම අසාගත යුතු ප්‍රශ්නයකි.

මෙය වඩාත් වැදගත්වන්නේ, අප **'දේව දරුවන් '** නොහොත් දෙවියන්වහන්සේගේ දරුවන් ලෙස අප විසින්ම ප්‍රකාශ කරනු ලබන නිසයි. එබැවින්, අප සැබෑ දේව දරුවන් වන්නේ නම්, අනිවාර්‍යයෙන්ම දෙවියන්වහන්සේගේ ගුණාංග වල ඡායාවක්වත් අපගේ ජීවිත වලින් ප්‍රකාශ විය යුතු බව ඔබ පිළිගනු ඇතැයි, මම සිතමි.

එබැවින් මා ඔබට ආරාධනා කරන්නේ, දෙවියන්වහන්සේගේ වැදගත් ගුණාංගයක් ලෙස ඔබ දන්නාවූ **ප්‍රේමය** සහ, මෙම අධ්‍යයනයෙන් අප ඉගෙන ගත්තාවූ තව ගුණාංග දෙකක් වන **කරුණාව** සහ **තරාතිරම් නොබැලීම,** ඔබගේ ජීවිතයේ කෙතරම් දුරට ප්‍රකාශවෙනවාද කියා විමසා බලන්නයි.

(a) **<u>දෙවියන්වහන්සේගේ ප්‍රේමය</u>**

**යොහන් 3:16 :- " මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට** (ඔබට) **ප්‍රේම-කළසේක...."**

මෙතරම් ඔබට දෙවියන්වහන්සේ ප්‍රේමකරන අතර, දේව පුත්‍රයා දේව දරුවන් වන අපට, ප්‍රේමය ගැන දුන් ආඥාවක් දෙස බලමු.

**යොහන් 15:12 :- " මාගේ ආඥාව නම් මා නුඹලාට ප්‍රේමකළාක්මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේමකරපල්ලාය යනුය."**
(කරුණාකර **යොහන් 13:34, 15:17** යන පදද කියවන්න)

දේව දරුවනි, දේව දරුවන් අතර ඇත්තාවූ මේ **'දේව ප්‍රේමය'** ඔබගේ සභාවෙහි ප්‍රකාශවනවාද ?
ඔබගේ ජීවිතයෙන් ප්‍රකාශවනවාද ?

(b) **<u>දෙවියන්වහන්සේගේ කරුණාව</u>**

මාගේ ප්‍රේමවන්ත සහෝදරයා, සහෝදරිය, රූත්ගේ පොතෙන් අපට ප්‍රකාශ වන්නාවූ දෙවියන්වහන්සේගේ කරුණාව, යේසුස්වහන්සේගේ ජීවිතය මගින් අපට වඩාත් පැහැදිලිව දැක ගන්නට හැකිවේ. යේසුස්වහන්සේ වෙත පැමිණි සැම කෙනෙක්ම කෙරෙහි උන්වහන්සේ දැක්වූයේ යහපත්කමත් කරුණාවත්ය. උන්වහන්සේගේ මේ කරුණාව දුටු ඵරිසිවරු, ඒ ගැන උන්වහන්සේව විවේචනයට ලක් කළෝය.

**මතෙව් 9:10,11 :- " [10]....බොහෝ සුංගම් අයකරන්නෝද පව්කාරයෝද ඇවිත් උන්වහන්සේ .... සමග හිඳගත්තෝය. [11] ඵරිසිවරු ඒ දැක : ..... පව්කාරයන්ද සමග කන්නේ මක්නිසාදැයි උන්වහන්සේගේ ගෝලයන්ට කීවෝය."**

දේව දරුව, උපකාර ඉල්ලා විවිධ මනුෂ්‍යයන් ඔබගේ නිවෙසට පැමිණෙන අතර, දේව මඟපෙන්වීම අනුව දෙවියන්වහන්සේගේ කරුණාව ඔවුන් කෙරෙහි දක්වන්න. **දෙවියන්වහන්සේ ඔබට දොරක් ඇරියොත්, ඔවුන්ට උපකාර කර ශුභාරංචිය ඔවුන් සමඟ බෙදාගන්න.**

(c) <u>**තරාතිරම් නොබැලීම**</u>
මෙය ගැන දෙවියන්වහන්සේගේ වචනය ප්‍රකාශ කරන්නාවූ සමහර වදන් ඔබගේ මතකයට නැංවීමට කැමැත්තෙමි.

**යාකොබ් 2:2-4 :- "[2] රන් මුද්දකද්ද අලංකාර වස්ත්‍රද පැළඳගන ඉන්න මනුෂ්‍යයෙකුත් කිලුටු ඇඳුම් ඇඳගන ඉන්න දිළින්දෙකුත් නුඹලාගේ සිනගෝගයට ආවොත්, [3] නුඹලා අලංකාර වස්ත්‍ර පැළඳගන ඉන්න අය සලකා : මෙහි හොඳ තැනක හිඳගන්ටය කියාද, දිළින්දාට : නුඹ ඔහේ සිටපන්න, නොහොත් මාගේ පාපුටුව ළඟ ඉඳගනින්නැයි කියාද, කියනවා නම්, [4] නුඹලා භේදවූ අදහස් ඇත්තෝව, නපුරු සිතිවිලිවලින් යුක්ත විනිශ්චයකාරයෝ නොවන්නෝද ?"**

**යාකොබ් 2:9 :- " <u>නුමුත් තරාතිරම් සලකන්නෝ නම්</u>, නුඹලා වරදකාරයන් බව ව්‍යවස්ථාවෙන් ඔප්පුවෙන බැවින් <u>නුඹලා කරන්නේ පාපයය</u>."**

**3. <u>බෝවස්ගේ ගුණාංග තුළින්, ඔහු ක්‍රිස්තුස්වහන්සේගේ පෙර ඇඟවීමක්</u> <u>(TYPE)</u> <u>ලෙස දැකීම - රූත් 2:4-16</u>**

(a) **බෝවස් තම සේවකයින්ට ආචාර කළ අන්දම**

**රූත් 2:4 :- " බලව, බෝවස් ..... අවුත් : ස්වාමීන්වහන්සේ නුඹලා සමග වේවයි ගොයම් කපන්නන්ට කීවේය ....."**

බෝවස් මෙසේ පවසන්නේ තම කෙතේ සේවය කරන ඔහුගේ දාසයන්ටයි. ඔහු තම කෙතට පැමිණ ඔවුන්ට ආචාර කරන්නේ, දෙවියන්වහන්සේ වෙත ඔවුන්ගේ සිත් යොමුකරමිනුයි. ශුභාරංචි පොත් කියවන අප දකින්නේ යේසුස්වහන්සේ සැමවිටම මනුෂ්‍යයන්ගේ සිත්/හදවත් දෙවියන්වහන්සේ වෙත යොමුකිරීමයි.

බෝවස්ගේ මෙම ආචාරය කියවන විට මාගේ හදවතේ නැගී එන්නාවූ ප්‍රශ්නයන් වන්නේ, අප රැකියාවෙහි නිරත වන්නාවූ ස්ථානයෙහි, දෙවියන්වහන්සේ මඟපෙන්වන ලෙස, සමහරුන්ට **'ගුඩ් මෝනිං'** වෙනුවට **'මේ ගෝඩ් බ්ලෙස් යූ'** නැතහොත් **'ජේසු පිහිටයි'** කියා ආචාර කරන්ට අප මැලි වන්නේ මන්ද ? යන ප්‍රශ්නයයි.

(b) **බෝවස් පුද්ගලයන් කෙරෙහි දැක්වූවාවූ සැලකිල්ල - රූත් 2:5**

**රූත් 2:5** හි අප දකින්නේ, තම කෙතේ වැටුනු කරල් ඇහිදීමට පැමිණි ' **හිඟන ස්ත්‍රියක්** ' ගැන ඔහු දැක්වූවාවූ සැලකිල්ලයි. තවද ඔහු ඇසූ ප්‍රශ්නයෙන් අපට පෙනීයන්නේ, ඔහු කෙතේ නාඳුනන මුහුණක් දැක, රූත් ගැන සැලකිල්ලක් දැක්වූයේ, ඇය නාඔයාමිගේ ලේලිය බව කිසිසේත් නොදනිමින් බවයි.

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, අපගේ සභාවට හෝ නිවසට පැමිණෙන සැමදෙනාවම, තරාතිරම් නොබලා ආදරයෙන් පිළිගනිමු.

**ඔවුන් සැමදෙනාට දෙවියන්වහන්සේගේ ප්‍රේමය දැක්වීමට, අප සැම දෙන ක්‍රියාකරමු.**

**" වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා, මම නුඹලාට සහනය දෙමි." (මතෙව් 11:28)** කියා යේසුස්වහන්සේ පැවසූසේක. අපද අප වෙත එන සැමදෙනාගේ බර සැහැල්ලු කිරීම උදෙසා අපට හැකි අන්දමින් ක්‍රියා කරමු.

(c) **බෝවස් රූත්ට ඇමතූ අන්දම - රූත් 2:8**

බෝවස් රූත්ව අමතන්නේ, ' **මාගේ දියණියෙනි** ' කියායි. දොළොස් අවුරුද්දක් මහලේ රෝගයෙන් පෙළුනාවූ ස්ත්‍රියට යේසුස්වහන්සේ කීවේ, **"දියණියනි, ධෛර්යයවත් වෙයන්න, නුඹේ ඇදහිල්ල නුඹ සුවකළේය " (මතෙව් 9:22)** කියායි.

අප සැමද, ' **හදවතෙන් නැගී එන්නාවූ අවංක ආදරයෙන්** ' මනුෂ්‍යයන් අමතමු. එසේ කිරීමට අපට හැකිවීම පිණිස, **'ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්-වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත්වල වගුරුවන ලෙස' (රෝම 5:5)** දෙවි සමිඳුන්ට යදිමු.

(d) **<u>බෝවස් දුර්වලුන්, අසරණයන් ආරක්ෂා කිරීම - රූත් 2:9</u>**

**රූත් 2:9** හි අප දකින්නේ අනාරක්ෂිතව සිටියාවූ රූත්ට ආරක්ෂාව ලබාදීම පිණිස බෝවස් ගත්තාවූ ක්‍රියා මාර්ගයයි.

ගල් ගසා මරා දැමීමේ අදහසින්, යේසුස්වහන්සේ වෙත ගෙනෙන ලද අනාචාර ස්ත්‍රිය, **(යොහන් 8:1-11)** යේසුස්වහන්සේ ආරක්ෂා කළ පුවත අප දන්නෙමු. මෙම අවස්ථාවේදී යේසුස්වහන්සේ ක්‍රියා කළේ '**ඇයව ශාරීරික මරණයෙන් මුදවා ගැනීම උදෙසා පමණක් නොව, ශාරීරික මරණයෙන් ඇයව මුදවා, ඇයට සදාකාල ජීවනය ලබාදීම පිණිස වේ.**' එබැවින් ශාරීරික මරණයෙන් ගැළවීම ලැබුනු ඇයට උන්වහන්සේ කීවේ, '**පලයන්න, මෙතැන් පටන් තවත් පව් නොකරන්න.**' **(යොහන් 8:11)** කියායි.

අප සැමද අපට හැකි අයුරින්, අවස්ථාව අනුව, මනුෂ්‍යයන්ට උපකාර කළ යුතු අතර, ඔවුන්ට අප විසින් කළ හැකි වඩාත්ම අනර්ඝ උපකාරය වන්නේ, **පාපයේ දඬුවමින් ඔවුන් මුදවා ගැනීම බව තේරුම් ගනිමින්, ඔවුන්ට ශුභාරංචිය ප්‍රකාශ කරමින්, ඔවුන්ව යේසුස්වහන්සේ වෙත යොමු කිරීමයි.**

(e) **<u>බෝවස් රූත් ලැබීමට සුදුසු ප්‍රමාණයට වැඩියෙන් ඇයට ලබා දුන්නා - රූත් 2:14, 17</u>**

**රූත් 2:14 :- " කෑම කන වේලාවේ බෝවස් ඈට කථාකොට : මෙහාට ඇවිත් මේ රොටිවලින් අරන් නුඹේ කැබෙල්ල කාඩි හොද්දේ පොවා කාපන්නැයි ඈට කීවේය. ඈද ගොයම් කපන්නන් ළඟ ඉඳගත්තාය. ඔහු විලඳත් ඈට ළංකරදුන්නේය."**

**රූත් 2:17 :- " මෙසේ ඈ සවස් වනතෙක් කෙතෙහි ඇහිඳ ඈ ඇහිඳපු ඒවා මැඩගත්තාය. <u>යව ඒවාවක් පමණ තිබුණේය</u>."**

යේසුස්වහන්සේ කීවාවූ අකීකරු පුත්‍රයාගේ උපමාවේද අප දකින්නේ, එම පියා ලැබීමට සුදුසු ප්‍රමාණයට වඩා බොහෝ සේ පුතාට ලබා දීමයි.

බෝවස්ගේ ත්‍යාගවන්තකම නිසා රූත් එදා යව එෆාවක් පමණ, එනම් බුසලකින් 60% පමණ ඇහිඳගත් බව **රූත් 2:17** පෙන්නුම් කරයි.

දේව දරුව, දෙවියන්වහන්සේ අපගේ සුදුසුකමට වඩා අධිකලෙස අපට ආශිර්වාද ලබා දී ඇති අතර, අපද අසරණවූවන් හට ත්‍යාගවන්තව ලබා දෙමු.

## 4. <u>බොහෝ ආශිර්වාද ලැබීමට රූත්ගේ සුදුසුකම</u>

**රූත්, ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය වන සභාවේ පෙර ඇඟවීමක්** (TYPE) **ලෙස අපට හඳුනා ගත හැකිවේ.**

මෙවැනි ආශිර්වාදයක් ලැබීම උදෙසා, ඇයගේ ජීවිතය පෙන්නුම් කළාවූ ගුණාංග දෙස බලමු.

### (a) <u>රූත්ගේ යටහත්කම - රූත් 2:10</u>

**රූත් 2:10 :- '' එවිට ඈ බිම වැතිර මුහුණින් වැටී වැඳ .....''**

අප මෙහි දකින්නේ රූත් බෝවස් ඉදිරියෙහි <u>බිම වැතිර මුහුණින් වැටී</u> ඔහුට වැඳීමයි.

දේව දරුවෙනි, දෙවියන්වහන්සේ යටහතුන්ට කරුණාව දක්වන්නාවූ, ඔවුන්ට ආශිර්වාද කරන්නාවූ දෙවි කෙනෙක් වනසේක.

**යාකොබ් 4:6 :- ''....දෙවියන්වහන්සේ....යටහතුන්ට කරුණාව දෙනසේකැයි ලියවිල්ල කියන්නේය.''**

### (b) <u>රූත්ගේ ආකල්පය - රූත් 2:10</u>

**රූත් 2:10 :- ''..... විදේශීවූ මා සලකන ලෙස ඔබ ඉදිරියෙහි මට කරුණාව ලැබී තිබෙන්නේ මක්නිසාදැයි ඔහුට කීවාය.''**

ඇයගේ ආකල්පය වූයේ, **'මම වටින්නේ නැහැ, මම සුදුසු නැහැ'** යන්නයි.

(c) <u>**රූත්ගේ කරුණාවන්තකම - රූත් 1:10, 2:11**</u>

**රූත් 1:10 :- " ඔව්හුද ශබ්දනගා අඬා : නැත, අපි නුඹ සමග නුඹේ සෙනඟ වෙතට යන්නෙමුයයි ඈට කීවෝය."**

බොහෝ දේ ඇතිව මෝවබ් දේශය වෙත පැමිණ, කිසිත් නැතිව ආපසු තනිව යෑමට සූදානම්වූ නායොමිට, රූත් සැලකුවේ ඉමහත් ආදරයෙන් සහ කරුණාවෙනි. බෙත්ලෙහෙමට පැමිණි පසුද රූත් ක්‍රියා කළේ ඒ අන්දමටය.

(d) <u>**දෙවියන්වහන්සේ කෙරෙහි රූත් තුළ තිබුණාවූ ඇදහිල්ල**</u>

බෙත්ලෙහෙමට පැමිණීමට පෙර, රූත් ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ ගැන වැඩි යමක් නොදැන සිටින්ට ඇත. මෝවබ් දේශයේදී ඈට දෙවියන්වහන්සේ ගැන දැනගන්ට ලැබුනේ, උන්වහන්සේ ගැන නායොමි ප්‍රකාශ කළාවූ දේ සහ නායොමිගේ ජීවිත සාක්ෂියයි. එනමුත් **'සර්වපරාක්‍රමයාණන්වහන්සේට'** ඇගේ මුලු අනාගතය භාරදුන්නාවූ නායොමිගේ ඇදහිල්ල දුටු රූත්, උන්වහන්සේට ඇයගේ මුලු අනාගතයද භාරදීමට තීරණය කළාය. **දෙවියන්වහන්සේ ඇයට ආශිර්වාද කළසේක.**

(e) <u>**රූත් ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කිරීම**</u>

**'නුඹට ආශිර්වාද කරන්නන්ට මම ආශිර්වාද කරන්නෙමි.' (උත්පත්ති 12:3)** යන පොරොන්දුව දෙවියන්වහන්සේ මුලින්ම දුන්නේ ආබ්‍රහම්ට වන අතර, එම පොරොන්දුව ආබ්‍රහම්ගෙන් ඊසාක්ටද, ඊසාක්ගෙන් යාකොබ්ටද (ඊශ්‍රායෙල්ටද) උරුමවී, යාකොබ්ගෙන් පැවතුනාවූ ඉශ්‍රායෙල් ජාතියට හිමිවේ.

එදා රූත් **'ඉශ්‍රායෙල් ජාතිය, ඇයගේ ජාතිය'** ලෙස තෝරාගනිමින්, ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කිරීමට තීරණය කළ විට දෙවියන්වහන්සේ ඇයට අතිශයින් ආශිර්වාද කළ සේක. **උන්වහන්සේ ඇයගේ නම යේසුස්වහන්සේගේ පෙළපතට ඇතුළු කළ සේක. (මතෙව් 1:5)**

ප්‍රේමවන්ත දේව දරුවෙනි, අප සැම

**යටහත්කම පැළඳ ගනිමින්,**
**නිවැරදි ආකල්ප සහිතව,**
**කරුණාවන්ත ලෙස ක්‍රියාකරමින්,**
**දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඇතිව,**
**උන්වහන්සේට කැපවෙමින්,**
**ඉශ්‍රායෙල් ජාතියට ආශිර්වාද කරමින්**

ජීවත්වෙමින්, දෙවියන්වහන්සේගේ ආශිර්වාද භුක්ති විඳිමු.

**එසේ කිරීමට දෙවියන්වහන්සේ**

**ඔබට පිහිටවන සේක්වා !!**

# සටහන්

# පරාර්ථකාමී ජීවිත ගතකරමු



## රුත්ගේ කථාව - 05

# පරාර්ථකාමී ජීවිත ගත කරමු

**රූත් 3:1-18**

**හැඳින්වීම :-**

පසුගිය අධ්‍යයනයෙහි අපගේ මාතෘකාව වූයේ, **'යටහතුන්ට දෙවියන්වහන්සේ ආශිර්වාදකරනසේක'** යන්නයි. අපගේ ජීවිතවල අපට මුණගැසෙන බොහෝ දෙනා තුළ අපට නිතරම දකින්නට ලැබෙන්නාවූ ගුණාංගයක් වන්නේ උඩඟුකම වන අතර, දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ යටහත්කම පැළඳගැනීමටයි.

එබැවින් උඩඟුකමේ භයානකකම ඔබට පෙන්වාදීම උදෙසා, දේව වචනයෙන් ඒ ගැන පද කිහිපයක් ඔබ ඉදිරියේ තබන්ට කැමැත්තෙමි.

**1 යොහන් 2:16 :-**
**"මක්නිසාද ලෝකයෙහි තිබෙන සියල්ල, එනම්, මාංසයේ තෘෂ්ණාවත් ඇස්වල තෘෂ්ණාවත් ජීවිතයේ අහංකාරකමත් පියාණන්වහන්සේගෙන් නොව ලෝකයෙන් වේ."**

**1 තිමෝති 3:6 :-**
**"ඔහු උඩඟුවී යක්ෂයාට පැමිණි දඬුවමට නොවැටෙන පිණිස අලුත් ගෝලයෙක් නොවිය යුතුය."**

**යාකොබ් 4:6 :-**
**"දෙවියන්වහන්සේ උඩඟුවූවන්ට විරුද්ධව සිට, යටහතුන්ට කරුණාව දෙනසේකැයි ලියවිල්ල කියන්නේය."**

අද දවසේ අප **රූත් 3** අධ්‍යයනය කිරීමට යන අතර, අප එහි දකින්නේ, බෝවස්ගේ, නාඔමිගේ සහ රූත්ගේ පරාර්ථකාමී ක්‍රියාකිරීමයි. මෙම ආදර්ශය අප සැමද අනුගමනය කරමින්, පරාර්ථකාමී ජීවිත ගතකරමු.

<u>අධ්‍යයනය</u> :-

**රූත් 3** අධ්‍යයනය කිරීම උදෙසා අප අදහස් කරන්නේ, එහි පද දෙස අනුපිළිවෙලට බලමින්, පදයෙන් පදය ඔබට පැහැදිලි කර දීමටයි.

❖ **රූත් 3:1 :-" එවිට ඇගේ නැන්දාවූ නායොමි ඈට කථාකොට : මාගේ දියණියෙනි, නුඹට ශුභසිද්ධියක් වෙන පිණිස මා විසින් නුඹට නිවාසයක් සොයන්ට ඕනෑ නොවේද ? "**

**<u>නායොමි පරාර්ථකාමීව ක්‍රියාකිරීම</u>**

දැන් නායොමි නැවත සිටින්නේ, යුදයේ **(ප්‍රශංසා දේශයේ)** බෙත්ලෙහෙමේයි **(ආහාර නිවසේයි)**. දෙවියන්වහන්සේ නැවත දේශයට ආශිර්වාද කොට, වැසි එවා පොළොව සශ්‍රීකකොට, අස්වැන්න කපාගන්නා කාලයේය.

නායොමිට ඇයගේ ස්වාමිපුරුෂයාද පුතුන් දෙදෙනාද නැතිව තිබුණු නමුත්, ඇයට ආහාර හිඟයක් නොතිබුණේය. ඇයට පහසු ජීවිතයක් ගතකිරීමට අවස්ථාවක් දැන් උදාවී තිබුණි.

**මෙනමුත් නායොමි සිතන්නේ ඇයගේ අනාගතයට වඩා රූත්ගේ අනාගතය ගැනයි. ඇය ක්‍රියා කරන්නේ රූත්ගේ අනාගතය වඩා යහපත් බවට පත්කිරීම උදෙසායි.**

**රූත් 2:2 සහ 3:1** වැනි පද කියවන අපට පෙනීයන්නේ නායොමි සහ රූත් යන දෙදෙනාම, තමාට වඩා අනෙකා උතුම් කොට සලකමින්, පරාර්ථකාමීව ක්‍රියාකිරීමයි.

**රෝම 12:10 :- "…. ගෞරවයෙන් <u>තම තමාට වඩා අනික් අය උතුම් කොට සලකාපල්ලා</u>."**

**ගලාති 5:13 :- "…. ප්‍රේමයෙන් <u>එකිනෙකාට සේවයකරන්නෝ වෙයල්ලා</u>."**

❖ **රූත් 3:2,3 :- " [2]…. ඔහු අද රෑ පාවරේ යව පොළන්නේය. [3] එබැවින් නුඹ නා, තෙල්ගාගෙන, නුඹේ වස්ත්‍ර ඇඳගෙන, පාවරට පලයන්න. ඒ මනුෂ්‍යයා කා බී නිමවන තුරු නුඹ දකින්ට ඔහුට ඉඩනාරින්න."**

❖ මෙම පද දෙක තුළින්, ඉශ්‍රායෙල් දේශයේ වසර 3,300 කට පමණ පෙර තිබුණාවූ සිරිත් සමහරක් පිළිබඳව ඉඟියක් අපට දැකගන්ට ලැබේ.

(a) **' ඔහු අද රෑ පාවරේ යව පොළන්නේය '**

පාවරේ යව පොළන්නාවූ කාලයේ පැවතුනාවූ එක පුරුද්දක් නොහොත් සිරිතක් වූයේ, කෙතේ හිමියා තමාට අයිතිවූ ධාන්‍ය ආරක්ෂාකර ගැනීම උදෙසා, පාවරට ආසන්නව රාත්‍රි කාලය ගත කිරීමයි.

එවකට යව පොළනු ලැබුවේ, සුළං ඇති කාලයේ කුලු වලින් අස්වැන්න ඉහලට විසිකිරීම මගිනුයි **(යෙරමියා 15:7a, මතෙව් 3:12, ලූක් 3:17 කියවන්න)**. එසේ කරන විට පිදුරු, බොල් යනාදිය සුළඟට විසිරී ගොස් හොඳ ධාන්‍ය එකතුකර ගැනීමට හැකිවිය.

(b) **' නා, තෙල්ගාගෙන නුඹේ වස්ත්‍ර ඇඳගෙන '**

(Wash and perfume yourself, and put your best clothes) - NIV

නායොමි මෙහි රූත්ට උපදෙස් දෙන්නේ, **' මනාලියක් ලෙස සැරසෙන්න '** කියායි.
(කරුණාකර **එසකියෙල් 16:9-12** කියවා බලන්න)

(c) **' කා බී නිමවන තුරු නුඹ දකින්න ඔහුට ඉඩනාරින්න '**

ඉශ්‍රායෙල් දේශයෙහි අස්වැන්න කපන කාලය මහත් උත්සවශ්‍රීයෙන් පවත්වනු ලැබුවාවූ, ඉතා ප්‍රීතිමත් කාලයක් විය. මෙසේ පුරුෂයින් එකතු වී පාවරය අසල කා බී විනෝද වූ අතර, සාමාන්‍යයෙන් එම අවස්ථාවට කාන්තාවන් එක්වූයේ නැත. එබැවින්, ඉහත සඳහන් අයුරින් නායොමි රූත්ට බෝවස්ගෙන් සැඟවී සිටීමට උපදෙස් දුන් අතර, පසුව බෝවස් ප්‍රකාශ කරන්නේ **' ඒ ස්ත්‍රිය පාවරට ආ බව කිසිවෙකුට නොදැනේවයි '** කියායි. **(රූත් 3:14)**

අස්වැන්න කපන කාලයේ ඉශ්‍රායෙල් සෙනඟ ප්‍රීතිමත් වූ ආකාරය තේරුම්ගැනීම උදෙසා **යෙසායා 9:3** දෙස බලමු.

**යෙසායා 9:3 :-**

**" ඔබ ජාතිය වැඩිකළසේක, ඔබ ඔවුන්ගේ ප්‍රීතිය වර්ධනය-කළසේක. ගොයම් කපන කාලයෙහි සන්තෝෂවන්නාක් මෙන්ද, මනුෂ්‍යයන් කොල්ලය බෙදාගන්න කල ප්‍රීතිවන්නාක්මෙන්ද ඔව්හු ඔබ ඉදිරියෙහි ප්‍රීතිවෙති."**

**රූත් 3:4 :-**

**" ඔහු නිදාගන්න විට, ඔහු නිදාගන්න තැන බලාගන ඇතුළට ගොස් ඔහුගේ පාවැසුම් ඇර නිදාගනින්න ; එවිට නුඹ විසින් කළ යුතු දේ ඔහු නුඹට දන්වනවා ඇතැයි කීවාය."**

යව පොළවන්නාවූ කාලයේ පාවරය අසල, කාන්තා පක්ෂය සාමාන්‍යයෙන් රාත්‍රියේ ගැවසුනේ නැත. එබැවින් නායොමි මෙහිදී රූත් ඉදිරියේ තබන්නාවූ යෝජනාව නොහොබිනා එකක් ලෙස ඔබ දකින්ට පුළුවන.

නායොමි මෙහිදී රූත්ට කරන්නාවූ යෝජනාව නිවැරදිව තේරුම්ගැනීම පිණිස ඉශ්‍රායෙල් දේශයේ එවකට පැවතුනාවූ චාරිත්‍ර සහ දෙවියන්වහන්සේ ඔවුන්ට ලබා දුන්නාවූ නීති දෙස බැලීම උචිත වේ.

(a) **තාමාර් ඇගේ මාමාවූ යුදාගෙන් දරුවෙක් බිහිකිරීම - උත්පත්ති 38:1-26**

මෙම සිද්ධිය දෙස ඔබගේ අවධානය යොමු කරන්නේ, දෙවියන්වහන්සේ මෝසෙස් මගින් ඉශ්‍රායෙල්වරුන්ට දුන්නාවූ නීති සහ උන්වහන්සේගේ සාධාරණ ක්‍රියාකිරීම පෙන්වාදීමේ අදහසිනි.

**ද්විතීය 25:5 :-**

**" සහෝදරයන් එකට වාසයකරන අතර ඔවුන්ගෙන් එක්කෙනෙක් පුත්‍රයෙකු නැතුව මළොත්, මළ අයගේ භාර්යාව අන්‍යවූ පිට කෙනෙකුට සරණ නොවිය යුතුය. ඈගේ පුරුෂයාගේ සහෝදරයා ඈ වෙතට පැමිණ ඈ තමාට භාර්යාව කොට පාවාගෙන පුරුෂයාගේ සහෝදරයෙකුගේ යුතුකම ඈට කෙරේවා."**

**උත්පත්ති 38:1-26** දක්වා සඳහන් කථාවේ, අප දකින්නේ යුදා, ෂුවා නමැති කානානීය කාන්තාවක් සමඟ විවාහ වී, ඒර්, ඕනාන් සහ ෂේලා යන පුතුන් තිදෙනෙකුගේ පියා වූ බවයි. නිසි කාලයේ යුදා තම කුලුඳුලා වූ ඒර්ට තාමාර් නමැති භාර්යාවක් ලබා දුන් අතර, ඒර්ගේ දුෂ්ටකම් නිසා දෙවියන්වහන්සේ ඔහු නැසූ බව දේව වචනයේ සඳහන් වේ. **(උත් 38:7)** දේව නීතිය අනුව තාමාර්ව පාවාගෙන තම සොහොයුරාගේ නාමය ඉදිරියට ගෙන යෑම ඕනාන් වෙත පැවරුනු නමුත්, එසේ කිරීම ඕනාන් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුකොටගෙන දෙවියන්වහන්සේ විසින් ඕනාන්වද මරණයට පත්කරන ලදී. **(උත් 38:9,10)**

දේව නීතිය අනුව ෂේලාව තාමාර්ට පාවාදීම යුතුව තිබුණු අතර, යුදා ෂේලාගේ අඩු වයස නිසා එසේ කිරීම කල්දමා එය මඟහැරීමට ක්‍රියා කළේය. මෙසේ අසාධාරණයට ලක්වූ තාමාර්, වේශ්‍යා ස්ත්‍රියක ලෙස වෙස්වලාගෙන, යුදාගෙන් පෙරෙශ් සහ ශෙරා යන නිඹුල් පුතුන් දෙදෙනෙක් වැදුවාය **(උත් 38:26-29). අපගේ අති සාධාරණවූ දෙවියන්වහන්සේ තාමාර්ගේ නම, යේසුස් - වහන්සේගේ පෙළපතට ඇතුළත් කළ සේක. (මතෙව් 1:3).**

**මතෙව් 1:1 :- "ආබ්‍රහම්ගේ පුත්‍රයා වන දාවිත්ගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පරම්පරාවේ පොතය."**

**මතෙව් 1:3 :- "යුදාට දාව තාමාර්ගෙන් පෙරෙශ්ද ශෙරාද උපන්නෝය ; ....."**

(b) **බෝවස්ගේ ' පාවැසුම් ඇරීමට ' නායොමි රූත්ට උපදෙස් දීම**

මෙය තේරුම්ගැනීම උදෙසා **රූත් 4:7** වෙත ඔබගේ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි.

**රූත් 4:7 :- "පෙර කාලයේ මුදාගැනීමද හුවමාරු කරගැනීමද ගැන සියලු කාරණා ඉශ්‍රායෙල්වරුන් අතරේ ස්ථිරකිරීමේ සිරිත මෙසේය : එක්කෙනෙක් තමාගේ මිරිවැඩිය ගළවා අනික් අයට දෙන්නේය. ඒක ඉශ්‍රායෙල්වරුන් අතරේ සහතික කිරීමේ විධියව තිබුණේය."**

එබැවින්, නායොමි දුන් උපදෙස් වල අරමුණ වූයේ, ළඟ නෑයාගේ වගකීම ඉටුකිරීමට බෝවස්ට ආරාධනා කිරීමයි.

<u>**වැදගත් සටහනක්**</u>

නායොමිගේ ක්‍රියාකිරීම මගින් අප දකින්නේ,

(i) ඇය ' **මිදීම සිදුකරන ළඟම නෑයා** ' සම්බන්ධයෙන් තම අයිතිවාසිකම් හොඳ හැටි දන සිටි බවයි.

(ii) එම අයිතිවාසිකම් ලබා ගැනීම පිණිස, ඇය රූත්ට උපදෙස් දෙමින්, සූදානම් කළ බවයි.

(iii) ඒවා ලබා ගැනීම පිණිස ඈ ඇදහිල්ලෙන් ක්‍රියා කළ බවයි.

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, **රූත්ගේ කථාවේ** පළමුවැනි අධ්‍යයනයෙහි අප ඉගෙනගත් ආකාරයට, **යේසුස්වහන්සේ ඔබව මුදවා ගත්තාවූ ඔබගේ ළඟ නෑයා වනසේක.**

එබැවින්, මෙම හේතුවෙන් දේව දරුවන් වන්නාවූ අපට හිමි

- අයිතිවාසිකම් ඔබ දන්නවාද ?
- ඔබට භුක්ති විඳින්ට දෙවියන්වහන්සේ ලබාදී ඇති පොරොන්දු ඔබ දන්නවාද ?
- ඔබ එම පොරොන්දු විශ්වාස කරනවාද ?
- එම පොරොන්දු වලින් බොහෝ පොරොන්දු කිතුනුවන්ගෙන් විශාල සංඛ්‍යාවක් නොලබන්නේ ඇයි ?

යන ප්‍රශ්න ඔබගෙන් අසන්ට කැමැත්තෙමි.

අපට හිමි ආශිර්වාද සමහරක් හඳුනාගැනීම උදෙසා **ගීතා 23** දෙස බලමු.

**ගීතා 23 : 1 :- " ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය."**

දේව දරුව, ඔබගේ ජීවිතයේ ස්වාමීත්වය දෙවියන් - වහන්සේට ඔබ සැබවින්ම භාර දී තිබෙනවාද ?

එසේ නම් උන්වහන්සේ ඔබගේ එඬේරා වනසේක. එම එඬේරා ඔබට,

- **මඟ පෙන්වන සේක.**
- **ඔබගේ හිඟකම් සම්පූර්ණ කරන සේක. (ගීතා 23:1)**
- **ඔබව පෝෂණය කරනසේක. (ගීතා 23:2)**
- **ඔබට සමාදානය දෙනසේක (ගීතා 23:2)**
- **ඔබව ආත්මිකව ශක්තිමත් කරන සේක. (ගීතා 23:3)**
- **ඔබව ආරක්ෂා කරන සේක. (ගීතා 23:4)**
- **ඔබව අත්නාරිනසේක. (ගීතා 23:4)**
- **ඔබව සනසන සේක. (ගීතා 23:4)**
- **සතුරන් මධ්‍යයේ දී පවා ඔබ ඔසවන සේක. (ගීතා 23:5)**
- **ඔබව ආලේපකරන සේක. (ගීතා 23:5)**
- **ඔබට අධික ලෙස ආශිර්වාද කරන සේක. (ගීතා 23:5)**
- **ඔබට සදාකාල ජීවනය/ස්වර්ගයේ පුරවැසිකම දෙනසේක. (ගීතා 23:6)**

දේව දරුවෙනි, දේව දරුවන් ලෙස අපට හිමිවී තිබෙන්නාවූ අයිතිවාසිකම්/ආශිර්වාද/පොරොන්දු හඳුනාගෙන, ඒවා භුක්ති විඳිමින් දෙවියන්වහන්සේගේ නාමය ගෞරවයට පමුණුවමු !!

**රූත් 3 : 5 :-**

**" නුඹ මට කියන සියල්ල කරන්නෙමියි ඈ ඇට කීවාය."**

ඉහත සඳහන් අයුරින්, නායොමි දුන්නාවූ සියලු උපදෙස් අනුව ක්‍රියාකිරීමට රූත් පොරොන්දු වී, එලෙසම කළාය.

සමහරවිට නායොමි දුන් සමහර උපදෙස්, අන්‍යජාතිකයෙක්ව සිටියාවූ රූත්ට, **'හොඳ නැති/පාපිෂ්ට/නොගැලපෙන'** ඒවා ලෙස පෙනෙන්නට ඇත. එය කෙසේ වුවත් රූත් තීරණය කළේ නායොමි කෙරෙහිද, නායොමිගේ දෙවියන්වහන්සේ කෙරෙහිද සම්පූර්ණ විශ්වාසය තබා, ක්‍රියාකිරීමටයි.

මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, සහෝදරියෙනි, **දෙවියන් - වහන්සේගේ දරුවන්ගේ උපදෙස් තුළින්, බොහෝ අවස්ථාවන්හිදී උන්වහන්සේ අපට මඟපෙන්වනසේක.**

සමහරවිට, එලෙස අප ලබන්නාවූ උපදෙස්, අපගේ පුද්ගලික බලාපොරොත්තු වලට වඩා, අප දරන්නාවූ අදහස්වලට වඩා වෙනස්විය හැක. එවැනි අවස්ථාවලදී යක්ෂයා බොහෝවිට අපව පොළඹවන්නේ, ඔවුන්ගේ උපදෙස් නොසලකා, **' අපගේ නුවණ '** අනුව ක්‍රියාකිරීමටයි.

දේව දරුව, දෙවියන්වහන්සේට කීකරුව ජීවත්වෙමින්, උන්වහන්සේගේ ප්‍රේමය දක්වමින් ක්‍රියාකරන්නාවූ කිතුනුවන්ගේ උපදෙස්, **' එයා දන්නේ මොනවාද ? '** කියා සිතමින්, ප්‍රතික්ෂේප නොකරන්න. මෙසේ කිරීමට යක්ෂයා යොදාගන්නාවූ උපාය මාර්ගය වන්නේ, **උඩඟුකම අප තුළ ඇතිකරවමින්, අන් අයට වඩා අප ඥානවන්ත වන බව අපට කොඳුරමින්, අපව මුලාකිරීමේ මාර්ගයයි.**

දේව දරුව, මෙය අමතක නොකරන්න. යටහත් සිත් අපට දෙන්නේ දෙවියන්වහන්සේ වන අතර, යක්ෂයා අපගේ සිත් තුළ ඇතිකිරීමට උත්සාහ කරන එක් දෙයක් වන්නේ උඩඟුකමයි. එබැවින් මෙවැනි අවස්ථාවකදී **හිතෝපදේශ 3:5,6** හි සඳහන් දේව උපදෙස් අනුව ක්‍රියාකරන ලෙස ඉතා ඕනෑකමින් ඔබගෙන් ඉල්ලා සිටිමි.

**රූත් 3:6,7 :- " [6] ඈ පාවරට ගොස් ඇගේ නැන්දා ඈට අණකළ සියල්ල ලෙස කළාය. [7] බෝවස් කා බී ඔහුගේ සිත ප්‍රීතිවූ කල, ඔහු ධාන්‍ය ගොඩේ කෙළවරෙහි නිදාගන්ට ගියේය. ඈද හෙමින් අවුත් ඔහුගේ පාදවලින් වැස්ම ඇර නිදාගත්තාය."**

ඉහත සඳහන් අයුරින් ක්‍රියාකිරීම නිසැකවම රූත්ට ඉතා අසීරු වෙන්ට ඇත. වැන්දඹුවක් වූ ඇය දැන් සැරසී සිටින්නේ මනාලියක් ලෙස වූ අතර, කාන්තාවන් නොගැවසෙන ස්ථානයක රාත්‍රි කාලය **'කා බී විනෝදවන'** පුරුෂයන් ළඟින් සිටිමින්, ඔවුන්ගෙන් සැඟවී සිටීමටද ඇයට සිදුවිය. සැමදෙනා නිදාගත් පසු හෙමින් පැමිණ, බෝවස්ගේ පාදවලින් වැස්ම ඇර ඔහුගේ පාද ළඟ නිදාගැනීම ඇයට පැවරුනු ඊළඟ කාර්යයයි.

**මේ අයුරින් ක්‍රියාකිරීම කෙතරම් අමාරු වුවත්, රූත් මෙහි ක්‍රියා කරන්නේ, රූත් 1:16,17 හි ඈ කළාවූ පොරොන්දුව ඉටුකරමිනුයි.**

මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, සහෝදරියෙනි, ඔබ කවදා හෝ, ඔබගේ ජීවිතය දෙවියන්වහන්සේට භාරකරන්ටද, උන්වහන්සේ උදෙසා ජීවත්වෙන්ටද පොරොන්දුවක් වූවා විය හැක.

**ඔබ එසේ උන්වහන්සේට පොරොන්දු වී ඇත්නම්, කරුණාකර එම පොරොන්දුව ලෙස ක්‍රියා කරන්න/ජීවත්වෙන්න/එය ඉටුකරන්න.**

**ඔබ එසේ කැපවීමක් ඔබගේ ජීවිතයේ කර නොමැතිනම්, අදම, ඔබගේ ජීවිතයට උන්වහන්සේව පිළිගනිමින් දේව දරුවෙක් බවට පත්වන්න. (යොහන් 1:12)**

**රූත් 3:9 :-**

**" ඈද : මම ඔබගේ මෙහෙකාරීවූ රූත්ය ; එබැවින් <u>ඔබගේ වස්ත්‍රය ඔබගේ මෙහෙකාරී පිට අතුරනු මැනවි</u> ; මක්නිසාද ඔබ ළඟනෑයෙකැයි කීවාය."**

අප මීට ප්‍රථමයෙන් පහදා දුන් ආකාරයට, ' **බෝවස්ගේ පාදවලින් වැස්ම ඇරීම** ' තුළින් රූත් කරන්නේ, ළඟ නෑයාගේ වගකීම ඉටුකිරීමට බෝවස්ට ආරාධනා කිරීමයි.

අප විසින් දැන් කළ යුතුව තිබෙන්නේ, ' **ඔබගේ වස්ත්‍රය ඔබගේ මෙහෙකාරිය පිට අතුරනු මැනවි** ' කියා රූත් පැවසූ වචන නිවැරදිව තේරුම් කරදීමයි.

දේව වචනයේ මෙහි අරුත සොයන අප දකින්නේ, <u>මෙම වචන වලින් ප්‍රකාශවන්නේ විවාහ යෝජනාවක් වන බවයි</u>. මෙය ගැන වඩා හොඳ අවබෝධයක් ලබන පිණිස **එසකියෙල් 16:8** දෙස බලමු.

**එසකියෙල් 16:8 :-**

**"..... නුඹේ කාලය වන ප්‍රේමයේ කාලය පැමිණී තිබෙන බව දැක, <u>මාගේ වස්ත්‍රය නුඹ පිට අතුරා</u>, ..... නුඹට දිවුරුම්දී, නුඹ සමග ගිවිසුමක් කරගත්තෙමි, නුඹද මට අයිතිවූයෙහියයි ස්වාමිවූ දෙවියන්වහන්සේ කියනසේක."**

දෙවියන්වහන්සේ, එසකියෙල් අනාගතවක්තෘතුමා තුළින් ඉශ්‍රායෙල් ජාතියට ප්‍රකාශකරන්නේ උන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය භාර්යාවක් ලෙස තෝරාගත් බවයි. මේ අනුව මෙහිදී රූත් බෝවස්ට දුන්නාවූ පණිවිඩය වූයේ, **' ඔබ මාගේ ළඟ නෑයෙක් වන බැවින්, මා ඔබ වෙත ගෙනෙන විවාහ යෝජනාව පිළිගන්න '** යන පණිවිඩය වේ.

**රූත් 3:9** හි **' වස්ත්‍රය අතුරනු මැනවි '** ලෙස සඳහන් වචන, බයිබලයේ ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ, ' Spread the corner of your garment over me ' (NIV) යනුවෙනුයි. එනම් **' වස්ත්‍රයේ කොන අතුරනු මැනවි '** යනුවෙනි.

වස්ත්‍රයේ කොන් වලට, 'corners' නොහොත් 'wings' ලෙසද සඳහන් වන අවස්ථා ඇති අතර, රූත් මෙහි පවසන්නේ,

**' වස්ත්‍රයේ පියාපත් ' ඔබගේ මෙහෙකාරිය පිට අතුරනු මැනවි** යන අරුත ඇති වචනයි.

මෙම වචන වලින් ප්‍රකාශවන්නාවූ සැබෑ අරුත අපට තේරුම්ගත හැකිවන්නේ දේව වචනයේ **' පියාපත් '** යන වචනය භාවිතාවන අන්දම දෙස බැලීමෙනි.

**රූත් 2:12 :-**

**" ස්වාමීන්වහන්සේ නුඹේ ක්‍රියාවට විපාක දෙනසේක්වා, ඉශ්‍රායෙල්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ පියාපත් යටතේ ආරක්ෂාවී සිටින්ට ආවාවූ නුඹට උන්වහන්සේගෙන් සම්පූර්ණ විපාකයක් ලැබේවයි ඈට කීවේය."**

මෙම වචන, බෝවස් විසින් රූත්ට මීට ප්‍රථම අවස්ථාවකදී ප්‍රකාශ කරන ලද වචන වේ. **'පියාපත්'** වල අරුත **ගීතාවලිය පොතෙන්** වැඩි දුරටත් පෙනේ.

**ගීතාවලිය 36:7 :-**

**"දෙවියන්වහන්ස, ඔබගේ කරුණාගුණය කොපමණ අනර්ඝද? මනුෂ්‍ය පුත්‍රයෝ ඔබගේ පියාපත් සෙවණෙහි ආරක්ෂාව ලබති."**

**ගීතාවලිය 17:9 :- '' ඇසේ කළුරුවාව මෙන් මා රක්ෂා - කළ මැනව, ඔබගේ <u>පියාපත් සෙවණෙහි මා සඟවාගත මැනව</u>.''**
(කරුණාකර **ගීතාවලිය 57:1, 61:4, 91:4** කියවා බලන්න)

ඉහත සඳහන් සියලු කරුණු එකට ගොනු කරගත් විට අප දකින්නේ ඉතා අලංකාර සත්‍යයකි. එනම් **දෙවියන්-වහන්සේගේ පියාපත් සෙවනෙහි** යනුවෙන් ඉදිරිපත් කරුණු ලබන්නේ, **දෙවියන්වහන්සේ තුළ අපට ඇත්තාවූ සුවිශේෂ ආරක්ෂාව යන අදහස වන බැවින්,** රූත්ගේ වචනවලින් ඇය බෝවස්ට ඉතා අලංකාර ලෙස මතක් කර දෙන්නේ -

**බෝවස් දෙවියන්වහන්සේගේ පියාපත් සෙවනේ ඇති ආරක්ෂාව ළඟ නෑයා ලෙස රූත්ට ලබා දිය යුතු බවයි.**

**රූත් 3:11 :- '' දැන් මාගේ දියණියෙනි, භයනොවෙන්න ; නුඹ කියන සියල්ල නුඹට ඉෂ්ටකරන්නෙමි. මක්නිසාද මාගේ නුවර සියලු මනුෂ්‍යයෝ නුඹ සුශීලවත් ස්ත්‍රියක් බව දනිති.''**

ඉහත සඳහන්වන්නාවූ රූත්ගේ ඉල්ලීමට බෝවස්ගේ ප්‍රතිචාරය වන්නේ, ඔහු රූත් උදෙසා, කිරීමට අවශ්‍ය වන්නාවූ සෑම දෙයක්ම ඉෂ්ටකිරීමට සූදානම්ව සිටින බවයි. එනම් ඔහු ළඟ නෑයා ලෙස, රූත්ව මුදවාගැනීම උදෙසා ඔහු විසින් කළ යුතු සියලු දෙයක්ම කිරීමට සූදානම් බවයි.

**<u>ගෝයෙල් නීතිය අනුව මුදවා ගන්නාට තිබිය යුතු අත්‍යවශ්‍යය සුදුසුකම්</u>**

(i) ඔහුට මුදවා ගැනීමේ <u>අයිතිය</u> තිබිය යුතු වේ. එනම් ඔහු මුදවාගනු ලබන්නාගේ ළඟ නෑයෙක් විය යුතුයි.

(ii) ඔහුට මුදවා ගැනීමේ <u>බලය</u> තිබිය යුතු වේ. එනම් මුදවා ගැනීම උදෙසා ගෙවිය යුතු මිලය/ධනය/මුදල ගෙවීමට හැකියාව තිබිය යුතු වේ.

(iii) ඔහු මුදවා ගැනීමට <u>කැමැත්ත</u> තිබිය යුතුවේ. එනම් එසේ කිරීම උදෙසා අවශ්‍ය මිලය ගෙවීමට/කැපවීම කිරීමට සූදානම් කෙනෙක් විය යුතුවේ.

ඉහත සඳහන් සියලුම සුදුසුකම් බෝවස්ට තිබුණු නමුත්, බෝවස්ට වඩා නායොමිට ළඟ නෑකමක් තිබුණු තවත් පුද්ගලයෙක් සිටියේය (**රූත් 3:12**). එම ළඟ නෑයාට රූත්ව ගලවා ගැනීමට අයිතියද, බලයද (හැකියාවද) තිබුණු නමුත්, එසේ කිරීමට කැමැත්ත ඔහුට නොතිබුණේය.

**<u>අපව ගලවාගැනීමට යේසුස්වහන්සේගේ සුදුසුකම දෙස බලමු</u>**

(i) **අපව මුදවාගැනීමට යේසුස්වහන්සේගේ අයිතිය**

(a) උන්වහන්සේ දෙවියන්වහන්සේගේ රූපාකාරය දරන දේව පුත්‍රයා වනසේක.

**පිලිප්පි 2:6 :-" උන්වහන්සේ දෙවියන්වහන්සේගේ රූපාකාරය දරනසේක් ...."**

(b) එසේ කිරීම උදෙසා උන්වහන්සේ කුරුසියේ මරණය දක්වා කීකරු වූ සේක.

**පිලිප්පි 2:8 :- ".... මරණය, එසේය, කුරුසියේ මරණය දක්වා කීකරුවූසේක."**

(c) දෙවියන්වහන්සේ සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක.

**පිලිප්පි 2:9 :- "එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක."**

(ii) **අපව මුදවා ගැනීමට යේසුස්වහන්සේට ඇත්තාවූ බලය**

**මාර්ක් 2:10,11 :- "[10] නුමුත් පොළොවේදී පව් කමාකරන්ට මනුෂ්‍ය පුත්‍රයාට බලය ඇති බව නුඹලා විසින් දැනගන්නා පිණිසය කියා, උන්වහන්සේ අංශභාග රෝගියාට කථාකොට : [11] නැගිට නුඹේ යහන රැගෙන ගෙදර පලයන්නැයි නුඹට කියමියි කීසේක."**

(iii) **අපව මුදවා ගැනීමට යේසුස්වහන්සේගේ කැමැත්ත**

**යෙරමියා 18:4 :- " ඔහු සෑදු මැටිභාජනය කුම්භකාරයාගේ අතේ නරක්වූ කල, නැවත ඒක සාදන්ට කුම්භකාරයාට හොඳව පෙනුණු ලෙස, ඔහු එයින් වෙන භාජනයක් සෑදුවේය."**

මාගේ ප්‍රේමවන්ත සහෝදර සහෝදරියෙනි, මෙය කියවන්නාවූ ඔබ අද සිටින්නේ කුමන ස්ථානයකද කියා මා නොදනිමි. මෙනමුත් එක දෙයක් මා දනිමි. **එනම්, අපගේ කැඩුනු, බිඳුනු, පළුදු වුනු, තුවාල වුනු ජීවිත නැවත යතා තත්ත්වයට ගෙන ඒමටද, අපගේ බලාපොරොත්තු සුන් වූ, අතරමං වූ ජීවිත මුදවා ගැනීමටද අලුත් වැඩියා කිරීමටද,** අපගේ මිදුම්කරුවා වන්නාවූ, කුම්භකාරයා වන්නාවූ යේසුස්වහන්සේට/දෙවියන්වහන්සේට **අයිතියද, බලයද කැමැත්තද ඇතිසේක.**

එබැවින් අප, රූත් බෝවස්ගෙන් ඉල්ලා සිටි අන්දමට, දෙවියන්වහන්සේ වෙත පැමිණ, උන්වහන්සේගේ **'පියාපත් සෙවණේ රැකවරණය'** අපට ලබාදෙන මෙන් යටහත්ව ඉල්ලා සිටිමු. අප එසේ කළවිට, උන්වහන්සේ අපව පිළිගෙන අප ඉල්ලනවාටත් වැඩියෙන් අපට ලබාදෙන සේක.

**<u>මුදවා ගැනීමට අමතරව බෝවස් රූත් උදෙසා කළදේ</u>**

(i) ඔහු ඇයට ආශිර්වාද කළා (ඇයට ආශිර්වාද කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටියා) - **රූත් 3:10**

(ii) ඔහු ඇයට අයිති ප්‍රමාණයට වඩා, අවශ්‍ය ප්‍රමාණයට වඩා, ඉල්ලූ ප්‍රමාණයට වඩා ලැබෙන්නට සැලැස්වූවා.

**රූත් 3:15 :- "තවද ඔහු : නුඹ පොරවා සිටින සළුව මෙහි ගෙනත් අල්ලාපන්නැයි කීවේය ; ඈ ඒක අල්ලූ කල යව නැළි හයක් මැන ඈ පිට තබා නුවරට ගියේය."**

(කරුණාකර **ගීතාවලිය 81:10, එපීස 3:20** කියවා බලන්න)

දේව දරුව, මෙය වටහාගන්න. ඇයගේ ජීවිතය ආශිර්වාද වලින් පිරී ඉතිරී ගියාවූ ජීවිතයක් වීම උදෙසා, රූත්ට බෝවස් වෙත පැමිණ ඇයගේ ජීවිතය ඔහුට භාරදීමට තිබුණි.

අප සැමද අපගේ ජීවිත දෙවි සමිඳුන්ට භාරදී, යටහත්වද, **විශ්වාසවන්තවද උන්වහන්සේගේ සේවයේ යෙදී** සිටිමින්, උන්වහන්සේගේ ආශිර්වාද භුක්ති විඳිමු. (**එළිදරව් 2:10,26** හි අපට හිමිවන අනාගත ආශිර්වාද සමහරක් සඳහන් වේ)

## බෝවස් පරාර්ථකාමීව ක්‍රියා කිරීම

(a) ඔහු සැමවිටම ක්‍රියා කළේ, තමාට වඩා රූත් ගැන සිතා බලා වූ අතර, ඔහු කිසිසේත් ඇය සිටි තත්ත්වයෙන් අයුතු ප්‍රයෝජන ගැනීමට තැත් නොකළේය. **(රූත් 3:13)**

- දේව දරුව, ඔබ හිඟකමට, අසරණ භාවයට, වැටුණු අයගෙන් අයුතු ප්‍රයෝජන ගන්නවාද ?

(b) ඔහු රූත්ගේ නම අපකීර්තියට පත්වීමට ඉඩ කඩ සැලැස්වූයේ නොමැත. **(රූත් 3:14)**

- දේව දරුව, ඔබ අන් අයගේ හොඳ නම කෙලෙසන අන්දමින් ක්‍රියාකරනවාද ?

(c) ඔහු, ඔහුටත් වඩා ළඟ නෑයාගේ අයිතිවාසිකම් උදුරා ගැනීමට තැත් නොකළේය. **(රූත් 3:13)**

- දේව දරුව, ඔබගේ වාසිය ගැන සිතා, ඔබ දේව නීති සැහැල්ලුවට ගන්නා අවස්ථා තිබෙනවාද ?

(d) ඔහු ඔහුගෙන් උපකාර ඉල්ලුවාවූ රූත්ව හිස් අතින් නොයැව්වේය. **(රූත් 3:17)**

- දේව දරුව, ඔබ අසරණ වූවන්ට ත්‍යාගශීලීවද, නොමසුරුවද දෙනවාද ?

ප්‍රේමණීය දේව දරුවෙනි, අප සැමද පරාර්ථකාමීව ජීවත්වෙමු. අපගේ ජීවිතවල -

ප්‍රථම ස්ථානය දෙවියන්වහන්සේටද,
දෙවන ස්ථානය අන් අයටද,
අන්තිම ස්ථානය අපටද දෙමු.

**එවිට දෙවියන්වහන්සේ අපට ලබාදෙන්නාවූ, සතුට සහ සමාදානය** අධිකලෙස භුක්ති විඳිමු.

**එසේ ජීවත්වීමට, දෙවියන්වහන්සේ**

**ඔබට පිහිටවනසේක්වා !!**

# සටහන්

# සටහන්

# පරාර්ථකාමිවූවන් වෙත

# දෙවියන්වහන්සේ ආශිර්වාද වගුරුවනසේක



## රූත්ගේ කථාව - 06

# පරාර්ථකාමිවූවන් වෙත දෙවියන්වහන්සේ ආශිර්වාද වගුරුවනසේක

## රූත් 4:1-22

**<u>හැඳින්වීම</u> :-**

අද අප වෙසෙන්නාවූ සමාජයේ අති බහුතරයක් ක්‍රියා කරන්නේ ඉතාමත්ම ආත්මාර්ථකාමීව බව, අප කාටත් පැහැදිලිව පෙනෙන්නාවූ කරුණකි. මෙවැනි සමාජයක වෙසෙන්නාවූ, දේව දරුවන් වන්නාවූ අපට දේව වචනය උගන්වන්නේ, යේසුස්වහන්සේගේ අඩිපාරේ යන්ට කියායි.

**1 පේත්‍රුස් 2:21 :- "....මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ නුඹලා නිසා වධවිඳ, නුඹලා උන්වහන්සේගේ අඩි පාරේ යන පිණිස නුඹලාට ආදර්ශයක් දී ගියසේක."**

ප්‍රේමවන්ත දේව දරුවෙනි, මෙය තේරුම් ගන්න. අපගේ පියවූ දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ, අප වෙනුවෙන් තම ජීවිතය පූජා කළාවූ, යේසුස්වහන්සේගේ ආදර්ශය අනුව ජීවත්වන ලෙසයි.

වර්තමානයේ අප වෙසෙන්නාවූ ආත්මාර්ථකාමී සමාජයේ, මෙවැනි පරාර්ථකාමී ජීවිතයක් ගතකිරීමේ අභියෝගය විශාලවූ එකකි. මෙනමුත් එම අභියෝගය ජයගෙන පරාර්ථකාමී ජීවිතයක් අප ගතකරන්නේ නම්, එහි විපාකය නිසැකව අති සුවිශේෂ වන බව නිසැකය. මෙම සත්‍යතාවය හොඳහැටි තේරුම්ගැනීම උදෙසා, යේසුස්වහන්සේ ලැබූ විපාකය ගැන, දේව වචනයේ ලියැවී ඇති වදනක් දෙස බලමු.

**පිලිප්පි 2:5-9 :- " [5] <u>ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා</u> ..... [6] ....දෙවියන්වහන්සේට සමානව සිටීම තමන් විසින් අල්ලාගනම සිටිය යුතුවූ වස්තුවකැයි නොසිතා, [7] එය ඉවත්කර, දාසයෙකුගේ ස්වරූපය ගෙන, මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණිසේක. [8] .... [9] ......<u>එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක</u>."**

අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේ, උන්වහන්සේට හිමිවූ සග සැප අතහැර අප උදෙසා දිවි පිදීමට වඩා පරාර්ථකාමී ක්‍රියාවක්, පොළොවෙහි සිදුවී නොමැති අතර, එම ක්‍රියාව උන්වහන්සේට හිමිකර දුන්නේ පොළොවේ වඩාත්ම උසස්වූ නාමයයි.

**පිලිප්පි 2:5** හි සඳහන් ලෙස, **'ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා'** යන්න මාගේ යාච්ඤාවයි.

**අධ්‍යයනය :-**

1. **ආත්මාර්ථකාමී ජීවිත තෘප්තිය ගෙන දෙන්නේ නොමැත**

(i) **එලිමෙලෙක්ගේ ජීවිතය - රූත් 1:1-5**

(A) අප මීට ප්‍රථමයෙන් සඳහන් කළ ආකාරයට, එලිමෙලෙක් යන නාමේ අර්ථය වන්නේ, **'මාගේ දෙවියන්වහන්සේ මාගේ රජතුමා වේ'** යන්නයි.

මෙනමුත් **රූත් 1:1** කියවන අප දකින්නේ, දේශයේ සාගතයක් ඇතිවූ අවස්ථාවේ, ඔහු ක්‍රියා කළේ දෙවියන්වහන්සේගේ කැමැත්තට පටහැනිව බවයි. එලිමෙලෙක් යන ඉතා අර්ථවත් නමක් තිබුණාවූ ඔහු එම අවස්ථාවේදී ක්‍රියා කළේ, ඔහුගේ නාමේ අරුතට පටහැනිවයි.

තම දේශය අතහැර, මෝවබ් දේශයට තම පවුල සමඟ යෑමට එලිමෙලෙක් එදා ගත්තාවූ තීරණය, ඉතාමත්ම ආත්මාර්ථකාමී තීරණයක් බව, අප **රූත්ගේ කථාවේ 2 වෙන අධ්‍යයනයෙහිදී** අප ඉගෙන ගතිමු.

මෙසේ එලිමෙලෙක් ගත්තාවූ ආත්මාර්ථකාමී තීරණය සමඟ **'ගිඩියොන්'** ගත්තාවූ එක් තීරණයක් වෙත ඔබගේ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි.

## ගිඩියොන්ගේ තීරණය

ගිඩියොන්ව දෙවියන්වහන්සේ කැඳවා, ඔහු මගින් මිදියන්වරුන්ට විරුද්ධව ඉශ්‍රායෙල්වරුන්ට මහත් ජයග්‍රහණයක් ලබාදුන්නාවූ අවස්ථාවේ, ඉශ්‍රායෙල් මනුෂ්‍යයෝ ගිඩියොන්ට සහ ඔහුගේ පරම්පරාවට ඉශ්‍රායෙල් කෙරෙහි ආණ්ඩුකාරකම **(රජෙකුට මෙන් පාලනය)** භාරදීමට තැත් කළහ. **(විනිශ්ච 8:22)** එම අවස්ථාවේදී ගිඩියොන් ප්‍රකාශ කළ වචන පහත සඳහන් වේ.

**විනිශ්ච 8:23 :- " ගිඩියොන් ඔවුන්ට කථාකොට : මම නුඹලා කෙරෙහි ආණ්ඩු නොකරන්නෙමි, මාගේ පුත්‍රයාවත් නුඹලා කෙරෙහි ආණ්ඩුනොකරන්නේය ; <u>ස්වාමීන්වහන්සේ නුඹලා කෙරෙහි ආණ්ඩුකරනසේකැයි කීවේය</u>."**

එලිමෙලෙක් සහ ගිඩියොන් ගත්තාවූ තීරණ දෙක අතර ඇත්තාවූ අති විශාල වෙනස ඔබට පෙනෙනවායි සිතමි.

මාගේ ප්‍රේමවන්ත සොයුරු සොයුරියනි, දෙවි සමිඳුන්ට අපගේ ජීවිත භාරදෙමින්, දේව දරුකමට ඇතුල්ව සිටින්නාවූ අප සැම, අපගේ ජීවිතවල **'රජතුමා'** , **'ආණ්ඩුකාරතුමා'**, **'ස්වාමීන්වහන්සේ '** ලෙස, උන්වහන්සේ පත්කර ගනිමු. උන්වහන්සේගේ කැමැත්තට අපගේ කැමැත්ත යටත්කරමු. අපගේ ජීවිතවලින් ආත්මාර්ථ - කාමීකම තුරන් කිරීමට උත්සාහ කරමු.

(B) එලිමෙලෙක්ගේ ආත්මාර්ථකාමී ක්‍රියාකිරීම හේතුකොට-ගෙන ඔහුට සහ ඔහුගේ පවුලට අත්වුණාවූ ඉරණම දෙස මොහොතකට බලමු. එය නම්,

(a) මුලු පවුලට ඔවුන්ගේ දේශයෙන්ද, ජාතියෙන්ද, දේව නමස්කාරයෙන්ද ඈත්වී, රූප වන්දනා කරන්නාවූ සෙනඟක් අතරෙහි ජීවත්වීම.

(b) මාලොන් සහ කිලියොන් නම් වූ, එලිමෙලෙක්ගේ පුතුන් දෙදෙනා, දෙවියන්වහන්සේව නාඳුනන්නාවූ මෝවබ් ස්ත්‍රීන් සමඟ විවාහවීම.

(c) එලිමෙලෙක්ද, මාලොන්ද, කිලියොන්ද, මෝවබ් දේශයට පැමිණ දස වසරක් වැනි කාලයක් ඇතුලත මරණයට පත්වීම.

(d) එලිමෙලෙක්ගේ බිරිඳ වූ නායොමි තමාගේ පුතුන් දෙදෙනා තරුණ වියේදී මියයෑම මුහුණදීමට සිදුවූ, වැන්දඹුවක් බවට පත්වී, විදේශ රටක අන්ත අසරණ තත්ත්වයට වැටීම.

(e) දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් දේශයේ මෙම පවුලට ලබාදුන්නාවූ උරුමය, ඔවුන්ගෙන් ගිලීයෑමේ උවදුරට ඔවුන් පත්වීම.

(f) වසර දසයක් පමණ කාලයකට, මුලු පවුලට **ලෙවී 23** හි සඳහන්වන්නාවූ **' ස්වාමීන්වහන්සේගේ මංගල්‍යයන් '** නිසි ලෙස පැවැත්වීමට නොහැකි වීම.

එලිමෙලෙක්ගේ ආත්මාර්ථකාමී තීරණය හේතු - කොටගෙන, ඔහුට සහ ඔහුගේ පවුලට හිමිවූ දරුණු විපාක තේරුම්ගනිමින්, අප සැම යේසුස්වහන්සේගේ ආදර්ශය අනුගමනය කරමින්, පරාර්ථකාමීවූ ජීවිත ගත කරමු.

(ii) **<u>ඕර්පාගේ ජීවිතය - රූත් 1:7-14</u>**

දේව වචනයේ සඳහන් ආකාරයට පෙනී යන්නේ, නැවත යුදා දේශය වෙත හැරී ඒමට නායොමි තීරණය කළ විට, වැන්දඹු බාවයට පත්ව සිටියාවූ ඕර්පා සහ රූත් යන ඇයගේ ලේලියන් දෙදෙනාද ඈ සමඟ පිටත්වීමට සූදානම්ව සිටිය බවයි.

**රූත් 1:7 :- " ඈද ඈ සමග ඇගේ යෙහෙළීන් දෙදෙනාද තමුන් සිටි තැනින් පිටත්ව ගොස් යූදා දේශයට හැරී එන පිණිස ගමන්ගත්තෝය."**

ඕර්පා මේ අන්දමින් යුදා දේශයට යෑමට සූදානම්ව සිටි නමුත්, සැමවිටම පරාර්ථකාමීව ක්‍රියා කළාවූ නායොමි, ඇයගේ ලේලියන් දෙදෙනාගෙන් ඉල්ලා සිටියේ, ඔවුන්ගේ දෙමවුපියන්ගේ නිවෙස්වලට හැරී යන ලෙසයි. ඈ තවදුරටත් ඔවුන්ට කථා කරමින් දෙවියන්වහන්සේ ඔවුන්ට මෝවබ් දේශයේදී ආශිර්වාද කරමින්, පුරුෂයන් ලබාදී, යහපත් අනාගතයක් ඔවුන්ට සලසා දෙන ලෙස දෙවි සමිඳුන්ගෙන් අයැද සිටියාය.

මෙම අවස්ථාවේදී, ලේලියන් දෙදෙනාම නායොමිව සිඹගෙන ශබ්දනගා හැඬූ බවත්, ඔවුන් දෙදෙනාම නායොමි සමඟ යුදා දේශය වෙත යන බව ප්‍රකාශ කළ බවත් දේව වචනය පෙන්වාදෙයි. **(රූත් 1:9)**

එබැවින්, නිසැකවම ඕර්පා නායොමිට ප්‍රේම කළ බව අපට නිගමනය කළ හැකිවේ. නායොමිගේ ජීවිත ආදර්ශය හේතුකොටගෙන ඇ තුළ **'ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේ'** කෙරෙහි යම්කිසි විශ්වාසයක්ද ඇතිව තිබුණු බව අපට සිතිය හැක. එබැවින් මෝවබ් දේශයේ රැඳී සිටිනවාද නැතහොත් යුදා දේශය වෙත යනවාද යන තීරණය පහසු එකක් නොවීය.

ඕර්පා ගත්තාවූ තීරණය වූයේ, ඇයගේ දේශයේ එනම් මෝවබ් දේශයේ රැඳී සිටින්ටයි. මෙය ඕර්පා විසින් ගත්තාවූ **'ඉතා ආත්මාර්ථකාමී තීරණයක්'** යයි මම කිසිසේත් නොසිතමි. මම ඇයගේ තීරණය දකින්නේ **'පරාර්ථකාමී නොවූ තීරණයක්'** ලෙසයි.

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, මෙය තේරුම්ගන්න. දෙවියන්වහන්සේ අපව කැඳවා ඇත්තේ යේසුස්වහන්සේගේ අඩිපාරේ යමින්, පරාර්ථකාමී ජීවිත ගතකරමින්, අන් අයගේ ජීවිතවලට ආශිර්වාදයක් වීමටයි. අප මෙසේ නොකරන අතර අප විසින් කරනු ලබන්නේ **'කළ යුතු දේ නොකිරීමේ වරදයි'** මෙය අපගේ විශාල වරදක් ලෙස කිතුනු අප බොහෝවිට සලකන්නේ නොමැති නමුත්, එහි ප්‍රතිඵලය වන්නේ, දෙවියන්වහන්සේ අපට ලබා දීමට බලා සිටින්නාවූ ආශිර්වාද අපගෙන් ගිලිහී යෑමයි.

ඕර්පාගේ ජීවිතයේද අප දකින්නේ **'පරාර්ථකාමීව ක්‍රියාකිරීමට'** ඇ අසමත් වීමෙන්, දෙවියන්වහන්සේගේ අධික ආශිර්වාදවලට ඇතුල්වීමට ඇ අපොහොසත්වීමයි. ඇයගේ නම **රූත් 1න්** පසු, දේව වචනයෙන් අතුරුදහන්වීමයි.

දේව දරුව, ඕර්පාද රූත් මෙන් නායොමි සමඟ යුදා දේශයට හැරී ආවානම්, ඇයගේ ජීවිත කථාව කෙසේ ලියවෙන්ට තිබුණාද? කියා මෙනෙහිකර බලන්න. ඔබගේ ජීවිතයේ අනුන් ගැන සිතා, පරාර්ථකාමීව ක්‍රියාකිරීමට, දෙවියන්වහන්සේ ඔබට ලබාදෙන ප්‍රස්තාවල් යහපත් ලෙස භාවිත කරමින්, **ස්වර්ගයේ වස්තු රැස්කරගන්න (මතෙව් 6:20).**

## (iii) <u>**නායොමිගේ ළඟම නෑයාගේ ක්‍රියා කිරීම - රූත් 4:1-6**</u>

(A) **රූත් 2:1 :- " නායොමිගේ පුරුෂයා වන එලීමෙලෙක්ගේ පෙළපතට අයිතිවූ, මහත් වස්තුකාරයෙක්වූ බෝවස් නම් නෑයෙක් ඈට සිටියේය."**

එලිමෙලෙක් විසින් මෝවබ් දේශය වෙත යෑමට ගනු ලැබුවාවූ තීරණය හේතුකොටගෙන, ඇයගේ පවුලේ උරුමය අතහරින්ට සිදුවන්නාවූ තැනට නායොමි වැටී තිබුණි. නමුත් දෙවියන්වහන්සේ විසින් ඉශ්‍රායෙල් ජාතියට ලබාදුන්නාවූ **'ගෝයෙල්'** යන යහපත් නීතිය කරණකොටගෙන, ඉහත සඳහන් බෝවස් නැමැති එලිමෙලෙක්ගේ නෑයාට නායොමිගේ උරුමය මුදවාගැනීමට අවකාශ තිබුණි.

**රූත් 3** හි අප දුටුවේ, බෝවස් ළඟ නෑයාගේ අයිතිය ඉටුකර, නායොමිගේ උරුමය මුදවා දීමට සූදානම්ව සිටි බවයි. මෙනමුත් එසේ කිරීම උදෙසා, ඔහුට වඩා හිමිකම් තිබුණාවූ, ඔහුට වඩා ළඟ නෑයෙක් නායොමිට සිටීම මෙයට බාධාවක් විය.

**රූත් 3 : 11,12 :- " [11] දැන් මාගේ දියණියෙනි, භය-නොවෙන්න; නුඹ කියන සියල්ල නුඹට ඉෂ්ටකරන්නෙමි ...... [12] ඉතින් මා නුඹට ළඟනෑයෙක් බව සැබෑය. නුමුත් මට වඩා ළඟනෑයෙක් ඇත්තේය."**

**රූත් 4:1-6** දක්වා කියවන අප දකින්නේ, මෙම ළඟ නෑයාගේ ඉතා ආත්මාර්ථකාමී ක්‍රියා මාර්ගයයි.

නායොමිගේ බිම් කොටස නිදහස් කරගැනීමට ඉදිරිපත් වූ බෝවස්, නුවර දොරටුව ළඟ හිඳගෙන, ළඟම නෑයාද නුවර වැඩිමහල්ලන්ගෙන් දස දෙනෙක්ද කැඳවා ගත්තේය.

ඉන්පසු බෝවස් එම ළඟම නෑයාට පැවසුවේ, නායොමි එලිමෙලෙක්ට අයිතිව තිබුණු බිම් කොටස විකුණන බවත්, එය මිලේට ගැනීමට වඩාත්ම අයිතිය තිබුණේ එම ළඟම නෑයාට බැවින්, ඔහුට කැමතිනම් එය ගළවා ගන්න කියාය.

ළඟම නෑයා එසේ කිරීමට කැමැත්ත දක්වූ අතර, බෝවස් ඔහුට පෙන්වාදුන්නේ උරුමය හිමි එලිමෙලෙක්ගේ පුත්‍රයාද මැරුණු බැවින්, එම ඉඩම ගන්නා තැනැත්තාට මැරුණු පුතාගේ භාර්යාවවූ මෝවබීය රූත්ව පාවාගෙන මැරුණාවූ තැනැත්තාගේ නාමය ඉශ්‍රායෙල් කෙරෙන් නොමැකෙන පිණිස ක්‍රියා කළ යුතු බවයි.
**(කරුණාකර මෙය පිළිබඳව ද්විතීය 25:5,6 කියවා බලන්න)**

බෝවස්ගේ වදන් වලට, ළඟම නෑයාගේ ප්‍රතිචාරය දේව වචනයේ මෙසේ සඳහන් කරයි.

**රූත් 4:6 :- "ඒ ළඟනෑයා කථාකොට : මට ඒක ගළවාගන්ට බැරිය ; එසේ කළොත් මාගේ උරුමයට අලාභවෙයි. මට ගළවාගන්ට බැරි නිසා මට තිබෙන මිදීමේ බලය නුඹම භාරගනින්නැයි කීවේය."**

අපට මෙහිදී පෙනීයන්නේ, ළඟම නෑයාගේ ඉතාමත්ම ආත්මාර්ථකාමී වූ ආකල්පයයි.

ඉඩම/දේපල/බිම් කොටස මුදවා ගැනීමට ක්ෂණිකව කැමතිවීමෙන් අප දකින්නේ, ධනය/වස්තුව රැස්කර ගැනීම උදෙසා ඔහු තුළ තිබුණාවූ දැඩි ආසාව සහ උනන්දුවයි.

මෙනමුත් තමාගේ මියගිය ඥාති සහෝදරයාගේ නාමය ඉශ්‍රායෙල් කෙරෙන් නොමැකෙන පිණිස, වැන්දඹුවක් බවට පත්ව සිටි රූත්ව පාවාගෙන, ඈ වදන කුලුඳුලාට මළ සහෝදරයාගේ නාමය දීමට ඔහු සහමුලින්ම අකමැති විය. ඔහු එසේ අකමැති වූයේ, එය හේතුකොටගෙන ඔහුගේ උරුමයට අලාභවේයැයි සිතාය.

මෙනමුත් ඉහත සඳහන් අයිතිවාසිකම්/වගකීම් දෙකම, දෙවියන්වහන්සේගේ නීතියට අයිති වූ ඒවාවේ. ළඟම නෑයා දේව නියෝගයේ **තමාට ලාභ ගෙනදේයැයි සිතූ කොටස පිළිගෙන, තමාට අවාසිදායක කියා ඔහු සිතූ කොටස අතහරින්ට තීරණය කළේය.**

මාගේ ප්‍රේමවන්ත දේව දරුව, අද දවසේ කිතුනුවන්ගෙන් බොහෝ දෙනෙක්, සිතන්නේද ක්‍රියා කරන්නේද මෙලෙසම නොවේද ?

දේව වචනයේ අප කැමති කොටස් තෝරා, ඒවාට කීකරු වීමටද, අන් සමහර කොටස් නොසලකා සිටීමටද ඔබ පෙළඹෙනවා නොවේද ?

**දේව දරුව, මෙය කිසිසේත් නිවැරදි නොවේ !!**

අප සැමදෙන **'මුලු ලියවිල්ල'** අදහමින්, එයට කීකරුවෙමු.

(B) ළඟම නෑයාගේ ඉතා ආත්මාර්ථකාමීකම හේතුකොටගෙන, ඔහුට තිබුණාවූ නෛතික අයිතිය ඔහු ප්‍රතික්ෂේප කළේය.

එම හේතුවෙන්, **'ළඟම නෑයාගේ අයිතිය'** ලැබුවාවූ බෝවස්ට, දොරටුවේ සිටි මුළු සෙනගද වැඩිමහල්ලෝද මෙසේ ආශිර්වාද කළහ.

**රූත් 4:11:- "..... ස්වාමීන්වහන්සේ නුඹේ ගෙට එන මේ ස්ත්‍රිය ඉශ්‍රායෙල් වංශය ගොඩනැගූ රාකෙල්ද ලෙයාද යන ස්ත්‍රීන් දෙදෙනා මෙන් කරනසේක්වා. නුඹ එප්‍රාතාහි සම්පත් උපදවා ගනින්න, බෙත්ලෙහෙමෙහි කීර්තිමත් වෙයන්න."**

අප කිසිවෙක් මෙම ළඟම නෑයාගේ නමවත් නොදනිමු. මහත් ආසිරිවලට උරුමයක් ලබා තිබුණාවූ ඔහුගේ ආත්මාර්ථකාමීකම නිසා, ඔහු ඒ සියල්ල නැතිකරගත්තේය.

**දේව දරුවෙනි, දේව වදනට සම්පූර්ණයෙන්ම කීකරු වී ජීවත්වීමට, අවංකව උත්සාහ කරමු. අන් අයගේ අවශ්‍යතාවයන් තේරුම් ගනිමින්, ඔවුන්ට කරුණාව දක්වමින් පරිත්‍යාගශීලීව ක්‍රියාකරමු.**

## 2. <u>පරාර්ථකාමී ජීවිත බොහෝ තෘප්තිමත් වන්නේය. දෙවියන්වහන්සේගේ ආශිර්වාද අධිකව ලබන්නේය.</u>

### (i) <u>බෝවස්ගේ ජීවිතය - රූත් 2,3,4</u>

බෝවස් ගැන රූත්ගේ පොත ඉගෙනගන්නාවූ අප දකින්නේ ඉතාමත්ම පරාර්ථකාමී, ත්‍යාගශීලී, අලංකාර චරිතයකි. මෙනමුත් ඔහු කාගේ කවුද කියා සොයා බලන අප දකින්නේ, **බෝවස් යනු රාහබ් නමැති විදේශිකයක වූ වේශ්‍යා ස්ත්‍රියකගේ පුත්‍රයා වූ බවයි.**

මේ පුවත අප දකින්නේ, **මතෙව් 1:5** වන පදයෙහිය. එනම් යේසුස්වහන්සේගේ පෙළපත අප කියවන විටයි.

**මතෙව් 1:5,6 :- "[5] <u>සල්මොන්ට දාව රාහබ්ගෙන් බෝවාස් උපන්නේය</u> ; බෝවාස්ට දාව රූත්ගෙන් ඕබෙද් උපන්නේය ; ඕබෙද්ට දාව යෙස්සේ උපන්නේය ; [6] යෙස්සේට දාව දාවිත් රජ උපන්නේය."**

දේව දරුව, මොහොතකට බෝවස්ගේ බාල සහ තරුණ කාලය ගැන සිතා බලන්න. නිසැකවම ඔහුගේ මව නිසා කුඩා කල සිටම ඔහු අන් අයගේ නින්දා සහ අපහාස වලට ලක්වන්ට ඇත. ඔහු බොහෝවිට කොන්වෙන්ට ඇත. අවලක්ෂණ සරදම් සහ විහිළු වලට ඉලක්කයක් වෙන්ට ඇත. සමහරවිට ඔහු වයස්ගත වනතෙක්ම අවිවාහකව සිටියේ, ඔහුට විවාහවීමට සුදුසු වයසේ කාන්තාවක් ඔහු ප්‍රතික්ෂේප කිරීම නිසා විය හැක. **මේවා කෙසේ වුවත්, බෝවස් දෙවියන්වහන්සේට විශ්වාසවන්තව කීකරුව ජීවත් වූයේය.** ඔහු දෙවියන්වහන්සේට කීකරුව ජීවත්වෙමින්, ඔහුගේ ජීවිතය දේව වචනය මත ගොඩනගන්නට ඇත.

(දෙවියන්වහන්සේ මෙන්, **පියා නැත්තන්ටද, අසරණයන්ටද, විදේශිකයන්ටද, වැන්දඹුවන්ටද** පිහිටවීමට ඔහු සැමවිටම සැදී පැහැදී සිටිය බව, **රූත් 2,3, 4** තුළ අප දක්නෙමු)

දේව දරුව, ඉහත සඳහන් අයුරින්, **'දෙවියන්වහන්සේගේ හදවත'** අනුව බෝවස් ක්‍රියා කළ අතර, දෙවි සමිඳුන් අපව කැඳවන්නේ, **'යේසුස්වහන්සේගේ සිත අප තුළත් ඇතිකරගැනීමටය' (පිලිප්පි 2:5)**

**අප එසේ කරමින්, උණුවන හදවතකින් අන් අය දෙස බලමින් ඔවුන් සලකන, සනසන අතර දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ආශිර්වාද අප මත වගුරුවනසේක.**

❖ යේසුස්වහන්සේගේ නාමය නිසා, මනුෂ්‍යයන් අපට නින්දා අපහාස කරන අතර, අප ඔවුන්ට සමාවෙමින්, ඔවුන් ගැන යාච්ඤා කරමු. දෙවියන්වහන්සේ කෙරෙහි මුලු විශ්වාසය තබමින් අපගේ හදවත් අපගේ පියාණන්වහන්සේට විවර කරමු.

නිසැකවම උන්වහන්සේ අපට පිළිතුරු දෙමින් උන්වහන් - සේගේ මහත් ප්‍රේමයෙන් අපව සනසනවා ඇත.

(ii) <u>**රූත්ගේ ජීවිතය**</u>

රූත් යනු දෙවියන්වහන්සේව දැන නොසිටියාවූ (රූප වඳින්නාවූ) මෝවබ් ජාතික කාන්තාවකි. ඈ තරුණ වයසේදී විවාහ වී, තරුණ ස්වාමිපුරුෂයෙක් සමඟ ජීවත් වූ නමුත්, ඇයට දරුවන් නොලැබීමෙන්, සමහරවිට ඈ වඳ වූ ස්ත්‍රියක් වූ බව අපට සිතන්ට පුළුවන.

මෙනමුත් ඈ, නායොමි තුළින් ඉශ්‍රායෙල්ගේ දෙවියන් - වහන්සේ ගැන අසා, නායොමිගේ ජීවිත ආදර්ශය මඟින් දේව දරුවෙකුගේ ජීවිතයක් නිරීක්ෂණය කර, ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේට ඇයගේ ජීවිතය කැපකළාය.

**රූත් 1:16,17 :- "[16] රූත් කියන්නී : .... නුඹේ සෙනඟ මාගේ සෙනඟ වන්නේය, නුඹේ දෙවියන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේ වනසේක. [17].... මරණය මිස වෙන කිසිවක් නුඹත් මාත් වෙන්කළොත්, ස්වාමීන්වහන්සේ එසේද ඊට වැඩියෙන්ද මට කරනසේක්වයි කීවාය."**

අප මෙහි දකින්නේ විදේශීය වැන්දඹුවක්, දෙවියන් - වහන්සේගේ ප්‍රේමය නායොමිගේ ජීවිතයේ අත්දැක නායොමිටද ඇයගේ ජාතියටද ඇයගේ දෙවියන්ටද කරන්නාවූ කැපවීමේ පොරොන්දුවයි.

වැන්දඹුවන්ටද සලකන්නාවූ ඉශ්‍රායෙල්ගේ දෙවියන් - වහන්සේ, ඇයටද වැන්දඹුවක්ව සිටියාවූ නායොමි යන ඇයගේ නැන්දම්මාටද සපයන්ට යන බව ඈ විශ්වාස කළාය.

ඇයගේ නැන්දම්මාට ප්‍රේමකළ ඈ, ක්‍රියා කළේ තමාට වඩා නැන්දම්මා ගැන සිතලායි - පරාර්ථකාමීවයි.

**දේව දරුව, ඕනෑම මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේට මුලු හදින් කැපවී, පරාර්ථකාමීව ක්‍රියාකරන විට, උන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කරනසේක.**

**රූත් 4:13 :- " ඈ (රූත්) ඔහුගේ භාර්යාව වූවාය. ඔහු ඈ වෙතට පැමිණි කල <u>ස්වාමීන්වහන්සේ ඈට ගර්භෝත් - පත්තිය දුන්සේක, ඈ පුත්‍රයෙකු වැදුවාය</u>."**

දේව දරුව, මෙය තේරුම්ගන්න. රූත්ට දෙවියන් - වහන්සේ දුන්නාවූ ඔබෙද් යන මේ පුත්‍රයා, ඉශ්‍රායෙල් ජාතියේ වඩාත්ම ශ්‍රේෂ්ඨතම රජතුමා වූ දාවිත් රජතුමාගේ සීයා විය (**රූත් 4:21**).

එපමණක් නොව, අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් - වහන්සේගේ පෙළපතේ සඳහන් වන්නේ ස්ත්‍රීන්ගේ නම් හතරක් පමණි. මේවායින් අන්තිමට සඳහන් වන්නාවූ නම, උන්වහන්සේගේ මව වූ මරියා වන අතර, තෙවැනි නම වන්නේ රූත් යන නමයි.

**දේව දරුවෙනි, දෙවියන්වහන්සේට කැපවී සිටින ඔබ සැම, අදම පරාර්ථකාමීව ජීවත්වීමට කැපවෙන්න.**

(iii) **<u>නායොමිගේ ජීවිතය</u>**

නායෝමිගේ ජීවිතය අධ්‍යයනය කරන්නාවූ අපට පෙනෙන්නේ ඉතා යටහත් වූ පරිත්‍යාගශීලී වූ චරිතයකි. මෝවබ් දේශයේ ඈ තම පුතුන් දෙදෙනාද අහිමිවූ වැන්දඹුවක් බවට පත්වූයේ ඈ ගත්තාවූ වැරදි තීරණයක් නිසා නොවේ. ඇයගේ ස්වාමිපුරුෂයා ගත්තාවූ වැරදි තීරණයක් නිසයි. මෙනමුත් මේ මුලු පොත පුරාම අප දකින්නේ, අන් අය දෙස ඇඟිලි දිගු නොකරන්නාවූ, දෙවියන්වහන්සේගේ විනිශ්චයන් ඉදිරියේ යටහත්කමින් වැටෙන්නාවූ චරිතයකි.

එලිමෙලෙක්ගේ අකීකරුකමේ වරද භාරගත් ඇය, පසුතැවිල්ලෙන් දෙවියන්වහන්සේ වෙත ළංවූවාය.

නායොමිගේ චරිතය තව දුරටත් මෙනෙහිකරන අපට පෙනීයන්නේ, දෙවියන්වහන්සේ දුන්නාවූ ගෝයෙල් නීතිය යටතේ පිහිට ලැබීමට රූත්ට වඩා අයිතියක් නායෝමිට තිබුණු බවයි. නමුත් ඇය එම අයිතිය තම ලේලියට ඉතා ආසාවෙන් පරිත්‍යාග කරනවා අප දකිමු. ඇයගේ පරිත්‍යාගයේ අති වාසනාවන්ත ප්‍රතිඵලය **රූත් 4:15** හි සඳහන් වේ.

**රූත් 4:15 :- "…. මක්නිසාද <u>නුඹට ආදරය ඇත්තාවූද පුත්‍රයන් සත්දෙනෙකුට වඩා නුඹට යහපත්වූද නුඹේ යෙහෙළිය ඔහු</u> වැදුවායයි කීවෝය."**

**රූත් 4:17 :- "අසල්වාසි ස්ත්‍රියෝ : <u>නායොමිට පුත්‍රයෙක් උපන්නේය කියා ඕබෙද් යන නම ඔහුට තැබුවෝය</u> ….."**

<u>වැදගත් සටහන්</u>

(a) පුතුන් 7 ක් ලැබීම යනු පවුලක ආශිර්වාදයේ උපරිමය ලෙස සලකනු ලැබුවා. (**1 සාමුවෙල් 2:5, යෝබ් 1:2, 42:13**) රූත් නිසා, නායෝමි ඊටත් වඩා ආශිර්වාදලත් වූ බව ස්ත්‍රීහු පැවසූහ.

(b) ඔබෙද් යන නමේ අර්ථය **'දාසයා'** වන අතර, වඩා පුළුල් අර්ථය **'දෙවියන්වහන්සේගේ දාසයා'** ලෙස සැලකිය හැක.

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, ඔබගේ ජීවිතයේ උපරිම දේව ආශිර්වාද ලැබීමට ආසා කරනවා නම්, නායෝමිගේ ආදර්ශය අනුගමනය කරන්න.

- සැමවිටම දෙවියන්වහන්සේට යටත්වන්න.
- ඔබගේ සහ ඔබගේ පවුලේ වැරදි ගැන පසුතැවිලි වී දෙවියන්වහන්සේගෙන් සමාව ලබාගන්න.
- තමාට වඩා අන් අය උතුම් ලෙස සලකමින් පරාර්ථකාමී ජීවිත ගත කරන්න.

**3. <u>අප තුළ යහපත් දෙයක් ආරම්භ කළාවූ දෙවියන්වහන්සේ කෙලවර දක්වාම එය ගෙනයනසේක</u>**

**පිලිප්පි 1:6 :- "නුඹලා තුළ යහපත් වැඩක් පටන්ගත් උන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දවස දක්වා ඒක සම්පූර්ණකරනසේකැයි යන මේ විශ්වාසය ඇතුව සිටිමි."**

ඉහත සඳහන් දේව වදනේ සත්‍යතාවය ඔබට වැඩි දුරටත් වටහා දීමේ අරමුණින්, රූත්ගේ කථාවෙන් සහ වෙනත් බයිබලයේ කථාවලින් නිදසුන් කිහිපයක් ඔබ ඉදිරියේ තබන්ට කැමැත්තෙමි.

| චරිතය | සිටි තත්ත්වය | අවසානය |
|---|---|---|
| 1. බෝවස් | විදේශීය වේශ්‍යාවකගේ පුතෙක් ලෙස, නින්දා සහ අපහාස ලැබුවාවූ අවිවාහකව සිටියාවූ මනුෂ්‍යයෙක්. | තරුණ, රූමත්, යහපත් බිරිඳක් සහ සුප්‍රසිද්ධ පුතෙකු ගෙන් සමන්විත වූ, පවුලක් තුළ ප්‍රීතිමත් විවාහ ජීවිතයක් ගත කළාවූ,යේසුස්-වහන්සේගේ පෙළපතට අයිති කෙනෙක්. |
| 2. රූත් | මෝවබ් ජාතික (වඳවූ) වැන්දඹුවක්. | දෙවියන්වහන්සේ ඉතා යහපත් ස්වාමි පුරුෂයෙක්ද, පුතෙක්ද ලබා දුන්නාවූ, යේසුස් - වහන්සේගේ පෙළපතේ සඳහන් කාන්තාවක්. |
| 3. නායොමි | පුතුන් දෙදෙනාම අහිමි වූ, විදේශ රටක අසරණ වූ වැන්දඹුවක්. | පුතුන් සත්දෙනෙකුට වඩා යහපත් ලේලියක්ද, සුප්‍රසිද්ධ මුණුබුරෙක් ලැබුවාවූ ඉතා ආශිර්වාද ලත් ස්ත්‍රියක්. |
| 4. යෝබ් (යෝබ් 42:10-17) | තමාගේ සියළුම දේපල සහ මුලු පවුල නැති වූ මනුෂ්‍යයෙක්. | තමාට නැතිව ගියාවූ සියළුම දේ, දෙවියන්වහන්සේ විසින් දෙගුණකොට ලබා දෙන ලද වාසනාවන්ත මනුෂ්‍යයෙක්. |

| | | |
|---|---|---|
| 5. යෝසෙප් (උත්. 50:17-20) | තමාගේ වැඩිමහල් සොහොයුරන් විසින් ද්වේශ කරන ලද, වහල් කමට විකුණන ලද මිනිසෙක්. | මිසර දේශයේ පාරාවෝට පමණක් දෙවැනි වූ අති බලවත් මනුෂ්‍යයෙක්. |
| 6. හන්නා (1 සාමු 1:27,28 2:20,21) | ලජ්ජාවට පත්ව සිටියාවූ වඳ ස්ත්‍රියක්. | ඉශ්‍රායෙල් ජාතියේ ප්‍රථම ප්‍රොපේතවරයාවූ සාමුවෙල්ගේ මව. |

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, ඔබව උන්වහන්සේගේ දරුවෙක් බවට කැඳවාගත්තාවූ තැනන්වහන්සේ, ඔබගේ ජීවිතයේ ආරම්භ කළ දේ නිසැකවම සම්පූර්ණ කරන සේක.

**උන්වහන්සේගේ අත අල්ලාගෙන, උන්වහන්සේට කීකරුව, යටහත්කමින් සහ පරිත්‍යාගශීලීව, ඔබගේ ජීවිත ගමනේ අවසානය දක්වාම ගමන් කරමින්, උන්වහන්සේ ඔබ උදෙසා සූදානම් කර ඇති ආශිර්වාදලත් අවසානයට ඇතුල්වෙන්න.**

**එසේ කිරීමට දෙවි ස්වාමීන්වහන්සේ**

**ඔබට පිහිටවනසේක්වා !!!**

# සටහන්

# සටහන්